# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,472 — 1965 අගෝස්තු 6 වැනි සිකුරාද — 1965.8.6

(ආණ්ඩුවේ බලීයෙ පිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (II) වැනි ජේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු | 993 | තොටුපල් ටෙන්ඩර් හා වෙනත් ටෙන්ඩර් මිකිණීම | 1033 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය | 1005 | ආණ්ඩුවේ නොවන දැන්වීම් | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් | 1006 | රට මිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් | — |
| මඩුකාගිරුදිය විකිණීම | — | විවිධ දැන්වීම් | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස්පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩදෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවයෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

---

## විශේෂ නිවේදනයයි

1965 අගෝස්තු 11 වැනි බදාදා ආණ්ඩුවේ නිවාඩු දිනයක් වන බැවින්, 1965 අගෝස්තු 13 වැනි දින නිකුත් කරනු ලබන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කිරීම සඳහා එවන සියලුම දැන්වීම් සහ නිවේදන, 1965 අගෝස්තු 7 වැනි සෙනසුරාදා දහවල් 12 ට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයට ලැබෙන්නට සැලැස්විය යුතු බව කාගේත් දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1965 අගෝස්තු 3 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

---

(ඇ) **සෞඛ්‍ය තත්ත්වය :** උස අඩි 5යි, අගල් 4යි (මෙහෙයවීම්කරු භූමි සඳහා අවශ්‍ය උස අඩි 5යි අගල් 6යි); පපුව (හුස්ම පහළට හෙලා සිටින විට) අගල් 32යි සහ බර රාත්තල් 105යි.

**3. සේවා කොන්දේසි :**

(අ) සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි—

(i) අයදුම්කරුවන් අවසන් වශයෙන් තෝරාගත් විට, නිත්‍ය ගුවන් හමුදාවේ සේවයට බඳවා ගනු ලැබේ. සේවයට බඳවා ගනු ලැබුවායින් පසුව, ඔවුහු ගුවන් හමුදාවේ අවුරුදු දොළහ (12) ක් සේවය කළ යුතුයි. එයින්, අවුරුදු පහ (5) ක් නිත්‍ය ගුවන් හමුදවේ සේවය කළ යුතු අතර අවුරුදු හත (7) ක් නිත්‍ය උප සේවයේ සේවය කළ යුතුයි. ඉතාමත් දුෂ්කරතාවයන් මධ්‍යයෙහි රටේ ඕනෑම පළාතක දිවා රෑ දෙකෙහි සේවය කිරීමට ලැස්ති, වෙහෙසී වැඩ කළ හැකි නිරෝගී සම්පන්න තරුණයන්ට හොඳ මතු බලාපොරොත්තු ඇති කර ගත හැක. විටින් විට සංශෝධනය කර ඇති, 1962 සැප්තැම්බර් මස 14 වෙනි දිනැති අංක 13,301 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද ගුවන් හමුදා විශ්‍රාම හා පාරිතෝෂික දීමනා සංග්‍රහය යටතේ, විශ්‍රාම වැටුපක් හිමිවීමට සුදුසුකම් ලබා ගැනීම සඳහා, සුදුසු ගුවන් භටයින්ට තවදුරටත් සේවය කිරීමට අවසර සලසා දෙනු වස්, නැවත සේවයට පත්කරගැනීමට අවකාශ ඇත.

(ආ) ගුවන් භටයින් ගුවන් හමුදා පනතට (ලංකා ව්‍යවස්ථාදායක නියෝගවල 358 වෙනි ඡේදය), ගුවන් හමුදා රෙගුලාසිවලට සහ නියෝගවලට යටත්ව කටයුතු කළ යුතුයි.

(ඇ) **රාජ්‍ය භාෂාව පිළිබඳ අවශ්‍යතාවයන් :** ලංකාණ්ඩුවේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අනුකූලව ක්‍රියා කළ යුතු බව, තෝරා ගනු ලබන අපේක්ෂකයින් විසින් මතක තබා ගත යුතුයි.

(ඈ) **වැටුප් සහ දීමනා ගෙවන ප්‍රමාණය :** විටින් විට සංශෝධනය කර ඇති, 1961 අප්‍රේල් මස 28 වෙනි දිනැති අංක 12,305 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද, 1961 ගුවන් හමුදා වැටුප් සංග්‍රහය අනුව, වැටුප් සහ දීමනා ගෙවනු ලැබේ.

**4. අනිකුත් අවශ්‍යතාවයන් :**

(අ) මෙම නිවේදනයේ අන්තිමට පෙන්වා ඇති උපලේඛනයේ ආකෘති පත්‍රය අනුව අයදුම් පත් පිළියෙල කර එවිය යුතුයි. **අයදුම් පත් එවීම සඳහා මුද්‍රණය කරන ලද පිටපත් නොමැත. අයදුම්කරුවන් විසින්ම තම අයදුම් පත් සකස්කර ගත යුතුයි.**

(ආ) රාජකීය ලංකා ගුවන් හමුදාවේ මූලස්ථානයට ලැබෙන සේ, **1965 අගෝස්තු මස 31 වෙනි අඟහරුවාදා හෝ ඊට පෙර, ලියා පදිංචි කරන ලද තැපැලෙන් අයදුම් පත් එවිය යුතුයි.** අයදුම් පතේ උඩ කෙළවරේ සහ අයදුම් පත බහාලන කවරයේ වම් කෙළවරේ උඩ **" අයදුම්පත—ගුවන් භටයින් "** යනුවෙන් සඳහන්කර එවිය යුතුයි. තවද, අයදුම් පතේ සියලුම කොටු හැකිතරම් විස්තර ඇතිව ඉතා පැහැදිලි ලෙස සම්පූර්ණකර තිබිය යුතුයි.

(ඇ) අයදුම් පත් මේ ලිපිනයට එවිය යුතුයි :—

ගුවන් හමුදාපතිතුමා,
තැ. පෙ. 594,
කොළඹ 2.

(ඈ) අයදුම්කරු දැනට සේවය කරන ස්ථානයේ ස්වාමියාගෙන් ලබා ගත් නිර්දේශයක් ද අයදුම් පත සමග අමුණා එවිය යුතුය. අනිකුත් අයදුම්කරුවන්, අන්තිමට ඉගෙන ගත් පාසැලේ ප්‍රධානාචාර්ය තුමාගෙන් ලබාගත් චරිත සහතික පතක් සහ අයදුම්කරු පසු ගිය අවුරුද්ද තුළ පුද්ගලිකව හඳුනන වග කියයුතු පුද්ගලයෙකුගෙන් ලබාගත් චරිත සහතික පතක්ද ඇතුළුව සහතික පත් දෙකක් අයදුම් පත සමඟ අමුණා එවිය යුතුයි.

(ඉ) අයදුම්කරුවන් විසින් ඔවුන්ගේ අයදුම්පත්වල පහත සඳහන් ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොව) අමුණා එවිය යුතුයි :—

(i) උප්පැන්න සහතික පත්‍රය (බෞතීස්ම සහතික පත්‍ර හෝ අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහය යටතේ නිකුත් කරන ලද සහතික පත්‍ර භාරගනු නොලැබේ);

(ii) ලබාගෙන ඇති උසස්ම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික පත්‍ර, සහ

(iii) ඉහත සඳහන් 4 (ඈ) ඡේදයේ දැක්වෙන චරිත සහතික පත්‍ර.

**සැළකිය යුතුයි.**—මෙම සහතික පත්‍රවල සහ චරිත සහතික පත්‍රවල මුල් පිටපත්, අයදුම්කරු සම්මුඛ පරීක්ෂණයකට කැඳවූ විට **ඉදිරිපත් කළ යුතුයි.**

(ඊ) අයදුම් පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

(උ) අයදුම්පත ලැබීමෙන් පසුව, යම්කිසි අයදුම්කරුවෙක් ඔහු විසින් ඉල්ලුම් කර ඇති තනතුරට පත් කිරීම සඳහා සුදුසු යයි සලකනු ලැබුවහොත්, ඔහුට ඔහුගේ වියදමින් නියමිත දිනයක සහ වේලාවක දන්වනු ලබන ස්ථානයකට පැමිණ ගුවන් හමුදාවේ ආධුනික ගුවන් භටයින් බඳවා ගන්නා නිලධාරීන් ඉදිරිපිට පෙනී සිටීමට උපදෙස් දෙනවා ඇත. **පිළිගත් හඳුනා ගැනීමේ පත්‍රයක් හෝ හඳුනා ගැනීම සඳහා වෙනත් සතුටුදායක සාක්ෂි ඔහු විසින් ඉදිරිපත් කළ යුතුවේ.** එනම් : වගකියයුතු පුද්ගලයෙකු විසින් නිසි පරිදි සහතික කරන ලද, අයදුම්කරුගේ ඉතා ළඟකදී ගත් ඡායාරූපයක්.

(ඌ) අවසාන සම්මුඛ පරීක්ෂණයෙන් පසුව, සුදුසු යයි හැඟියන අයදුම්කරුවන් වෛද්‍ය මණ්ඩලයක් විසින් පරීක්ෂා කරනු ලැබේ.

(එ) අවසාන සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබූ අපේක්ෂකයෙකුට පමණක්, ඔහුගේ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල දන්වා යවනු ඇත.

(ඒ) සමර්ථවී තෝරාපත්වූ අපේක්ෂකයින්, නිත්‍ය ගුවන් හමුදාවේ 2 වෙනි පෙළ (ආධුනික) ගුවන් භටයෙකු ලෙස බඳවා ගනු ලැබේ.

(ඔ) යම්කිසි අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමක හෝ අයථා අනුග්‍රහයක් ලබාගැනීමට හෝ බල පෑමකට උත්සාහ කරනු ලැබුවහොත්, **ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.**

ඊ. ආර්. අමරසේකර,
එයාර් කොමදෝරු,
ගුවන් හමුදාධිපති.

1965 ජූලි මස 29 වෙනිදා,
රාජකීය ලංකා ගුවන් හමුදාව,
තැ. පෙ. 594,
කොළඹ 2.

## උපලේඛනය

### අයදුම් පත

1. (අ) අගට යෙදෙන නම (පෙළපත් නාමය) සම්පූර්ණයෙන් : ————.
(පැහැදිලි අකුරින්)
(ආ) සෙසු නම් (සම්පූර්ණයෙන්) :————.
(පැහැදිලි අකුරින්)
(ඇ) ලියුම් ලැබෙන පිළිවෙල (සම්පූර්ණයෙන්) :————.
(පැහැදිලි අකුරින්)

2. පදිංචි ස්ථානයට ආසන්නම විදුලි පණිවුඩ කාර්යාලය :————.

3. පදිංචි ස්ථානයට ආසන්නම පොලිස් ස්ථානය :————.

4. පදිංචි ස්ථානයට ආසන්නම දුම්රිය ස්ථානය :————.

5. උපන් දිනය :————.
(පැහැදිලිව)

6. (අ) උස :————.
(ආ) පපුව :————.
(ඇ) බර :————.

7. උපන් ස්ථානය—
(අ) ගම :————.
(ආ) ග්‍රාම සේවක කොට්ඨාශය :————.
(ඇ) නගරය තුළ හෝ ඊට ආසන්නම :————.
(ඈ) පළාත :————.

8. ජාතිය :————.

9. උත්පත්තියෙන් පියාගේ නම සහ ජාතිය (ලියා පදිංචිවීමෙන් පුරවැසිකම ලබා ඇත්නම්, එම සහතිකයේ අංකය සහ දිනය සඳහන් කළ යුතුය.) :————.

10. තමා පාසැල හෝ විද්‍යාලය හැරයෑමෙන් පසුව නියුක්තව සිටි රැකියාව :————.

11. සමර්ථවී ඇති විභාග, විෂයයන් සහ දිනයන්ද ඇතුළුව : ————.

12. වෘත්තීය තේරීම් : (1) වෙනි තේරීම :————, (2) වෙනි තේරීම :————.

13. මීට පෙර සන්නද්ධ හමුදාවක හෝ සෙවණ සේවයක යෙදී ඇත්නම්, එහි සියළුම විස්තර කෙටියෙන් හා දරන ලද තනතුරු සහ දිනයන්ද ඇතුළුව :————.

14. සිවිල් අධිකරණයක/යුද්ධාධිකරණයක වැරදිකරුවී හෝ ඇඟ බැඳ තිබේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

15. වෙනත් අදාල කරුණු :————.

16. ක්‍රීඩා පිළිබඳ ලබාගෙන ඇති තත්ත්වය සම්පූර්ණ විස්තර සහිතව :————.

17. ඉදිරිපත් කර ඇති චරිත සහතික පත්‍ර ලබාගෙන තිබෙන අයගේ නම් සහ තනතුරු :————.

18. අයදුම්කරු විසින් අත්සන් තැබිය යුතු ප්‍රකාශය :

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සඳහන් කොට තිබෙන සියලු විස්තර සත්‍ය වූ ද නිවැරදි වූ ද කරුණු බව මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ ඔප්පුවුව හොත්, තෝරා බඳවා ගැනීමට පෙර වරද අනාවරණය වී නම් නුසුදුස්සකු වීමට ද බඳවා ගැනීමෙන් පසුව වරද අනාවරණය වී නම්, ගුවන් හමුදා පනතේ නියම කර ඇති පරිදි දඬුවම්වලට යටත් විය යුතු බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–52—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ ඇබෑර්තු

ගල්ඔය සංවර්ධන මණ්ඩලය යටතේ පහත දැක්වෙන තනතුර සඳහා ලාංකිකයින්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

**කාර්මික සහායක (ගුවන් විදුලි) vii වෙනි ශ්‍රේණිය**

**සුදුසුකම්.**—1. (අ) එච්. එෆ්./ඇස්. ඇස්. බී. හා වී. එච් ඇෆ්/ඇෆ් ඇම්. ට්‍රාන්ස්මීටර්/රිසීවරයන්වල අලුත්වැඩියා කිරීම් පිළිබඳව අඩු ගණනේ අවුරුදු පහක පළපුරුද්දක් හා සුදුසු අධ්‍යාපන සුදුසුකම් හෝ,

(ආ) ඉංග්‍රීසි හා ගණිතය ඇතුලුව අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයේදී විෂයයන් හයක් සමත්ව සිටිය යුතුය. භෞතික විද්‍යාවෙන් සමත් වූ අය වෙත වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. අයදුම්කරුවන් පහත දැක්වෙන විභාගවලින් එකකින් සමත්ව සිටිය යුතුය :—

1. කණිෂ්ඨ කාර්මික නිලධාරි (J. T. O.) විදුලි ඉංජිනේරු විද්‍යාව.

නැතහොත්

2. සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ ගුවන් විදුලි සංදේශ හෝ ඒ හා සමාන සහතික පත්‍රයක්.

ඉහත සඳහන් (අ) හි සඳහන් උපකරණ වගී ගැන විශේෂ පුහුණුවක් ලත් අයදුම්කරුවන් වෙත වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

**වයස.**—1965.7.1 දින වන විට අයදුම්කරුවන්ගේ වයස අවුරුදු 40 ට අඩුවිය යුතුය.

**වැටුප් පරිමාණය.**—වර්ෂයකට රු. 2,040—120—3,480. මීට අමතරව රජයේ ප්‍රමාණයන් අනුව ජීවන වියදම් දීමනා, විශේෂ ජීවන වියදම් දීමනා ගෙවනු ලැබේ.

නිවාස සපයා නැත්නම් අනුමත කරන ලද ප්‍රමාණයන් අනුව ගෙවල් කුලී ගෙවනු ලැබේ.

අවශ්‍ය සුදුසුකම් ඇති මණ්ඩලයීය සේවකයින්ගෙන් ලැබෙන ඉල්ලුම්පත්‍රද වයස් සීමාව ගැන නොතකා සලකා බලනු ඇත.

තෝරාගත් අයදුම්කරු රජයේ රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය අනුව සුදුසුකම් ලබාගත යුතුය.

අම්පාරේ ලේකම් කායසීාලයේ ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිගෙන් හෝ කොළඹ 7, බුලර්ස් පාරේ අංක 415 හි ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ පාලක ලේකම්ගෙන් ඉල්ලුම්පත්‍ර ලබාගත හැකිය.

1965.8.27 දින ඉල්ලුම් පත්‍ර භාරගැනීම අවසාන කරනු ලැබේ.

ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ
සාමාන්‍යාධිකාරී.

1965.7.2 වෙනි දින,
අම්පාරේ මණ්ඩලයීය කායසීාලයේ දීය.

2–211—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## සමාජ සේවා දෙපාර්තමේන්තුව

**වත්තේගම අන්ධයින් පුනරුත්ථාපනය කිරීමේ හා පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ කළමනාකාර තනතුර**

– සමාජ සේවා දෙපාර්තමේන්තුවේ, වත්තේගම, අන්ධයින් පුනරුත්ථාපනය කිරීමේ හා පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ කළමනාකාර තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

2. මෙහි පහත පෙනෙන ආකෘති පත්‍රය අනුව පිළියෙල කරගත යුතු අයදුම් පත් 1965 සැප්තැම්බර් 6 වැනි දින හෝ ඊට පෙර කොළඹ 3; ගාලු මුවදොර, පහළ වැව පාරේ, සමාජ සේවා අධ්‍යක්ෂ වෙත ලැබෙන සේ එවිය යුතුයි.

3. **වැටුප.**—මෙම තනතුරට නියමිත වැටුප් පරිමාණය වර්ෂයකට රු. 2,580—11×120, 5×180—රු. 4,800 වේ. රු. 4,080 වාර්ෂික වැටුප ලැබීමට මත්තෙන් කාර්යක්ෂමතා කඩයිමකි.

4. **සේවා කොන්දේසි.**—මේ තනතුර තාවකාලිකය. විශ්‍රාම වැටුප් රහිතය.

5. **අධ්‍යාපන හා අනෙක් සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම—

(අ) 1965 සැප්තැම්බර් 6 වැනි දිනට වයසින් අවුරුදු 22 ට නොඅඩු බවටත් අවුරුදු 35 ට නොවැඩි බවටත්,

(**සංලක්ෂය.**—දෙපාර්තමේන්තුවේ සේවකයින්ට මෙම වයස් සීමාව බලපාන්නේ නැත.)

(ආ) (1) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ඊට සමාන හෝ උසස් විභාගයකින් සමත්වී ඇති බවට, සහ

(2) ලංකා කාර්මික විද්‍යාලයේ කණිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ අවසාන විභාගය (යාන්ත්‍රික) හෝ ඊට සමාන සහතිකයක්, හෝ

(3) ලංකා කාර්මික විද්‍යාලයේ වෘත්තීය පුහුණු ගුරුවරුන්ගේ අවසාන (යාන්ත්‍රික) සහතිකය සමඟ, කාර්මික සහතිකය ලැබීමෙන් පසු අඩු තරමින් අවුරුදු 5 ක පාඨශාලීය වැඩ පොලක පළපුරුද්ද හෝ දරණ බව ටත්,

(4) යහපත් කල්ක්‍රියාවෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවටත් සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

පහත සඳහන් අතිරේක සුදුසුකම් ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ඇත. පිළිගත් ආයතනයකින් ලත් සමාජ කටයුතු උගෙනුම පිළිබඳ සහතිකයක් හා සමාජ සේවා වැඩ පිළිබඳ විශේෂ සාමාර්ථය සහ/හෝ ප්‍රායෝගික අත්දැකීම තිබීම.

6. අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර වලට පහත සඳහන් සහතික වල පිටපත් (මුල් පිටපත් නොව) අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බවුතීස්ම සහතිකයක්, උපකෘත පාඨශාලා නීති සංග්‍රහය යටතේ වූ කාර්යයන් සඳහා නිකුත් කරන ලද සහතිකයක් මේ සඳහා නො පිළිගැනේ.)

(ආ) 5 වන ඡේදයේ සඳහන් අධ්‍යාපනික, කාර්මික හා අනෙක් සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික පත්‍ර,

(ඇ) අයදුම්කරුගේ චරිතය හා මේ තනතුරට පත්වීමට ඇති යෝග්‍යතාව පිළිබඳ සහතික පත්‍ර 3 ක්.

7. අයදුම් පත් හෝ ඊට අදාල වෙනත් ලිපි ආදිය හෝ එවිය යුත්තේ සමාජ සේවා අධ්‍යක්ෂ වෙත මිස මෙම දෙපාර්තමේන්තුවේ අයත් කිසිම නිලධාරියෙකුට පුද්ගලික වශයෙන් නොවේ.

8. ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන කාණ්ඩයේ ආරම්භයේ පළවී ඇති රාජ්‍ය සේවා තනතුරු වලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි සැලකිල්ල යොමු කරවනු ලැබේ.

ආර්. එල්. තිරුචෙල්වම්,
**සමාජ සේවා අධ්‍යක්ෂ.**

සමාජ සේවා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 577, පහල වැව පාර,
කොළඹ, 1965 ජූලි 28.

### ඉහත කී ආකෘති පත්‍රය

**කළමනාකාර තනතුර සඳහා අයදුම්පත**

1965 සැප්තැම්බර් මස 6 වන දිනට පෙර, කොළඹ 3, ගාලු මුවදොර, පහළ වැව පාරේ සමාජ සේවා අධ්‍යක්ෂ වෙත අයදුම්කරු විසින් පුරවා එවිය යුතු ආකෘති පත්‍රයයි

1. (අ) පෙළපත් නාමය (පැහැදිලි අකුරින්) :————.
(ආ) අනෙක් නම් (පැහැදිලි අකුරින්) :————.

2. ලියුම් ලැබෙන පිළිවෙල :————.

3. 1965 සැප්තැම්බර් 6 වැනි දිනට වයස සහ උපන් දිනය :——.
(නිවේදනයේ 6 වන ඡේදයේ (අ) කොටසේ දක්වෙන පරිදි අවශ්‍ය සහතික පිටපත් ඇමිණිය යුතුයි.)

4. (අ) ජාතිය :————.
(ආ) ඔබ ලාංකිකයෙකු වන්නේ :
(i) පරම්පරාවෙන් ද :————.
(ii) ලියා පදිංචිවීමෙන් ද :————.

5. විවාහක අවිවාහක බව :————.

6. අධ්‍යාපනික සුදුසුකම් :
(අ) (i) සිංහල :————.
(ii) දෙමළ :————.
(iii) ඉංග්‍රීසි :————.
(ආ) කාර්මික සුදුසුකම් :————.
(ඇ) විශේෂ සුදුසුකම් :————.
(නිවේදනයේ 6 වන ඡේදයේ (ආ) කොටසේ දැක්වෙන පරිදි අවශ්‍ය සහතික පිටපත් ඇමිණිය යුතුයි.)

7. මේ භාෂාවන් හොඳ හැටි කථා කිරීමට හා ලිවීමට ඔබට හැකි දැයි දන්වන්න :
(අ) සිංහල :————.
(ආ) දෙමළ :————.

8. පාසැලෙන් අස්වූ පසු යෙදී සිටි රැකීරක්ෂා පිළිබඳ විස්තර දක්වන්න :————.

9. ඔබේ හැකියාවන් හා චරිතය පිළිබඳව අසා දැනගත හැකි ප්‍රසිඬ භවතුන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් දන්වන්න.

10. අමුණන ලද චරිත සහතික පත් දුන් භවතුන්ගේ නම සඳහන් කරන්න :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

2–34—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව (පරිවර්තන අංශය)

### II වෙනි ශ්‍රේණියේ (සිංහල) සහකාර පරිවර්තක තනතුර

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ (පරිවර්තන අංශයේ) II වෙනි ශ්‍රේණියේ සිංහල සහකාර පරිවර්තක තනතුරු එකක් සඳහා ඉල්ලුම් පත්‍ර මෙයින් කැඳවනු ලැබේ. මේ සඳහා එවන ඉල්ලුම් පත්‍ර පහත සඳහන් ආකෘතිය අනුව සම්පූර්ණ කොට 1965 අගෝස්තු 31 වෙනි දින හෝ ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතු ය.

**2. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය.**—අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට සහ තේරීම් මණ්ඩලයක් මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුව තෝරා ගනු ලැබේ.

**3. සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි.**—විශ්‍රාම වැටුප් සහිත වූ ද ස්ථිර වූ ද මේ තනතුරු සඳහා පත් කරනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු කාලයක ආධුනිකත්වයකට යටත් විය යුතුය.

**4. කාර්ය.**—ඉංග්‍රීසියෙන් සකස් කරන ලද නීති ප්‍රඥප්ති, පනත් කෙටුම්පත් ආදිය සිංහල භාෂාවට පරිවර්තනය කිරීම මේ නිලධාරියා වෙත පවරනු ලැබේ.

**5. වැටුප් ක්‍රමය.**—මේ තනතුරට අයත් වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 2,580 න් පටන් ගෙන රු. 120 බැගින් වූ වාර්ෂික වැඩිවීම් එකොළහකින් හා රු. 180 බැගින් වූ වාර්ෂික වැඩිවීම් පහකින් ද පසු රු. 4,800 තෙක් වැඩි වේ. රු. 3,960ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ඇත.

6. 1965 අගෝස්තු 31 වෙනි දිනට තමාගේ වයස අවුරුදු 21 ට නො අඩු සහ අවුරුදු 45 ට වැඩි නො විය යුතු ය. රජයේ සේවයෙහි නියුක්ත වූවන්ට මේ වයස් සීමාව බල නො පානු ඇත.

**7. අධ්‍යාපන හා අනිකුත් සුදුසුකම්.**—අයදුම්කරුවන් :—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර ශක්තියෙන් යුක්ත විය යුතු ය ;

(ආ) (i) විෂයයක් වශයෙන් සිංහල ද ඇතුළත් පිළිගත් විශ්ව විද්‍යාල උපාධිධාරීන් විය යුතු ය. (සිංහල පිළිබඳ ගෞරව උපාධියක් ලබාගත් අය ගැන සහ/හෝ ඉංග්‍රීසියෙන් සිංහලට පරිවර්තනය කිරීමේ පළපුරුද්දක් ඇති අය ගැන විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.) ; නැතහොත්,

(ii) ඉංග්‍රීසි පිළිබඳ මනා දැනුමක් ඇති සිංහල භාෂා පරිවර්තකයන් වශයෙන් 5 අවුරුද්දක පළපුරුදුකම් ඇත්තාවූ හෝ තමා යටත් පිරිසෙයින් උපාධිධරයන්ට සමාන ප්‍රවීණතාවක් ඇති උගතකු බව තේරීම් සභාවට ඒත්තු යන සේ කරුණු ඉදිරිපත් කළ හැකි ලේඛකයන් නොහොත් ග්‍රන්ථ කර්තෘවරයන් විය යුතු ය.

8. පහත සඳහන් ලේඛනවලින් කිසිවක් හෝ ඒ සියල්ල ම ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ඇත :—

(අ) උප්පැන්න සහතිකය (සැ. යු.—බව්තිස්ම සහතික හෝ ආධාර ලබන පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්ය සඳහා නිකුත් කරනු ලැබූ උප්පැන්න සහතික භාර ගනු නො ලැබේ.)

(ආ) උපාධි සහතික හෝ උසස් ම අධ්‍යාපන සහතිකය.

(ඇ) චරිත සහතික දෙකක් (රජයේ සේවයෙහි යෙදී සිටින අයදුම්කරුවන් විසින් මේ සහතික පත්‍ර එවිය යුතු නොවේ.)

(ඈ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික ; හා

(ඉ) සිංහල විෂයයෙන් සමර්ථ වූ උසස් ම විභාගය පිළිබඳ සහතිකය.

9. රජයේ සේවයෙහි නියුක්ත අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. ස්ථිර-පත්වීම් ලත් නිලධාරීන් ඉල්ලුම් පත්‍ර එවන විට, මේ පත්වීම් සඳහා ඔවුන් තෝරාගනු ලැබුවහොත් ඔවුන් දරන තනතුරු වලින් ඔවුන් නිදහස් කළ හැකි බව දැක්වෙන පිටපත් සහිත ඉල්ලුම් පත්‍ර පමණක් සලකා බලනු ලැබේ. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන රජයේ සේවයෙහි නියුක්ත අයදුම්කරුවන් ගේ ඉල්ලුම්පත්‍ර ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත නියමිත දිනයෙහි හෝ ඊට පෙර ලැබුණු බවත් ප්‍රමාද වීම ගැන පිළිගත හැකි කරුණු ඇති බවත් දන්වා පිළිගත යුතු යයි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් නිර්දේශ නොකරතහොත්, සලකා බලනු නො ලැබේ.

10. ඉල්ලුම් පත්‍ර හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක් ම මේ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නො ව, නීති කෙටුම්පත් සම්පාදක, තැ. පෙ. 554, අළුත්කඩේ, කොළඹ 12 යනුවෙන් එවිය යුතු ය.

11. මේ ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වෙනි ඡේදයේ ආරම්භයෙහි පළකර තිබෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්කිරීම් පිළිබඳ පොදු කොන්දේසි කෙරෙහි අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ව්‍යවස්ථාවලට, මුදල් රෙගුලාසිවලට, කාර්ය විධාන සංග්‍රහයේ රෙගුලාසිවලට දෙපාර්තමේන්තු නියෝගවලට සහ රජය විසින් කලින් කල නිකුත් කැරෙන වෙන යම් රෙගුලාසි හෝ නියෝගවලට ද යටත් විය යුතුය.

13. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට දින 7ක් ඇතුළත එවැනි දැන්වීමක් යම් අයදුම්කරුවකුට නො ලැබුණහොත්, ඔහු විසින් ඒ බව වැඩ බලන නීති කෙටුම්පත් සම්පාදක වෙත වහාම දන්වා එවිය යුතු ය. මේ නියමය අනු ව ක්‍රියා කිරීම පැහැර හරින අයදුම්කරුවකු වෙතොත්, තම ඉල්ලුම්පත්‍රය සලකා බලන ලෙස ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමිවනු ඇත.

පර්සි ද සිල්වා,
නීති කෙටුම්පත් සම්පාදක.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 554, අළුත්කඩේ,
කොළඹ 12,
1965 අගෝස්තු මස 2 දින දී ය.

### ඉල්ලුම් පත්‍ර ආකෘතිය

**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සහකාර භාෂා පරිවර්තක තනතුර (සිංහල), II වෙනි ශ්‍රේණිය**

1. සම්පූර්ණ නම :————.
(අ) පෙළපත් නම (පැහැදිලි අකුරෙන්) :————.
(ආ) ලුවනත් නම් :————.

2. ලිපිනය :————.

3. උපන් දිනය හා 1965 අගෝස්තු 31 වෙනි දිනට වයස :————.

4. ජාතිය හා ජාතිකත්වය ලැබූ පිළිවෙල :————.

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරුගේ :————.

(ආ) අයදුම්කරුගේ පියාගේ :————.

(ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :————.

6. අයදුම්කරු විවාහක ද අවිවාහක ද හෝ වැන්දඹු භාවය :——.

7. ඉගෙනීම ලත් පාසැල් හා විද්‍යාල (පොදු අධ්‍යාපනය සඳහා ඒවාට ඇතුළත් වූ හා අස් වූ දිනයන් සමග) :————.

8. අධ්‍යාපන සුදුසුකම් :————.

(ලබා ඇති උපාධි සහ ඒවායේ පංති හා ඉදිරිපත් වුණු විෂය යන් සඳහන් කළ යුතු ය.)

9. සිංහල භාෂාවෙන් ලැබූ උසස්ම සුදුසුකම් :————.

10. පරිවර්තන සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ දැනීම ද කෘත හස්ත භාවය ද පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

11. පාසැලෙන් හෝ විද්‍යාලයෙන් අස් වූ පසු කළ රක්ෂා පිළිබඳ විස්තර සහ ඒවාට පත් වූ හා ඉන් අස් වූ දින :————.

**12. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම්, පුහුණුවීම හෝ පළපුරුද්ද :** ————.

13. අයදුම්කරු සම්බන්ධයෙන් වගකිව හැකි, ඥාතීන් නොවන, දෙදෙනෙකුගේ නම් හා තරාතිරම්. මේ අය පෞද්ගලික ජීවිත යෙහි අයදුම්කරු හොඳින් දන්නා අය විය යුතුය. (රාජ්‍ය සේවයෙහි නියුක්ත අයදුම්කරුවන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය.) :————.

14. වෙනත කරුණු :————.

මේ ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සඳහන් කොට තිබෙන සියලු විස්තර සත්‍ය වූ ද නිවැරදි වූ ද කරුණු බව මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ ඔප්පු වුව හොත්, තෝරා ගැනීමට පෙර වරද අනාවරණය වී නම් නුසුදුස්සකු වීමට ද, තෝරා ගැනීමෙන් පසු වරද අනාවරණය වී නම් කිසි වන්දි ගෙවීමක් නොමැතිවම සේවයෙන් පහ කරනු ලැබීමට ද, මා යටත් වන බව මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8-259/1—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
## (පරිවර්තන අංශය)

### II වැනි ශ්‍රේණියේ (දෙමළ) සහකාර පරිවර්තක තනතුර

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ (පරිවර්තන අංශයේ) II වෙනි ශ්‍රේණියේ දෙමළ සහකාර පරිවර්තක තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍ර මෙයින් කැඳවනු ලැබේ. මේ සඳහා එවන ඉල්ලුම් පත්‍ර පහත සඳහන් ආකෘතිය අනුව සම්පූර්ණ කොට 1965 අගෝස්තු 31 වෙනි දින හෝ, ඊට පෙර මා වෙත ලැබෙන සේ එවිය යුතු ය.

2. **සේවයට බඳවා ගැනීමේ ක්‍රමය.**—අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට සහ තේරීම් මණ්ඩලයක් මගින් පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසුව තෝරා ගනු ලැබේ.

3. **සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි.**—විශ්‍රාම වැටුප් සහිත වූ ද ස්ථිර වූද මේ තනතුර සඳහා පත් කරනු ලබන අයදුම්කරු තුන් අවුරුදු කාලයක ආධුනිකත්වයකට යටත් විය යුතු ය.

4. **කාර්‍ය්‍ය.**—ඉංග්‍රීසියෙන් සකස් කරන ලද නීති ප්‍රඥප්ති, පනත් කෙටුම්පත් ආදිය දෙමළ භාෂාවට පරිවර්තනය කිරීම මේ නිලධාරියා වෙත පවරනු ලැබේ.

5. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරට අදාළ වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 2,580 න් පටන් ගෙන රු. 120 බැගින් වූ වාර්ෂික වැඩිවීම් එකොළහකින් හා රු. 180 බැගින් වූ වාර්ෂික වැඩිවීම් පහකින් ද පසු රු, 4,800 තෙක් වැඩි වේ. රු. 3,960 ට පෙර කාර්‍ය්‍යක්ෂමතා කඩ ඉමක් ඇත.

6. **වයස් සීමාව.**—1965 අගෝස්තු 31 වැනි දිනට තමාගේ වයස අවුරුදු 21 ට නො අඩු සහ අවුරුදු 45 ට නො වැඩි විය යුතු ය. රජයේ සේවයේ දැනට නියුක්තව සිටින්නන්ට මෙම වයස සීමාව බල නොපානු ඇත.

7. **අධ්‍යාපන හා අනිකුත් සුදුසුකම් :**—අයදුම්කම්කරුවන්—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා මනා ශරීර ශක්තියෙන් යුක්ත විය යුතු ය ;

(ආ) (i) දෙමළ විෂයයක් වශයෙන් ඇති පිළිගත් විශ්ව විද්‍යාල උපාධිධාරීන් විය යුතු ය. (සටහන : දෙමළ පිළිබඳ විශේෂ උපාධියක් ඇති අයට සහ දෙමළ ඉංග්‍රීසියට පරිවර්තනය කිරීමේ පළපුරුද්දක් ඇති අයට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.) ; නැතහොත්

(ii) ඉංග්‍රීසි පිළිබඳ මනා දැනුමක් ඇති දෙමළ පරිවර්තකයෙකු වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්දක් ඇති විය යුතු ය. අයදුම්කරුවන්ගේ දැනීම උපාධි තත්ත්වයක් විය යුතුය.

8. පහත සඳහන් ලේඛනවලින් කිසිවක් හෝ ඒ සියල්ල ම ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ඇත :—

(අ) උප්පැන්න සහතිකය (සැ.යු.—බව්තීස්ම සහතික හෝ ආධාර ලබන පාඨශාලා පිළිබඳ ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්ය සඳහා නිකුත් කරනු ලැබූ උප්පැන්න සහතික භාර ගනු නො ලැබේ.) ;

(ආ) උපාධි සහතික හෝ උසස්ම අධ්‍යාපන සහතිකය ;

(ඇ) චරිත සහතික දෙකක් (රජයේ සේවයෙහි යෙදී සිටින අයදුම් කරුවන් විසින් මේ සහතික පත්‍ර එවිය යුතු නොවේ.) ;

(ඇ) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික ; හා

(ඉ) දෙමළ විෂයයෙන් සමර්ථ වූ උසස්ම විභාගය පිළිබඳ සහතිකය.

9. රජයේ සේවයෙහි නියුක්ත අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. ස්ථිර පත්වීම් ලත් නිලධාරීන් ඉල්ලුම් පත්‍ර එවන විට, මේ පත්වීම් සඳහා ඔවුන් තෝරාගනු ලැබුවහොත් ඔවුන් දරන තනතුරු වලින් ඔවුන් නිදහස් කළ හැකි බව දැක්වෙන පිටපත් සහිත ඉල්ලුම් පත්‍ර පමණක් සලකා බලනු ලැබේ. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් වෙත නියමිත දින යෙහි හෝ ඊට පෙර ලැබුණු බවත් ප්‍රමාද වීම ගැන පිළිගත හැකි කරුණු ඇති බවත් දන්වා පිළිගත යුතුයයි දෙපාර්ත මේන්තු ප්‍රධානීන් විසින් නිර්දේශ නොකරතහොත්, සලකා බලනු නො ලැබේ.

10. ඉල්ලුම් පත්‍ර හා ඊ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක් ම මේ දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නො ව, නීති කෙටුම්පත් සම්පාදක, තැ. පෙ. 554, අළුත්කඩේ, කොළඹ 12, යනුවෙන් එවිය යුතු ය.

11. **සේවයේ කොන්දේසි.**—රාජ්‍ය භාෂා පනතේ අවශ්‍යතාවන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයෙකු වන්නේ නම්—

(අ) (i) ඔහු/ඇය රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහාද විශේෂයෙන් ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනයේ විධිවිධානයන් ක්‍රියාවට නැගීම පිණිස ද, සම්පාදිතව පවත්නා හෝ මින්මතු සම්පාදනය කෙරෙන හෝ යම් යම් ව්‍යවස්ථාවනට අනුකූලව ක්‍රියා කළ යුතු ය.

(ii) ආධුනික කාලසීමාව ඇතුළත ඔහු/ඇය විසින් සිංහල භාෂාව විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතු ය.

(iii) ආධුනික කාලසීමාව අවසානයේදී තනතුරෙහි ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර, නියමිත කාලසීමාවක් ඇතුළත දී නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීම ද මත රඳා පවතිනු ඇත. නියමිත කාලසීමා තුළ දී මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමට අපොහොසත් වීම, වැටුප් වැඩිවීම් අත්හිටවනු ලැබීමට හේතු වනු ඇති අතර, නියමිත කාලසීමාව ඉක්මවා තවත් සමසක් ඇතුළත දී පරීක්ෂණයකින් සමත් නො වුවහොත් එම "අත්හිටුවීම" නතර කිරීමකට පරිවර්තනය කර, පරීක්ෂණය සමත්වන තෙක් එම නතර කිරීම ක්‍රියාත්මකව තබනු ඇත.

(iv) ආධුනික කාලසීමාව අවසාන වීමට පෙර, සිංහල භාෂා විෂයයෙන් නියමිත තත්ත්වයේ ප්‍රවීණතාවක් ලබා ගෙන නො තිබුනහොත්, අංක 120 හා 121 දරන පාලන රෙගුලාසිවල විධිවිධාන බලපවත්වනු ඇත. "(ඉහත දැක්වෙන අංක (ii), (iii) හා (iv) දරන කොන්දේසි දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් බඳවා ගනු ලබන්නන්ට අදාළ වෙයි.)"

(ආ) මේ ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වෙනි ඡේදයේ ආරම්භයෙහි පළ කර තිබෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරණ පත් කිරීම් පිළිබඳ පොදු කොන්දේසි කෙරෙහි අයදුම් කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ව්‍යවස්ථාවලට මුදල් රෙගුලාසි වලට කාර්‍ය විධාන සංග්‍රහයේ රෙගුලාසිවලට, දෙපාර්තමේන්තු නියෝගවලට සහ රජය විසින් කලින් කල නිකුත් කැරෙන වෙන යම් රෙගුලාසි හෝ නියෝගවලට ද යටත් විය යුතු ය.

13. ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු ඇත. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට දින 7 ක් ඇතුළත එවැනි දැන්වීමක් යම් අයදුම්කරුවකුට නො ලැබුණහොත්, ඔහු විසින් ඒ බව නීති කෙටුම්පත් සම්පාදක වෙත වහාම දන්වා එවිය යුතු ය. මේ නියමය අනු ව ක්‍රියා කිරීම පැහැර හරින අයදුම්කරුවකු වෙතොත්, තම ඉල්ලුම් පත්‍රය සලකා බලන ලෙස ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට අහිමිවනු ඇත.

පර්සි ද සිල්වා,
නීති කෙටුම්පත් සම්පාදක.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 544, අළුත්කඩේ,
කොළඹ 12,
1965 අගෝස්තු මස 2 වෙනි දින.

## ඉල්ලුම් පත්‍ර ආකෘතිය

**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ සහකාර භාෂා පරිවර්තක තනතුරු (දෙමළ) II වෙනි ශ්‍රේණිය**

1. සම්පූර්ණ නම :———.
   (අ) පෙළපත් නම (පැහැදිලි අකුරෙන් :———.
   (ආ) වෙනත් නම් :———.
2. ලිපිනය :———.
3. උපන් දිනය හා 1965 අගෝස්තු 31 වෙනි දිනට වයස :———.
4. ජාතිය හා ජාතිකත්වය ලැබූ පිළිවෙල :———.
5. උපන් ස්ථානය :———.
   (අ) අයදුම්කරුගේ :———.
   (ආ) අයදුම්කරුගේ පියාගේ :———.
   (ඇ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තාගේ :———.
6. අයදුම්කරු විවාහක ද අවිවාහක ද හෝ වැන්දඹු භාවය :———.
7. ඉගෙනීම ලත් පාසැල් හා විද්‍යාල (පොදු අධ්‍යාපනය සඳහා ඒවාට ඇතුළත් වූ හා අස් වූ දිනයන් සමග) :———.
8. අධ්‍යාපන සුදුසුකම් :———.
9. දෙමළ භාෂාවෙන් ලැබූ උසස් ම සුදුසුකම් :———.
   (ලබා ඇති උපාධි සහ ඒවායේ පංති හා ඉදිරිපත් වුණු විෂයයන් සඳහන් කළ යුතු ය.)
10. පරිවර්තන සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ දැනීම ද කෘතහස්ත භාවය ද පිළිබඳ සම්පූර්ණ විස්තර :———.
11. පාසැලෙන් හෝ විද්‍යාලයෙන් අස් වූ පසු කළ රක්ෂා පිළිබඳ විස්තර සහ ඒවාට පත් වූ හා ඉන් අස් වූ දින :———.
12. විශේෂ අයිතිවාසිකම්, සුදුසුකම්, පුහුණුවීම හෝ පළපුරුද්ද : ———.
13. අයදුම්කරු සම්බන්ධයෙන් වගකිව හැකි, ඥාතීන් නොවන, දෙදෙනකුගේ නම් හා තරාතිරම්. මේ අය පෞද්ගලික ජීවිතයෙහි අයදුම්කරු හොඳින් දන්නා අය විය යුතු ය. (රාජ්‍ය සේවයෙහි නියුක්ත අයදුම්කරුවන් සම්බන්ධයෙන් මෙය අනවශ්‍යය.)
14. වෙනත් කරුණු :———.

මේ ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සඳහන් කොට තිබෙන සියලු විස්තර සත්‍ය වූ ද නිවැරදි වූ ද කරුණු බව මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසිවක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ ඔප්පු වුවහොත්, තෝරා ගැනීමට පෙර වරද අනාවරණය වී නම් නුසුදුස්සකු වීමට ද, තෝරා ගැනීමෙන් පසු වරද අනාවරණය වී නම් කිසි වන්දි ගෙවීමක් නොමැතිව සේවයෙන් පහ කරනු ලැබීමට ද, මා යටත් වන බව මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

8-259 2—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ, නියෝජ්‍ය අධ්‍යක්ෂක (රසායනාගාර සේවා) තනතුර සඳහා, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක විසින් අයදුම් පත් කැඳවනු ලැබේ.

1965.8.16 වන දින අයදුම්පත් භාරගැනීම අවසන් කෙරේ.

වැඩිදුර විස්තර අවශ්‍ය නම් පහත අත්සන් කරන අයගෙන් ලියා විමසන්න. කිසිම ලියවිල්ලක් පහත අත්සන් කරන අයගේ පුද්ගලික නමට එවිය යුතු නොවේ.

වී. ඊ. ජේ. ගුණරත්න,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
තැ.පෙ. 500, ගාලු මුවදොර, කොළඹ,
1965 ජූලි මස 30 වැනිදා.

8-103—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## කටුනායක, රාජකීය ලංකා ගුවන් හමුදාවේ රෝහල

**වින්නඹු තනතුර**

වින්නඹු තනතුරක් සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. අයදුම් පත් මෙහි පහත සඳහන් ආකෘති පත්‍රයේ ලියා 1965 අගෝස්තු මස 25 වෙනිදාට පෙර සිවිල් පාලක නිලධාරි හා ගණකාධිකාරි, රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානය, තැ. පෙ. 594, කොළඹ යන ලිපිනයට ඉදිරිපත් කළ යුතුයි. අයදුම් පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "වින්නඹු තනතුර සඳහා අයදුම් පත" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුයි.

2. වැටුප සහ සේවා කොන්දේසි.—තනතුරට අයත් වැටුප අවුරුද්දකට රු. 696—30—1,038.

සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි.—තනතුර ස්ථිර නමුත් විශ්‍රාම වැටුප් රහිතය. පත්වීම අවුරුදු තුනක් යනතෙක් පරීක්ෂණයට භාජනවේ.

3.අධ්‍යාපනික හා වෙනත් සුදුසුකම් :—

සෑම අයදුම් කාරියකටම මෙහි පහත සඳහන් සුදුසුකම් ඇති බවට සෑහෙනා සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි.

(අ) 1966 ජනවාරි මස 1 වෙනිදාට වයස අවුරුදු 20ට නොඅඩුවීම හා අවුරුදු 35ට නොවැඩිවීම,

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට වඩා උසස් විභාගයකින් සමර්ථ වී සිටීම,

(ඇ) විශිෂ්ඨ චරිතයක් ඇතිවීම හා මනා ශරීර සෞඛ්‍යයක් ඇති වීම,

(ඈ) වින්නඹුකමේ කාර්‍යක්ෂමතාවය පිළිබඳ පිළිගත් සහතික පත්‍රයක් ඇතිවීම,

(ඉ) වින්නඹු මාතාවක් වශයෙන් වෛද්‍ය මණ්ඩලයේ ලියාපදිංචිවී සිටිය යුතුයි,

(ඊ) රජයේ හෝ පුද්ගලික රෝහලක වින්නඹු මාතාවක් ලෙස අවම වශයෙන් අවුරුදු දෙකකවත් පළපුරුද්දක් තිබීම.

4. අයදුම් කාරියන් ඔවුන්ගේ අයදුම් පත් වලට මෙහි පහත සඳහන් ලියකියවිලි වලට මුල් පිටපත් නොව පිටපත් අමුණා එවිය යුතුයි.

(1) උප්පැන්න සහතිකය,
(2) ලබාගෙන ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතික පත්‍රය,
(3) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික පත්‍රය,
(4) අයදුම්කාරියගේ චරිතය හා හැකියාවන් පිළිබඳ ළඟදී ලබාගත් චරිත සහතික තුනක්.

සැ. යු.—(i) දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින අයදුම්කාරියන් විසින් චරිතය සහ හැකියාවන් පිළිබඳ මෙම චරිත සහතික ඉදිරිපත් කිරීම අවශ්‍ය නැති නමුත් මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගෙන් සහතිකයක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත්ය.

(ii) එම සහතික පත්‍රවල සහ චරිත පත්‍රවල පිටපත් ආපසු එවන්නේ නැත.

5. සෑම අතින්ම මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6. අයදුම් පත් හෝ ඒ පිළිබඳ වෙනත් ලියකියවිලි සිවිල් පාලක නිලධාරි හා ගණකාධිකාරිට මිස මෙම දෙපාර්තමේන්තුවේ අන් කිසිම නිලධාරියෙකුට පුද්ගලිකව නො එවිය යුතුය. පුද්ගලිකව එවනු ලබන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ මුලින්ම දක්වෙන රජයේ සේවයේ තනතුරුවලට පත් කර ගැනීම් පිළිබඳ පොදු කොන්දේසි ද බලන්න.

8. අවිවාහක අයදුම්කාරියන් ගැන වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

එස්. රාමචන්ද්‍ර,
සිවිල් අංශයේ පරිපාලක නිලධාරි හා
ගණකාධිකාරි,
ගුවන් හමුදාධිපති වෙනුවට.

මූලස්ථානය,
රා. ලං. ගු. හ,
තැ. පෙ. 594,
කොළඹ.
1965 ජූලි මස 31 වන දින.

--- විත්නඹු තනතුර සඳහා ආදර්ශ අයදුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :———.
2. ලියුම් ලැබෙන පිළිවෙල :———.
3. උපන් දිනය හා 1966 ජනවාරි මස 1 වෙනිදාට වයස :———.
4. ජාතිය (උත්පත්තියෙන් හෝ ලියාපදිංචිවීමෙන් ලංකාවේ පුරවැසියෙක්ද කියා සඳහන් කරන්න. ලියාපදිංචිවීමෙන් ලංකාවේ පුරවැසියෙක්වී සිටී නම් ලියාපදිංචි වූ අංකය සඳහන් කරන්න.) :———.
5. සිවිල් තත්ත්වය :———.
6. අධ්‍යාපනික සුදුසුකම් :———.
7. වෘත්තීය සුදුසුකම් :———.
8. පාසැලෙන් අස්වූ කාලයේ සිට කළ රැකියා පිළිබඳ විස්තර (කාල ක්‍රමානුගත පිළිවෙළට) :———.
   සේවා යෝජකයාගේ නම සහ ලිපිනය :———.
   සේවා කාලය : —— සිට —— දක්වා.
   දරණ ලද තනතුර :———.
9. ඔබ කෙදිනක හෝ උසාවියක් මගින් දඬුවම් ලබා හෝ ඇප බඳිනු ලැබ සිටිද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.
10. ඉදිරිපත් කර ඇති චරිත සහතික පත්‍ර ලබාගත් අයගේ නම්, ලිපිනය සහ තනතුරු :———.

———,
අයදුම්කාරියගේ අත්සන.

දිනය :———.

8–186—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා ගුවන් හමුදව—නිලධාරි පුරප්පාඩුවක්

### කාර්මික (සංඥ) අංශය

රාජකීය ලංකා ගුවන් හමුදවේ කාර්මික (සංඥ) අංශයේ නිලධාරි පුරප්පාඩුවක් සඳහා අයැදුම්පත් කැඳවනු ලැබේ.

2. තෝරා ගන්නා ලද අපේක්ෂකයාට පයිලට් ඔපිසර් වශයෙන් නිත්‍ය අධිකාරි ලැබෙනවා ඇත. (කාර්මික (සංඥ) අංශයේ නිලධාරියෙකුගේ රාජකාරිවලට සාමාන්‍ය ගුවන් හමුද රාජකාරි හැරුණුවිට, ගුවන් විදුලි ඉංජිනේරු ශිල්පයට සම්බන්ධිත කටයුතුත් විශේෂයෙන් ගුවන් යානාවලට සවිකර ඇති ගුවන් විදුලි යන්ත්‍ර සහ රේඩාර් යන්ත්‍ර, ගුවන් විදුලි යාන්ත්‍රික ආධාර, ඉතා කෙටි තරංග සහ කෙටි තරංග පනිවුඩ හුවමාරු, රේඩාර් ආධාර, ගුවන් විදුලි යන්ත්‍ර, දුරමුද්‍රිකයන් සහ සංධාමක විදුලි පනිවුඩ හුවමාරු සේවා කටයුතු ද අයත් වේ)

3. තෝරාගනු ලබන අපේක්ෂකයා ලංකාවේ හෝ වෙනත් රටක පුහුණුව ලැබිය යුතුයි.

**වැටුප් සහ දීමනා**

4. වැටුප් සහ දීමනා පිළිබඳ විස්තර දැන ගැනීම සඳහා අංක 12,395 හා දතම 1961 අප්‍රේල් මස 28 වන දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළකර ඇති 1961 ගුවන් හමුද වැටුප් සංග්‍රහය සහ කලින් කල කරණ ලද ඊට අදල සංශෝධන බැලිය යුතුයි.

(අ) ස්කොඩ්රන් ලීඩර් නිලය දක්වා ඇති නිලයන්ට අදල මූලික වැටුප් මෙසේය :—

පයිලට් ඔපිසර්—වර්ෂයකට රුපියල් 4,500.

ප්ලයිං ඔපිසර්—වර්ෂයකට රුපියල් 4,860න් පටන්ගෙන රුපියල් 180ක්වූ වාර්ෂික වැටුප් වර්ධන දෙකකින් සහ රුපියල් 360ක්වූ වාර්ෂික වැටුප් වර්ධනයකින් වර්ෂයකට රුපියල් 5,580 දක්වා නගී.

ප්ලයිට් ලුතිනන්—වර්ෂයකට රුපියල් 6,660න් පටන්ගෙන රුපියල් 180ක්වූ වාර්ෂික වැටුප් වර්ධන හයකින් වර්ෂයකට රුපියල් 7,740 දක්වා නගී.

ස්කොඩ්රන් ලීඩර්.—වර්ෂයකට රුපියල් 8,820න් පටන්ගෙන රුපියල් 180ක්වූ වාර්ෂික වැටුප් වර්ධන හයකින් වර්ෂයකට රුපියල් 9,900 දක්වා නගී.

(ආ) නිල ඇඳුම්.—අධිකාරි ලැබූ නිලධාරියෙකුවූ විගස සර්ම කලාපීය ඇඳුම් සඳහා රුපියල් 650ක දීමනාවක් ගෙවනු ලැබේ. සේවය සඳහා හෝ පුහුණුව සඳහා විදේශීය රටකට මාරු කළ විට ඇඳුම් සඳහා තවත් රුපියල් 1,300ක දීමනාවක් ගෙවනු ලැබේ. අවුරුදු දෙකක සේවයක් සම්පූර්ණ කළ පසු නිල ඇඳුම් නඩත්තුව සඳහා රුපියල් 25ක දීමනාවක් ගෙවනු ලැබේ.

(ඇ) සෙසු දීමනා.—ජීවන වියදම් දීමනා, විශේෂ ජීවනාධාර දීමනා හා නිවාස කුලී දීමනා රජයේ ගණන් මිම් අනුව ගෙවනු ලැබේ.

5. 1962 සැප්තැම්බර් 14 වැනි දින අංක 13,301 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර, වරින්වර සංශෝධනය කරනු ලැබූ 1962 ගුවන් හමුද විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික දීමනා සංග්‍රහය අනුව විශ්‍රාම වැටුප්/පාරිතෝෂික දීමනා ගෙවනු ලැබේ. රජය යටතේ කරන ලද ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවයද, කලින් ලංකා ආරක්ෂක හමුදවන්හි හෝ බ්‍රිතාන්‍ය පොදු රාජ්‍ය මණ්ඩලයේ වෙනත් කිසියම් සන්නාඩ සේවයක යෙදී සිටියේ නම් එම සේවයද විශ්‍රාම වැටුප් සඳහා ගණන් ගනු ලැබේ.

**සේවා කොන්දේසි**

6. රාජකීය ලංකා ගුවන් හමුද නිලධාරියෙකුගේ සේවා කොන්දේසි සහ අනාගතාභිවෘධිය තීරණය වන්නේ 1951 අප්‍රේල් 27 වැනි දින අංක 10,240 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කර වරින්වර සංශෝධනය කරනු ලැබූ 1951 රාජකීය ලංකා ගුවන් හමුද (නිත්‍ය හා නිත්‍ය උපසේවා) නියෝග අනුවයි.

7. නිලධාරි නිවාසයේ පදිංචි වී සිටින අවිවාහක නිලධාරියෙකුට ගෘහ භාණ්ඩ සහිත නිවාස පහසුකම්, ආහාර හා බැට්මන් සේවයද සපයනු ලැබේ. මේ කාලය තුළදී ඔහුට ජීවන වියදම් දීමනා සහ විශේෂ ජීවනාධාර දීමනා නොලැබේ.

8. විවාහක නිලධාරියෙකුට (හැකිනම්) විවාහක නිවාසයක් සපයා පුද්ගලික බැට්මන් සේවය වෙනුවට දීමනාවක්ද ගෙවනු ලැබේ.

9. ගුවන් හමුදවේ නිලධාරීන් රාජකාරිය පිණිස හෝ පුහුණුව පිණිස ඕනෑම වේලාවක ලෝකයේ ඕනෑම ස්ථානයකට මාරුකළ හැක.

10. රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස විශේෂයෙන් 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනත ක්‍රියාත්මක කිරීම පිණිස මේ දක්වා පනවා ඇති ව්‍යවස්ථාවන් හෝ ඊට අදල සංශෝධන හෝ ඉදිරි කාලයෙහි පැනවෙන ව්‍යවස්ථාවන් තෝරාගනු ලබන අපේක්ෂකයා විසින් පිළිපැදිය යුතුයි.

**මූලික අවශ්‍යතා**

11. අයැදුම්කරුවන්ට මෙහි පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුයි :—

(අ) ජාතිය—අයැදුම්කරුවන් (i) උත්පත්තියෙන් හෝ (ii) ලියා පදිංචි කරනු ලැබීමෙන් ලංකාවේ පුරවැසියන් විය යුතුයි;

(ආ) වයස—අයැදුම්කරුවන් 1965 ජූලි මස 1 වන දිනට වයස අවුරුදු 26 නොඉක්මවා තිබිය යුතුයි;

(ඇ) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්.—පහත සඳහන් සුදුසුකම්වලින් එකක් තිබෙන බවට අයැදුම්කරුවන් විසින් සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(i) පිළිගත් විශ්ව විද්‍යාලයක භෞතික විද්‍යාව සහ/හෝ ගණිතය සහිත ඉංජිනේරු ශිල්පය හෝ විද්‍යාව පිළිබඳ උපාධියක්, හෝ

(ii) ලංකා විශ්ව විද්‍යාලයේ (සාමාන්‍ය හෝ විශේෂ) ඉංජිනේරු ශිල්පය හෝ විද්‍යාව පිළිබඳ ප්‍රථම පරීක්ෂණයෙන් (ගණිතය සහ භෞතික විද්‍යාව සහිතව) සමර්ථ වී සිටීම, හෝ

(iii) ලන්ඩන් විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු ශිල්පය හෝ විද්‍යාව පිළිබඳ "ඉන්ටර් මීඩියෙට් පරීක්ෂණයෙන් (ගණිතය සහ භෞතික විද්‍යාව සහිතව) සමර්ථ වී සිටීම, හෝ

(iv) සුද්ධ හෝ ව්‍යවහාරික ගණිතය සහ භෞතික විද්‍යාව සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ එකවිට එකම වතාවේදී සුද්ධ සහ ව්‍යවහාරික ගණිතය ඇතුළුව විෂයන් හයකින් අධ්‍යාපන පොදු සහතික (සාමාන්‍ය) විභාගයෙන් සමර්ථ වී සිටීම, හෝ අධ්‍යාපන පොදු සහතික (උසස් පෙළ) ගණිතය සහ භෞතික විද්‍යාවෙන් සමර්ථයක් ලබා සිටින අතිරේකව සිටි ඇන්ඩ් ගිල්ඩ් ඔප් ලන්ඩන් ඉන්ස්ටිටියුට්, ඉන්ටර් මීඩියෙට් සර්ටිපිකේට් ඉන් ටෙලිකොමියුනිකේෂන්, ඉන්ජිනියරින් පරීක්ෂණය හෝ ඊට උසස් පරීක්ෂණය යන පරීක්ෂණ දෙක අතුරින් එකකින් සමර්ථ වී සිටීම සහ ඉතා කෙටි තරංග සහ කෙටි තරංග වලින් යුත් දුර මුද්‍රිකයන් සහ ගුවන් විදුලි යන්ත්‍ර හෝ රේඩාර් යන්ත්‍ර නඩත්තුව ගැන මනා අවබෝධයක් ඇති අපේක්ෂකයින් ගැනද සලකා බලනු ලැබේ.

(v) ගුවන් හමුදාධිපතිගේ වැටහීම අනුව ඉහත සඳහන් වගන්තිවල (i සිට iv) දක්වා) සඳහන් කර ඇති සුදුසුකම්වලින් එකකට සමාන වෙනත් සුදුසුකම් තිබීම.

**(ඇ) සෞඛ්‍ය තත්වය.**—අපේක්ෂකයින්ගේ සෞඛ්‍ය තත්වය ගුවන් හමුදාවට ගැලපෙන පරිදි තිබිය යුතුයි. (අඩු වශයෙන් උස අඩි 5 අඟල් 4ක්ද, පපුව අඟල් 32ක්ද, බර රාත්තල් 105ක්ද විය යුතුයි)

**(ඉ) විවාහය**—අයැදුම්කරුවන් අවිවාහකයින් වියයුතු අතර අධිකාරිය ලබා අවුරුදු දෙකක් ඉක්මෙන තුරු විවාහ වීමට ඔවුන්ට අවසර නොදෙනු ඇත.

**සැලකිය යුතුයි.**—ලාංකික නොවන අය සමඟ විවාහ වීමට නිලධාරීන්ට අවසර නොදෙන අතර යම්හෙයකින් එසේ විවාහ වුවහොත් එම හේතුවෙන් තත්වයෙන් උස්වීම අත්හිටවීමට හෝ අධිකාරිය ඉවත්කර දැමීමට හෝ ඉඩ තිබේ.

**අයැදුම්කරුවන්ට උපදෙස්**

12. මෙම නිවේදනයේ 19 වෙනි ඡෙදයේ දී ඇති උපලේඛනයේ පෙනෙන අයුරු අයැදුම්පත් ඉදිරිපත් කළ යුතුයි. මුද්‍රණ අයැදුම්පත් නොමැති බැවින් අයැදුම්කරුවන් විසින් තම තමන්ගේ අයැදුම්පත් සකස්කර ගත යුතුයි. නියමිත ආකෘති පත්‍රය අනුව නොමැති අයැදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

13. අයැදුම්පත්, ගුවන් හමුදාධිපති, තැ.පෙ. 594, කොළඹ කියා එවිය යුතුයි. අයැදුම්පත් බහාලන කවරයේ "අයැදුම්පත කාර්මික (සංඥා) අංශය—නිලධාරීන්" යනුවෙන් කවරයේ වම්පැත්තේ උඩ කොනේ සඳහන් කර තිබිය යුතුයි. අයැදුම්පත් 1965 අගෝස්තු මස 28 වන දින දවල් 12 වන තෙක් භාරගනු ලැබේ.

14. අයැදුම්පත් සමඟ පහත සඳහන් ලියකියවිලිවල පිටපත්ද ඉදිරිපත් කළ යුතුයි :—

(අ) අයැදුම්කරුගේ උප්පැන්න සහතිකය,

(ආ) ලබාගත් උසස්ම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික පත්‍රය;

(ඇ) අයැදුම්කරු පුද්ගලිකව ඇසුරු කරණ වගකිය යුතු පුද්ගලයින්ගෙන් ලබාගත් චරිත සහතික ;

(ඈ) අයැදුම්පතෙහි සඳහන්කර ඇති යම් කරුණක් සනාථ කිරීමට සහතික පත් තිබේ නම් ඒවා.

15. රජයේ සේවයේ යෙදී සිටින නිලධාරීන් අයැදුම් පත් එවිය යුත්තේ තම දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගිනි. තෝරාගනු ලැබුවහොත් අයැදුම්කරු නිදහස් කළ හැකි බවට සහතිකයක්ද එහි තිබිය යුතුයි.

**තෝරා ගැනීම, සම්මුඛ පරීක්ෂණ ආදිය**

16. යම් අයැදුම්කරුවෙකුට මෙහි 11 වන ඡෙදයේ සඳහන් කර ඇති අවශ්‍ය සුදුසුකම් ඇති බව පෙනීගොස් ඔහු සුදුස්සෙකු ලෙස සලකනු ලැබුවහොත්, තමාගේ වියදමින්, නියමිත දිනයක සහ වේලාවක නියමිත ස්ථානයක පවත්වනු ලබන තෝරා ගැනීමේ මණ්ඩලයක් ඉදිරිපිට පෙනී සිටීමට උපදෙස් දෙනවා ඇත.

17. ප්‍රාථමික තේරීම් මණ්ඩලය මගින් සුදුසුයයි සලකනු ලබන අයැදුම්කරුවන් අවසාන තේරීමේ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර, ගුවන් හමුදාවේ ප්‍රධාන වෛද්‍ය නිලධාරි තැන විසින් පරීක්ෂා කරනු ලැබේ.

18. අවසාන තේරීම කරනු ලබන්නේ රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු භාර ඇමතිතුමා විසින් පත් කරනු ලබන මණ්ඩලයක් මගිනි. තෝරාගනු ලැබූ අයැදුම්කරු වෙත ඒ බව එම මණ්ඩලය විසින් දන්වා ඔහුට අධිකාරි බලය ලැබීමට ඉඩ ඇති දිනයද දන්වනවා ඇත.

**ආකෘති පත්‍ර පිරවීම**

19. පහත සඳහන් ආකෘති පත්‍රය සාමාන්‍ය ෆුල්ස්කැප් කඩදාසියක පිටපත් කර ගත යුතුයි. සියලුම කොටු පැහැදිලි ලොකු අකුරෙන් හෝ ටයිප්ගසා පිරවිය යුතුයි. කිසිම කොටුවක් හිස්ව නොතැබිය යුතු අතර, එය කපා නොහැරිය යුතුයි. කාර්යාලයේ පාවිච්චිය පිණිස ආකෘති පත්‍රයේ මුදුනෙහි අඟල් 2ක් පමණ ඉඩක් වෙන්කළ යුතුයි. ආකෘති පත්‍රය මුල්කරගෙන ඊට අදාල අනිකුත් පිටපත් ආකෘති පත්‍රයට ඇමිණිය යුතුයි.

ඊ. ආර්. අමරසේකර,
එයාර් කොමදෝරු,
ගුවන්හමුදාධිපති.

මූලස්ථානය,
රාජකීය ලංකා ගුවන් හමුදාව,
තැ.පෙ. 594 කොළඹ.

## රාජකීය ලංකා ගුවන් හමුදාවේ කාර්මික/සංඥා අංශයේ අධිකාරියක් සඳහා අයදුම් පත

**පුද්ගලික විස්තර :**

1. අගට යෙදෙන නම :———— සෙසු නම් :————.
2 දැනට ලිපිනය :————. 1. දුරකථන අංකය :————.
2. නුදුරු දුම්රිය පළ :————.
3. නුදුරු පොලිස් ස්ථානය :————.
4. විදුලි පණිවුඩ කාර්යාලය :————
3. ස්ථිර වාසස්ථානය :————. එහි වාසය කළ කාලය :————.
4. විවාහක තත්වය :————.
5. ආගම :————.
6. මව්පිය විස්තර :————.

| | නම | උපන් ස්ථානය | උප්පත්තියෙන් රටවැසි භාවය |
|---|---|---|---|
| (අ) පියා : | ———— | ———— | ———— |
| (ආ) මව් : | ———— | ———— | ———— |

7. පාසැල් හා විශ්වවිද්‍යාල චරියාව :—

(අ)

| පාසැල් ආදියෙහි නම | ඇතුලත්වූ දිනය | අස්වූ දිනය |
|---|---|---|
| ———— | ———— | ———— |
| ———— | ———— | ———— |
| ———— | ———— | ———— |

8. පාසැලෙන් අස්වූ පසු නියුක්තව සිටි රක්ෂාවල් :—
(මෙය සම්පූර්ණ වාර්තාවක් විය යුතුයි)

(අ)

| ස්වාමියාගේ නම | රක්ෂාවෙහි ස්වභාවය | රක්ෂාවෙහි කාලසීමාව |
|---|---|---|
| ———— | ———— | ———— |
| ———— | ———— | ———— |
| ———— | ———— | ———— |

9. මීට ප්‍රථම යුෂ්මතා සන්නධ සේවයක යම් පුරප්පාඩුවක් සඳහා සම්මුඛ පරීක්ෂණයකට පෙනී සිට තිබේද ? එසේ නම් ඉල්ලුම් කළ තනතුර, විස්තර හා දිනයද දක්වන්න :————.

10. සිවිල් උසාවියක් හෝ සේනා විනිශ්චය මණ්ඩලයක් හෝ මගින් යුෂ්මතා වරදට පත්කර තිබේද ?————.

11. අවශ්‍ය සුදුසුකම් :—
(මේ නිවේදනයේ 12 වන ඡෙදයේ අවශ්‍යතාවන් සඳහාය).

| උපන් දිනය | වයස | උපන් ස්ථානය | රටවැසි භාවය |
|---|---|---|---|
| ———— | ———— | ———— | උත්පත්තියේදී :————. |
| | | | දැනට :————. |

(අ) යෝග්‍යතා :————. (ආ) අධ්‍යාපන සුදුසුකම් :————.
එනම් සුදුසුකම් පිළිබඳ 12 වන
ඡෙදයෙහි වගන්තිය ප්‍රකාර ;—

(ඇ) උස :— පපුව :— බර :—
අඩි.—— අඟල්—— අඟල්—— රාත්තල්——

12. අතිරේක සුදුසුකම් (පහත කොටුවල සඳහන් අයිතිවාසිකම් සනාථ කිරීමට අයදුම්කරුට පුළුවන් විය යුතුයි) :————.

13. ක්‍රීඩා දක්ෂතා විස්තර (කණ්ඩායම් හා තරඟ විස්තර දක්වා දිනයන් හා ලබාගත් දක්ෂතාවයද සඳහන් කරන්න) :————.

14. පාසැලේදී හෝ විශ්වවිද්‍යාලයේදී හෝ ලබාගත් අනිකුත් දක්ෂකම් :————.

15. නිත්‍ය හෝ ස්වේච්ඡා සන්නද්ධ සේවයකට හෝ බාල දක්ෂ ආයතනයක හෝ කළ සේවා විස්තර :————.

16. යම්කිසි විශේෂ සුදුසුකම් :————.

17. මෙම අයදුම්පත සමඟ එවිය යුතු දේ (පිටපත් පමණක් එවිය යුතුයි) :————.

18. ප්‍රසාද සහතික ලබාගත් අයවලුන්ගේ නම් :————.

19. මෙම අයදුම්පතට අමුණා ඇති තවත් දේ :————

.......................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8–99—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## ජාතික පේෂකර්ම සංස්ථාව

වර්ෂ 1965 ක්වූ අගෝස්තු මස 20 වෙනි දින පස්වරු 4.30 දක්වා පහත සඳහන් තනතුරු සඳහා ඉල්ලුම් පත් භාරගනු ලැබේ :—

**සහකාර ගණකාධිකාරි**

සුදුසුකම්.—(1) චාටර් බලපත් ගණකාධිකාරින්ගේ හෝ මිල කිරීමේ වැඩ සම්බන්ධ ගණකාධිකාරීන්ගේ ආයතනයෙහි මධ්‍යම විභාගයෙන් සමත් ව තිබීම;

(2) ගිවිසුම් කාලයක් හෝ මිල කිරීමේ කාර්‍යාලයක අවුරුදු 3 ක පුහුණුවක් සම්පූර්ණ කර තිබීම.

විශාල වෙළඳ ආයතනයක හෝ රජයේ සංස්ථාවක ආනයන කටයුතු ගැන පළපුරුද්ද විශේෂ සුදුසුකමක් හැටියට සලකනු ලැබේ.

වැටුප් ක්‍රමය.—මසකට රු. 625—රු. 25 × 15—රු. 1,000 සියළු දීමනා ඇතුළුව.

**විකිණීමේ නිලධාරි**

සුදුසුකම්.—පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙක් විය යුතුයි. විකිණීමේ වැඩ ගැන පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වනු ඇත. කපුනූල් හා රෙදිපිළි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ පළපුරුද්ද ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

හෝ

රජයේ දෙපාර්තමේන්තුවක හෝ විශාල වෙළඳ ආයතනයක අවුරුදු දහයක පළපුරුද්ද. කපුනූල් හා රෙදිපිළි සම්බන්ධයෙන් කටයුතු කිරීමේ පළපුරුද්ද ඇති අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

වැටුප් ක්‍රමය.—මසකට රු. 400—රු. 25—රු. 600—ක.බා. රු. 30—රු. 900 සියළු දීමනා ඇතුළුව.

**ගබඩාකරු—I ශ්‍රෙණිය**

සුදුසුකම්.—ශුද්ධ හා ව්‍යවහාර ගණිතය සහිත ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨ සහතිකය. ගබඩා කටයුතු පිළිබඳ අවුරුදු 8 ක පළපුරුද්ද, ගබඩා පාලනය හා වට්ටෝරු ලේඛන, බින්කාඩ්පත්, ගබඩා ලේඛන යනාදිය පවත්වාගෙන යෑමේ හැකියාව. කපුනූල් ගබඩා පාලනය පිළිබඳ පලපුරුද්ද අතිරේක සුදුසුකමක් හැටියට සළකනු ලැබේ.

වැටුප් ක්‍රමය.—මසකට රු. 340—රු. 15 × 8—රු. 460—සියළු දීමනා ඇතුළුව.

**සහකාර ගබඩාකරු—I ශ්‍රෙණිය**

සුදුසුකම්.—ශුද්ධ හා ව්‍යවහාර ගණිතය සහිත ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨ සහතිකය. ගබඩා කටයුතු පිළිබඳ අවුරුදු 5 ක පළපුරුද්ද, ගබඩා පාලනය හා වට්ටෝරු ලේඛන, බින් කාඩ්පත්, ගබඩා ලේඛන යනාදිය පවත්වාගෙන යෑමේ හැකියාව.

කපුනූල් ගබඩා පාලනය පිළිබඳ පළපුරුද්ද අතිරේක සුදුසුකමක් හැටියට සළකනු ලැබේ.

වැටුප් ක්‍රමය.—මසකට රු. 270—රු. 8 × 5—රු. 310—සියළු දීමනා ඇතුළුව.

**මුදල් භාරකරු—II ශ්‍රෙණිය**

සුදුසුකම්.—ජ්‍යෙෂ්ඨය සහ එම විභාගයේදී එකවරම අඩු වශයෙන් විෂයයන් 3කට සම්මාන ලබා තිබීම. වයස අවුරුදු 35 ට අඩුවිය යුතුයි. මුදල් භාරකරු වශයෙන් විශාල වෙළඳ ආයතනයක හෝ රජයේ දෙපාර්තමේන්තුවක අවුරුදු පහක පළපුරුද්ද. තෝරාගත් අයදුම්කරු විසින් මුදලින් හා විශ්වාස ඇප ඔප්පුවකින් ඇප තැබිය යුතුයි.

වැටුප් ක්‍රමය.—මසකට රු. 260—රු. 15 × 13—රු. 455—සියළු දීමනා ඇතුළුව.

**පොත් තබන්නා—II ශ්‍රෙණිය (තනතුරු දෙකකි)**

සුදුසුකම්.—පිළිගත් වෙළඳ ආයතනයක හෝ රජයේ ආයතනයක පොත් තබන්නෙකු වශයෙන් අඩුම ගණනේ අවුරුදු 3ක පළපුරුද්ද හා පොත් තබන්නන්ගේ ආයතනයේ අවසාන පරීක්ෂණය හෝ ලංකා කාර්මික විද්‍යාලයේ පොත් තබන්නන් සඳහා උසස් වාණිජ සහතික පත්‍ර විභාගය.

හෝ

පිළිගත් වෙළඳ ආයතනයක හෝ රජයේ ආයතනයක පොත් තබන්නකු වශයෙන් අඩුම ගණනේ අවුරුදු හතක පළපුරුද්ද.

වැටුප් ක්‍රමය.—මසකට රු. 260—රු. 15 × 13—රු. 455—සියළු දීමනා ඇතුළුව.

**ජ්‍යෙෂ්ඨ ලිපිකරු—II ශ්‍රෙණිය**

සුදුසුකම්.—විෂයයන් හයක් සහිත අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගයෙන් සමත්ව සිටිය යුතුයි. රජයේ දෙපාර්තමේන්තුවක, රජයේ සංස්ථාවක හෝ විශාල වෙළඳ ආයතනයක සාමාන්‍ය පාලනය, කාර්‍යාල වැඩ හා ගබඩා කටයුතු පිළිබඳ අවුරුදු පහක පළපුරුද්ද.

වැටුප් ක්‍රමය.—මසකට රු. 260—රු. 15 × 13—රු. 455—සියළු දීමනා ඇතුළුව.

**ටෙන්ඩර් ලිපිකරු—I ශ්‍රෙණිය**

සුදුසුකම්.—විෂයයන් 6ක් සහිත අධ්‍යයන පොදු සහතික පත්‍ර විභාගය. උපලේඛන, මිල ගණන් හා ඇස්තමේන්තු යනාදිය පිළියෙල කිරීම වැනි ටෙන්ඩර් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ පළපුරුද්ද. ආනයන කටයුතු පිළිබඳ පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වනු ඇත.

වැටුප් ක්‍රමය.—මසකට රු. 210—රු. 10 × 14—රු. 350—සියළු දීමනා ඇතුළුව.

**ලඝු ලේඛක (ඉංග්‍රීසි)—I ශ්‍රෙණිය (තනතුරු දෙකකි)**

සුදුසුකම්.—ජ්‍යෙෂ්ඨය හා ලඝුලේඛකයෙකු වශයෙන් අවුරුදු 3 ක පළපුරුද්ද. ලඝුලේඛන සටහන් ගැනීමේ වේගය—විනාඩියකට වචන 80. යතුරු ලිවීමේ වේගය—විනාඩියකට වචන 40.

වැටුප් ක්‍රමය.—මසකට රු. 210—රු. 10 × 14—රු. 350—සියළු දීමනා ඇතුළුව.

තෝරාගනු ලබන අයදුම්කරුවන්ට ඔවුන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද අනුව එම වැටුප් ක්‍රමයන්හි සුදුසු ස්ථානයන්ට පත්වීම් දීම ගැන සළකා බලනු ලැබේ.

අයදුම් කරුවන් විසින් ඔවුන්ගේ වයස, අධ්‍යාපනික සුදුසුකම් සහ පාසැලෙන් අස්වූ පසු කළ රැකියාවන් සම්බන්ධ සම්පූර්ණ විස්තරද සඳහන් කළයුතු අතර, අධ්‍යාපනික සහ චරිත සහතිකයන්හි පිටපත් ද (මුල් පිටපත් නොවේ) ඉදිරිපත් කළ යුතුය.

ආධාර ලබා ගැනීමට හෝ අසත්‍ය තොරතුරු සැපයීමට හෝ නැත් කිරීම නුසුදුසුකමක් හැටියට සළකනු ලැබේ.

ලේකම්.

ජාතික පේෂකර්ම සංස්ථාව,
56, හෝර්ටන් පෙදෙස,
කොළඹ 7.

8–163—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂයරෝග මර්ධන ව්‍යාපාරයේ නියෝජ්‍ය පාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි තනතුරක් සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් අයදුම් පත් කැඳවනු ලැබේ.

1965.8.23 වන දින අයදුම් පත් භාර ගැනීම අවසන් කෙරේ.

වැඩිදුර විස්තර අවශ්‍ය නම් පහත අත්සන් කරන අයගෙන් ලියා විමසන්න. කිසිම ලියවිල්ලක් පහත අත්සන් කරන අයගේ පුද්ගලික නමට එවිය යුතු නොවේ.

වී. ටී. හේ. ගුණරත්න,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
තැ. පෙ. 500, ගාලුමුවදොර, කොළඹ.
1965 ජූලි මස 30 වැනි ද.

8–101—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### පොත් බඳින්නන් තනතුරු

අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පොත් බඳින්නන් තනතුරු දෙකක් සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සේවකයන්ගෙන් ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වා ඇති ආදර්ශ පෝරමය අනුව ඉල්ලුම් පත් සකස් කොට 65.8.27 දින හෝ ඊට පෙර කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂ (පාලන අංශය) කියා එවිය යුතුයි. ඉල්ලුම්කරුගේ අත් අකුරින්ම ඉල්ලුම් පත ලිවිය යුතුය.

2. **වැටුප් ක්‍රමය.**—මේ තනතුරට වර්ෂයකට රු. 750ක් පටන් ගෙන රු. 42 බැගින් වැඩිවී රුපියල් 1,296 දක්වා නගින වැටුප් ක්‍රමයක් හිමිවේ.

3. **බඳවා ගැනීමේ නියමයන් හා කොන්දේසි.**—තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරා ගනු ලබන ඉල්ලුම්කරුවන් එක් වසරක වැඩ බැලීමේ කාල පරිච්ඡේදයකට යටත්ව පත් කරනු ලැබේ. අභිනව තනතුරෙහි වැඩ බැලීමේ කාල සීමාවේදී සේවය අසතුටුදායක වූයේ නම් වැඩ බැලීමේ කාල පරිච්ඡේදයේ දී හෝ අවසානයේ දී හෝ ස්ථිර තනතුරුවලට ආපසු පත් කිරීමට ඉඩ තිබේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—

(1) අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ කා. කා. ස. කෙනෙකු ලෙස යටත් පිරිසෙයින් අවුරුදු පහක් සේවය කර තිබිය යුතුයි.

(2) රජයේ මුද්‍රණාලයෙහි පොත් බැඳීමේ පුහුණුව ලබා තිබිය යුතුයි.

5. මෙම තනතුර සඳහා එවන ඉල්ලුම් පත් හෝ වෙනයම් ලිපියක් හෝ මෙම දෙපාර්තමේන්තුවේ කිසි නිලධාරියෙකුගේ පුද්ගලික ලිපිනයට නොඑවිය යුතුය. සෑම ඉල්ලුම් පත්‍රයක්ම ඉල්ලුම්කරු සේවය කරන කාර්යාලයයේ/විද්‍යාලයේ ප්‍රධාන තැන මගින් එවිය යුතුය.

6. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පටන්ගැන්මේ ප්‍රසිද්ධ කර තිබෙන රජයේ සේවයේ තනතුරුවලට පත් කිරීම සම්බන්ධයෙන් දෙන සාමාන්‍ය කොන්දේසිද බලනු මැනවි.

7. මුද්‍රිත ඉල්ලුම් පත් නොමැත. මෙහි පහත දී තිබෙන ආදර්ශ ඉල්ලුම් පත්‍රය පිටපත් කර ගත යුතුය.

8. ඉල්ලුම් පත් ලැබුන බව දන්වනු ලැබේ. ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනයට පසු සතියක් ඇතුලත ඉල්ලුම් පත්‍රය ලැබුණු බව හැඟවීමේ ලිපියක් නොලැබුනහොත් පාලන අංශයේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත ඒ බව වහාම දැන්විය යුතුය. මේ විධි විධාන අනුව ක්‍රියා නොකළහොත් සළකා බැලීම සඳහා තිබෙන අයිතිවාසිකම්වලට ඉල්ලුම්කරු අහිමිවෙනවා ඇත.

සෝමපාල ගුණධීර,
අධ්‍යාපන අධ්‍යක්ෂ වෙනුවට.

අංකය පා.ශා.ඊ. (ඒ.බී.සී) 4085.
1965 අගෝස්තු 2 වැනි දින,
කොළඹ 2, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :———.
2. ලිපිනය :———.
3. 65.8.27 වන දිනට නිවැරදි වයස : අවුරුදු ——, මාස ——.
4. අධ්‍යාපන සුදුසුකම් :———.
5. පොත් බැඳීම පිළිබඳ ලබා ඇති පුහුණුව :———.
6. දැනට කරන රක්ෂාව (සේවය කරන ස්ථානය, තනතුර, එම තනතුරට බැඳුණු දිනය, ආදි විස්තර සහිතව) :———.
7. වෙනත් විස්තර :———.

මා විසින් මෙම ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් කරන්නට යෙදුන විස්තර සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි. මේ ඉල්ලුම් පත්‍රයෙහි යම් කිසි අසත්‍ය හෝ වැරදි දෙයක් ලියා තිබෙන බව තෝරීමට කලින් අනාවරණය වුවහොත්, මා එයින්ම නුසුදුසු වීමට පැමිණෙනවාත් හැර තෝරීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොලබා මා රාජකාරියෙන් පහ කිරීමට යටත් වන බව දනිමි.

———,
අත්සන.

දිනය :———.

8–133—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ධීවර සංස්ථාව

සංස්ථා සේවයේ පහත සඳහන් ශ්‍රේණිවලට පත්වීම් සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. සියලුම අයදුම්පත් 1964 නොවැම්බර් 6 වැනි දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ඇති ආකෘතිය අනුව පිළියෙල කළ යුතුය. අයදුම්පත් මෙම දැන්වීමේ අවශ්‍යතාවයනට හා 1964 නොවැම්බර් මස 6 වැනි දින ආණ්ඩුවේ ගැසට් පත්‍රයේම පලකර ඇති සංස්ථා සේවයේ සියලුම තනතුරුවලට අදාල පොදු කොන්දේසිවලට අනුකූලවිය යුතුයි. සියලුම අයදුම්පත් කොළඹ 3, ගාලු මුවදෙර, තැ. පෙ. 258 ලංකා ධීවර සංස්ථාවේ ලේකම් වෙත 1965 අගෝස්තු 21 දිනට හෝ ඊට පෙර ලැබෙනසේ ඉදිරිපත් කළ යුතුය.

2. අධ්‍යක්ෂ මණ්ඩලයේ තනි අභිමතය පරිදි සුදුසු අයදුම්කරුවන් ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්දට සරිලනසේ වැටුප් ක්‍රමයේ පියවරක තැබිය හැක.

3. **(I) ඉංජිනේරුවරු, කළමනාකරුවෝ සහ ගණකාධිකාරිවරු**

I ශ්‍රේණිය—මසකට රුපියල් 1,500—50/10 — 2,000

**අඩුම සුදුසුකම්**

සම්පූර්ණ වෘත්තිය සුදුසුකම් සහ සුදුසුකම් ලැබුවාට පසු විධායක තනතුරක හෝ සමාන තනතුරක අවුරුදු 9ක පළපුරුද්දක්

හෝ

පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ සමාන සුදුසුකමක් සහ අවුරුදු 10ක විධායක පළපුරුද්දක්

II ශ්‍රේණිය — මසකට රුපියල් 1,250 — 50/10 — 1,750

**අඩුම සුදුසුකම්**

සම්පූර්ණ වෘත්තිය සුදුසුකමක් සහ සුදුසුකම් ලැබුවාට පසු අවුරුදු 6ක පළපුරුද්දක්

හෝ

පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ සමාන සුදුසුකමක් සහ අවුරුදු 7ක විධායක පළපුරුද්දක්.

**විශේෂ සුදුසුකම් :—**

**ඉංජිනේරුවරු**

(අ) නැවේ යන්ත්‍ර හා නැව්බඳ අලුත්වැඩියා කිරීම සහ නඩත්තු කිරීමේ පළපුරුද්දක්

හෝ

(ආ) වරාය හා වෙරළාසන්න ගොඩනැගිලි සැලසුම් කිරීම සහ නිර්මානය කිරීමේ පළපුරුද්දක් සහ ටෙන්ඩර් ලියකියවිලි පිළියෙල කිරීමේ සහ කොන්ත්‍රාත් වැඩ පිළියෙල කිරීමේ සහ කොන්ත්‍රාත් වැඩ පරිපාලනය කිරීමේ පළපුරුද්දක්

හෝ

(ඇ) විශාල විදුලිය යන්ත්‍ර, ඩීසල් විදුලි යන්ත්‍ර හෝ ශීතකරන උපකරණ නඩත්තු කිරීමේ පළපුරුද්දක් තිබිය යුතුය.

**කළමනාකරුවෝ**

මාළු සම්බන්ධව ලෝක වෙළඳ පොලවල් ගැන දැනීමක් තිබිය යුතුය. මාළු අපනයනය කිරීමේ පළපුරුද්දක් තිබීම අතිරේක සුදුසුකමක් වනු ඇත.

3. **(II) ඉංජිනේරුවරු, කළමනාකරුවෝ, ආර්ථශාස්ත්‍රඥවරු සහ ගණකාධිකාරිවරු.**

III ශ්‍රේණිය මසකට රු. 1,000 — 50/10 — 1,500

**අඩුම සුදුසුකම්**

සම්පූර්ණ වෘත්තිය සුදුසුකම් සහ සුදුසුකම් ලැබුවාට පසු අවුරුද්දක පළපුරුද්දක්

හෝ

පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ සමාන සුදුසුකමක් සහ අවුරුදු 5ක විධායක පළපුරුද්දක්

හෝ

සාමාන්‍ය කලා හෝ විද්‍යා යෝග්‍යතා පරීක්ෂණය හෝ සමාන සුදුසුකමක් සහ අවුරුදු 5ක විධායක පළපුරුද්දක් සහිත අවුරුදු 10ක පළපුරුද්දක්

හෝ

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ සමාන සුදුසුකමක් සහ අවුරුදු 10ක විධායක පළපුරුද්දක් ඇතුළත් අවුරුදු 15ක පළපුරුද්දක් තිබිය යුතුය.

**විශේෂ සුදුසුකම් :—**

**ඉංජිනේරුවරු**

ඉංජිනේරුවරු සඳහා 3(1) ඡේදයේ දක්වා ඇති විශේෂ සුදුසුකම් තිබිය යුතුය.

**කළමනාකරුවෝ**

නැව් කුලියට ගැනීමද ඇතුළුව නැව් ප්‍රවාහනයේ සියලුම අංශයන් ගැන පුළුල් පළපුරුද්දක් තිබිය යුතුය. වාහන ගාස්තු ප්‍රමාණය වරාය බදු ගැන පළපුරුද්දක් තිබිය යුතු අතර බඩු ගෙන්වීමේ පාලනය සහ වර්ගු නිර්මාණයන් ගැන මනා දැනීමක් තිබිය යුතුය. නැව් බඩු සම්බන්ධයෙන් රේගුවේදී ක්‍රියා කිරීමේ පළපුරුද්ද අමතර සුදුසුකමක් වනු ඇත.

**අර්ථශාස්ත්‍රඥවරු**

පිළිගත් විශ්ව විද්‍යාලයක ගෞරව උපාධියක් සහ සුදුසු පළපුරුද්ද තිබිය යුතුය.

**(III) සහකාර ඉංජිනේරුවරු, සහකාර කළමනාකාරවරු සහ අර්ථශාස්ත්‍රඥවරු**

IV ශ්‍රේණිය මසකට රුපියල් 720 — 40/7 — 50/5 — 1,250

**අඩුම සුදුසුකම්**

පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් හෝ සමාන සුදුසුකමක් සහ අවුරුදු 3ක විධායක පළපුරුද්දක් හෝ

සාමාන්‍ය කලා හෝ විද්‍යා යෝග්‍යතා පරීක්ෂණය හෝ සමාන සුදුසුකමක් සහ අවුරුදු 5ක පරිපාලනමය පළපුරුද්දක් ඇතුළත් අවුරුදු 6ක පළපුරුද්දක්

හෝ

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ සමාන සුදුසුකමක් සහ අවුරුදු 5ක පරිපාලනමය පළපුරුද්දක් ඇතුළත් අවුරුදු 12ක පළපුරුද්දක් තිබිය යුතුය.

විශේෂ සුදුසුකම් :—

සහකාර ඉංජිනේරුවරු

සාමාන්‍ය, සිවිල්, යාන්ත්‍රික, විදුලිය, ඉංජිනේරු වැඩ ගැන පළපුරුද්දක් තිබිය යුතුය.

සහකාර කළමනාකරුවෝ

කළමනාකරුවන් සඳහා 3(11) ඡේදයේ දක්වා ඇති විශේෂ සුදුසුකම් තිබිය යුතුය.

අර්ථශාස්ත්‍රඥ

අර්ථශාස්ත්‍රඥවරු සඳහා 3(11) ඡේදයේ දක්වා ඇති විශේෂ සුදුසුකම් තිබිය යුතුය.

(IV) සහකාර ඉංජිනේරුවරු

V ශ්‍රේණිය —මසකට රුපියල් 600 — 40/10 — 1,000

අඩුම සුදුසුකම්

පිළිගත් විශ්ව විද්‍යාලයක ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් හෝ සමාන සුදුසුකමක්.

(V) ගණකාධිකාරි පුහුණුවන්නන්—

අඩුම සුදුසුකම්

ගණිතය හෝ අර්ථශාස්ත්‍රය විෂයක් වශයෙන් යුතුව පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක්. මාස 18ක් පමණ වන පුහුණුවීමේ කාලය තුළදී තෝරා ගත් අපේක්ෂකයන්ට මසකට රු. 500ක පුහුණුවීමේ දීමනාවක් ගෙවනවා ඇත. පුහුණුවීමේ පාඨමාලාව සාර්ථක ලෙස අවසන් කරන්නන් සංස්ථා සේවයේ මසකට රුපියල් 600 — 40/10 —1,000 වන වැටුප් පරිමාණය අයත් V වන ශ්‍රේණියට පත්කරනවා ඇත. තෝරා ගත් අපේක්ෂකයන් විසින් නියමිත පුහුණුවීමේ පාඨමාලාව උනන්දුවෙන් හා ලැදිකමකින් හදාරන වගටත්, සංස්ථා සේවයේ V ශ්‍රේණියට පත්වූවායින් පසු නියමිත කාලසීමාවක් සංස්ථාව යටතේ සේවය කරනවගටත්, නියමිත මුදලක පොරොන්දු පත්‍රයකට හා ඇපකරුවන් දෙදෙනෙකු සමග ගිවිසුමකට අත්සන් තැබියයුතුය.

(VI) වැඩ මුලික

VI ශ්‍රේණිය මසකට රුපියල් 675 — 25/5 × 30/5 — 950.

අඩුම සුදුසුකම්

ඒ.ඇම්.අයි.සී.ඊ. හෝ ඒ.ඇම්.අයි. (යාන්ත්‍රික) ඉංජිනේරු හෝ ඒ.ඇම්.අයි.ඊ.ඊ., (පළමුවැනි කොටස) හෝ සමාන සුදුසුකම් සමග සුදුසුකම් ලැබීමෙන් පසු අවුරුදු 2ක පළපුරුද්දක්

නැතහොත්

ලංකා කාර්මික විද්‍යාලයේ කනිෂ්ඨ කාර්මික නිලධාරීන්ගේ සහතිකය හෝ සමාන සුදුසුකම් සමග අවුරුදු 6ක පළපුරුද්දක්

නැතහොත්

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හා සමාන සුදුසුකම් සමග අවුරුදු 4ක ආධුනිකත්වයක් හා අවුරුදු 8ක පරිපාලක පළපුරුද්දක්

නැතහොත්

8 අවුරුද්දක පරිපාලක පළපුරුද්දක් ඇතුළත් 18 අවුරුද්දක පළපුරුද්දක්.

විශේෂ සුදුසුකම් :—

විදුලි කාර්මික

(අ) විශාල කාර්මික යන්ත්‍රාගාර, ගෘහ්‍ය ස්ථාපනයන් හා අනෙකුත් සියලුම වර්ගයේ විදුලිබල උපකරන අයි.ඊ.ඊ. නීතිරීති අනුව වයර් කිරීමේ පළපුරුද්ද හා අයි.ඊ.ඊ. නීතිරීති අනුව විදුලිබල උපකරන, ස්ථාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාම් පළපුරුද්ද, තිබිය යුතුය.

අයි.ඊ.ඊ. වයර් කිරීම සම්බන්ධ නීතිරීති සම්බන්ධව හා උස් හා පහත් සම්පේක්ෂණක්‍රම හා සම්බන්ධ කටයුතු වලදී ආරක්ෂක විධිවිධාන සම්බන්ධව දැනීමක් තිබිය යුතුය.

(ආ) ඒ.සී. හා ඩී.සී. මෝටර් ස්ථාපනය කිරීම ක්‍රියාත්මක කිරීම පවත්වාගෙන යාම හා අලුත්වැඩියා කිරීම සම්බන්ධව පළපුරුද්දක් හා නොයෙක් විදුලිබල යන්ත්‍ර සම්බන්ධයෙන් අනුගමනය කරන සාමාන්‍ය එතීම් ක්‍රම පිළිබඳ හොඳ පළපුරුද්දක් තිබිය යුතුය.

(ඇ) ට්‍රක් රථ, නානා වර්ගයේ දෙඹකර, මෝටර් රථවාහන ආදියෙහි විදුලි උපකරණ පවත්වාගෙන යාම හා අලුත් වැඩියා කිරීම පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතුය.

(ඈ) බැටරි චාජ් කිරීමේ උපකරණ ක්‍රියාත්මක කිරීමේ හා පවත්වාගෙන යාමේ හා ඊට අදාල කටයුතු සම්බන්ධ පළපුරුද්ද.

(ඉ) වෝල්ට් මීටර, ඇම්ටර් මීටර, ගෘහ්‍ය සේවා මීටර ආදී විදුලිබල මැනීමේ උපකරණ ස්ථාපනය කිරීම හා අලුත්වැඩියා කිරීම පිළිබඳ පළපුරුද්දක්.

(ඊ) ගුවන් දුරකථන උපකරන, අන්තර් පණිවුඩ හුවමාරු කිරීමේ උපකරන ආදිය ස්ථාපනය කිරීම හා අලුත්වැඩියා කිරීමේ පළපුරුද්ද.

යාන්ත්‍රික (යන්ත්‍රහල)

යන්ත්‍ර කම්හල් වැඩ පිළිබඳ හා ආයුධ භාවිතය පිළිබඳ පළපුරුද්දක් හා වේගය අඩුකිරීම හා පෝෂණයන්, හා සම්බන්ධ ආයුධ ගැන හොඳ දැනීමක් තිබිය යුතුය.

යාන්ත්‍රික (ඩීසල් හල්)

(අ) පැට්රෝල් හා ඩීසල් එන්ජින් අළුතින් ස්ථාපනය කිරීම, එන්ජින් පරීක්ෂා කිරීම, ඉන්ජෙක්ටර් හා ඉන්ධන හල ආදියෙහි පරීක්ෂණ වැඩ පිළිබඳ පළපුරුද්දක්, හා

(ආ) කොන්ක්‍රීට් මිශ්‍ර කරනයන්, නල හා ගොඩනැගීමේ උපකරණ පිළිබඳ පළපුරුද්දක්, හා

(ඇ) ජංගම දෙඹකර ආදියෙහි විදුලිබල ස්ථාපන වැඩ හා අලුත් වැඩියා කිරීම පිළිබඳ පළපුරුද්දක් තිබිය යුතුය.

3. (VII) වැඩ මුලික (පුහුණුවීමේ)

VIII ශ්‍රේණිය — මසකට රු. 350—$\frac{15}{5}$ × $\frac{20}{5}$—525

අඩුම සුදුසුකම්

ලංකා කාර්මික විද්‍යාලයයේ ජේ. ටී. ඕ. සහතික පත්‍රය හෝ සමාන සුදුසුකමක් සහ අවුරුද්දක පළපුරුද්දක් තිබිය යුතුයි.

නැතහොත්

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ සමාන සුදුසුකමක් සහ අවුරුදු 4ක ආධුනික පුහුණුවක් ලබා තිබිය යුතුයි.

නැතහොත්

අවුරුදු 3ක පරිපාලනමය තත්ත්වයේ පළපුරුද්දක් ඇතුළත් අවුරුදු 12ක පළපුරුද්දක් තිබිය යුතුයි.

IX ශ්‍රේණිය — මසකට රු. 300—$\frac{10}{10}$—400

අඩුම සුදුසුකම්

(අ) ලංකා කාර්මික විද්‍යාලයයේ කනිෂ්ඨ නිලධාරීන්ගේ සහතිකය (විදුලි බල, සිවිල් හෝ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ) හෝ සමාන සුදුසුකමක් සහ,

(ආ) ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනය වනවිට වැඩිම වයස අවුරුදු 28 කට වැඩි නොවිය යුතුයි.

වැඩ මුලික පුහුණුවන්නන් ලෙස තෝරා ගන්නා අපේක්ෂකයින් අවුරුදු 2–3ක් කාලයක පුහුණුවීමේ පාඨමාලාවක් හැදෑරීම අපේක්ෂා කෙරේ. නියමිත පාඨමාලාව උනන්දුවෙන් හා ලැදිකමකින් හදාරන බවටත්, පාඨමාලාව හැදෑරීමෙන් පසු සංස්ථාව යටතේ සේවයට බැඳුණු දින සිට නියමිත කාල සීමාවක් ගත වනතුරු සංස්ථාව යටතේ සේවය කරන බවටත් නියමිත මුදලක පොරොන්දු පත්‍රයකට හා සාක්ෂිකරුවන් දෙදෙනෙකු සමග ගිවිසුම් පත්‍රයකට අත්සන් කළ යුතුය.

3. (VIII) සරප්වරු

(VII) වන ශ්‍රේණිය මසකට රු. 500—$\frac{20}{5}$ × $\frac{25}{5}$—725

අඩුම සුදුසුකම්

ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ සමාන සුදුසුකමක් සහ රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක මුදල් පරිහරණය කිරීම හා අවශ්‍ය සටහන් තබාගැනීම පිළිබඳ අවුරුදු 8 පළපුරුද්දක්

නැතහොත්

අටවන පන්තියේ සාමාර්ථයක් හෝ කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය හෝ සමාන සුදුසුකමක් සහ රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක මුදල් පරිහරණය කිරීම හා අවශ්‍ය සටහන් තබාගැනීම පිළිබඳ අවුරුදු 13ක පළපුරුද්දක්

නැතහොත්

රජයේ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් ආයතනයක මුදල් පරිහරණය කිරීම හා අවශ්‍ය සටහන් තබාගැනීම පිළිබඳව අවුරුදු 16ක පළපුරුද්දක් (අධ්‍යාපන සුදුසුකම් නොතකා)

සරප්වරුන් වශයෙන් තෝරාගනු ලබන අයදුම්කරුවන් පහත දැක්වෙන ක්‍රම දෙකෙන් එක් ක්‍රමයක් අනුව ඇප තැබිය යුතුය.

(අ) මුදලින් රු. 10,000ක ඇපයක් හෝ,

(ආ) රු. 10,000ක් වටිනා නිශ්චල දේපල ඇපයක් සහ මුදලින් රු. 5,000ක්

5. පොදු :—

පළපුරුදුකම් ඇති අපේක්ෂකයින් විසින් ඒ බවට සෑහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. එක ශ්‍රේණියකට හෝ තනතුරකට වැඩි තනතුරුවලට හා ශ්‍රේණිවලට ඉල්ලුම් කරන්නෙහි නම් ඒ සඳහා වෙන වෙනම ඉල්ලුම් පත් එවිය යුතුය. ඉල්ලුම් කරන ශ්‍රේණිය හෝ තනතුර ඉල්ලුම් පත් බහා එවන කවරයේ වම්පස උඩ කෙලවරේ පැහැදිලිව සඳහන් කළ යුතුය.

ලේකම්,
ලංකා ධීවර සංස්ථාව.

ගාලු මුවදෙර,
තැ.පෙ. 258,
කොළඹ 3,
1965 ජූලි 27.

8–175—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

භාණ්ඩාගාරයේ අංකය : 1/83/13/1 (ජී).

## ස්ථාන මාරුව සහිත ලසු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලසු ලේඛකයන් සඳහා වූ කාර්යක්ෂමතා කඩඉම් (ඉංග්‍රීසි) විභාගය—1964 ඔක්තෝබර්

අංක 14,381 හා 1965.4.23 වැනි දින දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයට අමතරවයි. ස්ථාන මාරුව සහිත ලසු ලේඛක සේවයේ පහළ ශ්‍රේණියට අයත් ලසු ලේඛකයන් ගේ වාර්ෂික වේතනය රුපියල් 2,940 ක් වීමට පෙර ඇති කාර්යක්ෂමතා කඩ ඉමෙන් උසස් කිරීම සඳහා සුදුසුකම් ලැබීමේ පරීක්ෂණයේ දී පහත සඳහන් අපේක්ෂකයා ද, සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුලත් කර ගැනීම සඳහා දැන් සුදුසුකම් ලබා ඇත.

| නම | | දෙපාර්තමේන්තුව |
|---|---|---|
| ප්‍රනාන්දු කු. ජෝ. ලෙ. | ... | මහා භාණ්ඩාගාරය. |

(3) සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළුවීම පිණිස ඉහත සඳහන් කායයික්ෂමතා කඩඉම් පරීක්ෂණයේ දී සුදුසුකම් ලබා ඇති නිලධාරීන් ද එම පරීක්ෂණයට ඇතුළුවීම පිණිස මීට කලින් සුදුසුකම් ලබා ඇති අය ද, මීළඟ සම්මේලන වාර්තා කිරීමේ පරීක්ෂණයට ඇතුළුවීම සඳහා තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයාගේ මාර්ගයෙන් විභාග කොමසාරිස් වෙත ලියා පදිංචි කළ තැපෑලෙන් යැවෙන ලිපියකින් වහාම ඉල්ලා සිටිය යුතුයි.

එ. ඊ. කුරේ,
භාණ්ඩාගාර අතිරේක නියෝජ්‍ය ලේකම්.

1965 ජූලි මස 29 වැනිදා,
කොළඹ-මහා භාණ්ඩාගාරයේ දී ය.

8–215/1—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

භාණ්ඩාගාරයේ අංකය : 1/60/12 (ජී).

## යතුරු ලේඛක සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගය 1964 මැයි

1964 මැයි මස පවත්වන ලද යතුරු ලේඛක සේවයට බඳවා ගැනීමේ (සිංහල) විභාගයේ ප්‍රතිඵල අනුව පහත සඳහන් අපේක්ෂකයන් යතුරු ලේඛක සේවයට පත්කිරීමට තෝරාගෙන තිබෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| නම | | ලිපිනය |
|---|---|---|
| ද සිල්වා වැ. ලී. | ... | ගොරකගොඩ, බලපිටිය. |
| විමලසේන හො. ග. | ... | රාජ්‍ය භාෂා අංශය, පෝස්ට්මාස්ටර් ජනරාල් කාර්යාලය, කොළඹ—1. |

එ. ඊ. කුරේ,
භාණ්ඩාගාරයේ අතිරේක නියෝජ්‍ය ලේකම්.

1965 ජූලි මස 29 වැනිදා,
කොළඹ—මහා භාණ්ඩාගාරයේ දී ය.

8–215/2—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය විද්‍යාලයේ ශිෂ්‍යත්ව සඳහා පැවැත්වෙන පරීක්ෂණය—1965

පහත සඳහන් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම් වස් 1965 සැප්තැම්බර් 8 හා 9 දිනයන් හි රාජකීය විද්‍යාලයේ දී පරීක්ෂණයක් පවත්වනු ලැබේ.

ලෝරන්ස් අනුස්මරණ ශිෂ්‍යත්ව එකක්—අගය වර්ෂයකට රු. 200 බැගින් දෙවර්ෂයකට.

රූපසිංහ අනුස්මරණ ශිෂ්‍යත්ව එකක්—අගය වර්ෂයකට රු. 125 බැගින් දෙවර්ෂයකට.

සිසිල් පෙරේරා අනුස්මරණ ශිෂ්‍යත්ව එකක්—වර්ෂයකට රු. 200 බැගින් දෙවර්ෂයකට.

මේ ශිෂ්‍යත්ව සඳහා ඉදිරිපත්වන ශිෂ්‍යයන් 1.1.66 වන දිනට වයස අවුරුදු 17 1/2 නොයික්මවූ, යටත් පිරිසෙයින් අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) පන්තියේ අවසාන වර්ෂයේ ඉගෙනීම ලබන පිරිමි ළමුන් විය යුතුය.

තම දෙමව්පියන්ගේ මුලු වාර්ෂික ආදායම රු. 7,500 ඉක්මවූ අයට ලෝරන්ස් ශිෂ්‍යත්වය හෝ රූපසිංහ ශිෂ්‍යත්වය හිමි නොවේ. සිසිල් පෙරේරා ශිෂ්‍යත්වය පිළිබඳ ආදායම් සීමාවක් නොමැත.

ඉහත සඳහන් සුදුසුකම් ඇති අය විසින් වැඩි දුර විස්තර හා ඉල්ලුම් පත්‍ර රාජකීය විද්‍යාලයේ රේජිස්ට්‍රාර් තැනගෙන් ඉල්ලුම් කළ යුතුය. ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අන්තිම දිනය 1965 අගෝස්තු 21 වැනි සෙනසුරාදා..

ඩබ්ලි කේ. ජී. ද සිල්වා,
විද්‍යාලයාධිපති,
රාජකීය විද්‍යාලය.

රාජකීය විද්‍යාලය,
කොළඹ 7.
6.8.65.

8–59—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් හා ආරෝග්‍යශාලා ලේකම්වරුන් සඳහා පැවැත්වෙන 1965 ඔක්තෝබර් මස අර්ධ වාර්ෂික විභාගය**

1965 ඔක්තෝබර් මස මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින වෛද්‍ය නිලධාරීන්, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් හා ආරෝග්‍ය ශාලා ලේකම්වරුන් සඳහා අර්ධ වාර්ෂික විභාග පැවැත්වෙන බව මෙයින් නිවේදනය කරමි.

1965 ඔක්තෝබර් 15 වැනි දින හා 16 වැනි දින—

රාජ්‍ය සේවා කොමිෂන් සභා රෙගුලාසි සහ පාලන නීති සංග්‍රහය.

ආරෝග්‍යශාලා හා බෙහෙත් හල් පරිපාලනය හා ගණන් පත්‍රය.

2. සිංහල/දෙමළ වාචික පරීක්ෂණය, ලිවීමේ පරීක්ෂණය පවත්වන දිනට ප්‍රථම දිනයේ දී පවත්වනු ලැබේ.

3. මෙට විභාගයට ඇතුළත්වීම සඳහා ඉල්ලුම්පත් විමධ්‍යගත අංශ ප්‍රධානීන්ගෙන් ලබාගතහැකි ආකෘති පත්‍ර ප්‍රකාර විය යුතුයි.

4. මෙම විභාගය පවත්වනු ලබන්නේ විභාග කොමසාරිස් විසින් ය. ඔහු විසින් මෙම විභාගය පවත්වනු සඳහා පනවනු ලබන නීති, රීති සම්බන්ධයෙන් ආධුනිකයන් යටත් විය යුතුයි.

5. ඉල්ලුම් පත් තම කොට්ඨාශ භාර සෞඛ්‍ය සේවා අධිකාරීන් මගින් කොළඹ මැලේ වීදියේ, විභාග කොමසාරිස් තුමා වෙත 1965 සැප්තැම්බර් 8 වැනි දිනට මත්තෙන් යැවිය යුතුය. සෞඛ්‍ය සේවා අධිකාරීන් විසින් එම ඉල්ලුම් පත් 1965 සැප්තැම්බර් 8 වැනි දිනට ප්‍රථමයෙන් විභාග කොමසාරිස්තුමා වෙත ලැබීමට සලස්වනු පිණිස 1965 සැප්තැම්බර් 4 වැනි දිනට ප්‍රථමයෙන් සෑම ආධුනිකයකු විසින් ම ඔවුන්ගේ ඉල්ලුම් පත් සෞඛ්‍ය සේවා අධිකාරීන් වෙත යැවිය යුතු බව දැනගත යුතුය.

6. 1965 සැප්තැම්බර් 4 වැනි දිනට පසු ලැබෙන සෑම ඉල්ලුම් පතක් ම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

වී. ටී. එච්. ගුණරත්න,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

1965 ජූලි මස 30 වැනි දින,
කොළඹ, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයේ දීය.

8–131—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## විභාග දෙපාර්තමේන්තුව

### ගුරු විද්‍යාල ප්‍රවේශ විභාගය (විශේෂ පාඨ මාලාව) 1965

### අංක 14,386 සහ 1965.4.30 දරණ ගැසට් නිවේදනයේ අංක 9 ඡේදයේ සංශෝධනයකි

9 (4) පිළිගත් පෞද්ගලික පාසල්වල යෝග්‍ය ගුරු මණ්ඩලයකට අයත් වූ ද තම පත්වීම් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ අධ්‍යාපන නිලධාරි විසින් අනුමත කර ඇත්තාවූ ද ගුරුවරු ද 1965.4.30 හා අංක 14,386 දරණ රජයේ ගැසට් නිවේදනයේ 9 වැනි ඡේදය අනුව "ගුරුවරුන්" වශයෙන් සලකනු ලැබෙත්. මේ සඳහා පෞද්ගලික පාසල් යනුවෙන් ගැනෙන්නේ :—

(අ) 1951 දී ගාස්තු අය කරන පාසල් බවට පත් වූ උපකෘත පාඨශාලා.

(ආ) 1960.12.1 දී ගාස්තු අය නොකරන පෞද්ගලික පාසල් බවට පත් වූ I වැනි ශ්‍රේණියේ හෝ II වැනි ශ්‍රේණියේ පාඨශාලා.

පුහුණු පාඨමාලාව අවසානයේ දී ඔවුන් සේවය කළ පාසල් හිමි පත්වීම් ලබන බවටත්, පුහුණුව ලබන කාලය තුළ ඔවුන්ගේ නඩත්තුව පිණිස වේතනයක් හෝ දීමනාවක් ගෙවනු ලබන බවටත් සාක්ෂි සම්මුඛ පරීක්ෂණයේ දී මෙම ගණයේ ගුරුවරුන් විසින් ඉදිරිපත් කළ යුතු යි.

මෙම ගණයට අයත්වන ගුරුවරුන්, මෙම විභාගය වෙනුවෙන් දැනටමත් ඉල්ලුම් පත්‍ර යවා ඇත්නම්, ඔවුන්ද "ගුරුවරුන්" වශයෙන් සලකන මෙන් ඉල්ලීමක් ලියා පදිංචි තැපෑලෙන් විභාග කොමසාරිස් තුමා වෙත යැවිය යුතු යි. අනිකුත් අය 1965.8.16 වැනි දාට ප්‍රථම විභාග කොමසාරිස් තුමාට ලැබෙන පරිදි ඉල්ලුම් පත්‍ර ලියා පදිංචි කළ තැපෑලෙන් යැවිය යුතු යි. මුල් ගැසට් නිවේදනයේ ඇති ආකෘති පත්‍රයෙහි ඉල්ලුම් පත්‍ර එවිය යුතු යි.

එච්. එල්. විමලසූරිය,
වැඩ බලන විභාග කොමසාරිස්.

1965 අගෝස්තු මස 2 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

8–225—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 218 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැ.පෙ. 500, කොළඹ 1) 1965 ඔක්තෝබර් 1 සිට 1966 සැප්තැම්බර් 30 තෙක් පහත සඳහන් සේවයන් සඳහා ඒ ඒ දිනයන්හි පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| | සේවයන් | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|---|
| 1. | මෙරට සෑදූ ගඩොල් සැපයීම ... | ... 1965.9.7 |
| 2. | මෙරට සෑදූ මැන්ගලෝර් මෝස්තරයේ උළු සැපයීම | ... 1965.9.7 |
| 3. | මෙරට සෑදූ කැන්වස් සපත්තු සැපයීම | ... 1965.8.31 |
| 4. | මෙරට සෑදූ කපු බැනියන් සැපයීම ... | ... 1965.8.31 |
| 5. | ඇළුමිනියම් භාණ්ඩ සැපයීම ... | ... 1965.8.31 |
| 6. | විෂබීජ නාශක දියර සැපයීම ... | ... 1965.9.7 |

ගඩොල් සහ උළු සැපයීම සම්බන්ධයෙන්, ඒ ඒ ටෙන්ඩර්කරුවන් විසින් කොළඹ 7, බුලර්ස් පාරේ, අංක 363 දරණ "විද්‍යාත්මක හා කාර්මික පර්යේෂණ ලංකා ආයතනයෙන්" තමන්ගේ සැම්පල් පරීක්ෂා කරවා ගෙන ඒ සඳහා ලැබෙන සහතික පත් ස්වකීය ටෙන්ඩර් සමග ඉදිරිපත් කළ යුතුය.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහතකී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාර්සන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුය.

එක් එක් සේවය සම්බන්ධයෙන් රු. 50 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් මෙහි ඉදිරිපත් කළ විට ඉහත සඳහන් දිනවලට කලින් දින දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

එස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරි.

1965 අගෝස්තු 6 දින,
කොළඹ දීය.

8–194—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගරයේ 218 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 500, කොළඹ 1,) පින්තල අත්සීනු සැපයීම සඳහා 1965 අගෝස්තු 31 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ, සිත්තම්පලම් ගාඩිනර් මාවතේ, ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50 ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1965 අගෝස්තු 30 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරි.

1965 අගෝස්තු 6 වැනි දින,
කොළඹ දී ය.

8–195—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

(1) කඩදාසි ඇමුණුම් කටු සහ ඇල්පෙනෙත්ති සැපයීම.

(2) පැන්සල් සැපයීම.

ඉහත සඳහන් සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය 1965.9.6 නොව, 1965.9.7 බව ටෙන්ඩර් කිරීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් කරුණාවෙන් සලකත්වා.

ඇස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරි.

1965. 8. 6
කොළඹ දී ය.

8–191—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### වූල් කොට සහ දිග මේස් සැපයීම

ඉහත සඳහන් සැපයීම් සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය 1965. 8. 17 නොව 1965. 8. 24 බව ටෙන්ඩර් කිරීමට බලාපොරොත්තු වන ටෙන්ඩර්කරුවන් කරුණාවෙන් සලකත්වා.

ඇස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරි.

1965 අගෝස්තු 6,
කොළඹ.

8–189—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා නාවික හමුදාව

1965.10.1 දින සිට 1966.9.30 දින තෙක් කාලසීමාව තුල කොළඹ වරායෙහි නැංගුරම්ලන රාජකීය ලංකා නාවික හමුදා යාත්‍රාවලින් කසල ඉවත් කිරීමේ කාර්‍යය සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි සහ වැඩි විස්තර මෙහි පහත අත්සන් කරන මගෙන් දැනගත හැක.

3. ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරන්නේ ටෙන්ඩර් කොන්දේසි අනුව ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම දරන්නවුන් වෙත පමණි.

4. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1965.8.30 දින පස්වරු 3 තෙක් නිකුත් කෙරේ.

5. ටෙන්ඩර් 1965.8.31 දින පෙ. ව. 9.30 ට පෙර නාවික හමුදාධිපති වෙත ලැබිය යුතුය.

6. ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිකුත් කිරීමට පෙරාතුව එක් එක් ටෙන්ඩරිය සඳහා රුපියල් 50ක් බැගින් රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානයෙහි තැන්පත් කළ යුතුයි. කොන්ත්‍රාත්තුව අත්සන් කළ විට තැන්පත් කළ සියළුම මුදල් ආපසු ගෙවනු ලැබේ.

රාජන් කදිර්ගාමර්,
කොමදෝරු,
වැඩ බලන නාවික හමුදාධිපති.

රාජකීය ලංකා නාවික හමුදා මූලස්ථානය,
තැපැල් පෙට්ටිය අංක 593,
කොළඹ 1.

8–107—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## රාජකීය ලංකා ගුවන් හමුදාව

කොළඹ, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ගුවන් හමුදාධිපති විසින් රාජකීය ලංකා ගුවන් හමුදාවට අයත් කඳවුරු වලට 1965/66 මුදල් වර්ෂය තුළ පහත සඳහන් සැපයීම් උදෙසා වර්ෂ 1965 අගෝස්තු මස 26 වෙනි දින පෙරවරු 10.00 දක්වා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

| සැපයීම | කඳවුර | | |
|---|---|---|---|
| | කටුනායක | දියතලාව | චීන වරාය |
| 1. කිරි ආහාර හා ගොවිද්‍රව්‍ය නිෂ්පාදන සැපයීම ... | — | — | එම |
| 2. පාන් පෙළ සැපයීම ... | — | එම | එම |
| 3. ස්වදේශීය උදසන ආහාර සැපයීම | — | එම | එම |
| 4. පොල් සැපයීම ... | එම | — | එම |
| 5. සිල්ලර සහ කුළුබඩු සැපයීම ... | — | එම | — |

2. ටෙන්ඩර් පත්‍ර ලබාගැනීම පිණිස කොළඹ ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුද මූලස්ථානයේ සිවිල් පාලක නිලධාරී සහ ගණකාධිකාරී තැන වෙත ඉහත සඳහන් එක් සැපයීමක් සඳහා රුපියල් හැත්තෑපහක (රු. 75.00) මුදලක් තැන්පත් කර රිසිට් පතක් ලබා ගත යුතුයි. වර්ෂ 1965 අගෝස්තු මස 25 වෙනි දින දහවල් 12.00 වන තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරණු ලැබේ.

3. සියළුම ටෙන්ඩර් පත් අනු පිටපතක් සමඟ මුද්‍රා තබන ලද කවරයක බහා එහි වම් පැත්තේ උඩ කෙළවරේ " රාජකීය ලංකා ගුවන් හමුදවට...... ..............................සැපයීම සඳහා 1965 අගෝස්තු මස 26 වෙනි දින වසනු ලබන ටෙන්ඩර් " යයි සඳහන් කර කොළඹ, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ, රාජකීය ලංකා ගුවන් හමුද මූලස්ථානයේ ගුවන් හමුදාධිපති වෙත එවිය යුතුයි.

4. පළමුවෙනි ඡෙදයේ සඳහන් කර ඇති වේලාවේ දී ටෙන්ඩර් පත් විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට පෙනී සිටීමට ඉඩ දෙනවා ඇත.

5. වැඩි විස්තර සඳහා කොළඹ 2, ශ්‍රීමත් චිත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුද මූලස්ථානයෙන් විමසන්න.

ඊ. ආර්. අමරසේකර,
එයාර් කොමදෝරු ගුවන් හමුදාධිපති.

8–187—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### අනුරාධපුර නව බන්ධනාගාර ගොඩනැගිලි ඉදිකිරීමට අවශ්‍ය ද්‍රව්‍ය සැපයීම

අනුරාධපුර නව බන්ධනාගාර ගොඩනැගිලි ඉදි කිරීමට අවශ්‍ය මෙහි පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා මෙහි පහත අත්සන් කරන නිලධාරියා විසින් 1965.8.30 වෙනි දින දහවල් 12 වනතෙක් ටෙන්ඩර් පත්‍ර බාර ගනු ලැබේ.

| | | |
|---|---|---|
| 1. | කළුගල් (රොක් මැටල්) අඟල් 2 | කියුබ් 8 යි |
| 2. | කළුගල් (රොක් මැටල්) අඟල් ¾ | කියුබ් 6 යි |
| 3. | කළුගල් (රොක් මැටල්) අඟල් 1 | කියුබ් 1 යි |
| 4. | ගඩොල් (සාමාන්‍ය ප්‍රමාණය) | 1,00,000 යි |
| 5. | කළුගල් අඟල් 6–9 | කියුබ් 50 යි |
| 6. | තම්බාපු හුණු බුසල් 600යි (බුසලක් රු. 42ට නොඅඩු) | |
| 7. | ගංගා වැලි | කියුබ් 60 යි |

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම අනු පිටපතක් සහිත විය යුතුයි. එක් එක් ද්‍රව්‍ය සඳහා ටෙන්ඩර් කරනු ලබන මිළ ගණන් ඒ ඒ ද්‍රව්‍ය වලට ඉදිරියෙන් ඉලක්කමෙන් මෙන්ම වචනයෙන් ද සඳහන් විය යුතුයි.

3. සෑම ටෙන්ඩරයක් සඳහාම රු. 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් කොළඹ බන්ධනාගාර කොමසාරිස්තුමාගේ කාර්යාලයේ හෝ කොළඹ හැර වෙන ඕනෑම කච්චේරියක තැන්පත් කළ යුතුය,

ටෙන්ඩර් ආකෘති පත්‍ර ටෙන්ඩර් කරුවන් විසින්ම සකස් කර ගත යුතුයි. ටෙන්ඩර් තැන්පත් මුදල සම්බන්ධයෙන් ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රයට අමුණා තිබිය යුතුය. එසේ නො එවන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

4. ඉහත සඳහන් ද්‍රව්‍ය අනුරාධපුර නව බන්ධනාගාර ගොඩනැගිලි ඉදිකරනු ලබන භූමි පෙදෙස වෙත සපයා ක්‍රමානුකූලව ගොඩගැසිය යුතුයි.

5. සියළුම ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව කවරයක දමා එය සීල් තබා කවරයේ වම් පස උඩ කෙළවරේ " ගොඩනැගිලි සඳහා ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩර් " යන්න ලියා ලියාපදිංචි තැපෑලෙන් අනුරාධපුර බන්ධනාගාරයේ සහකාර අධිකාරි, අනුරාධපුරය, වෙත එවිය යුතුය. එසේ නොහැකි නම් අනුරාධපුර බන්ධනාගාරයේ සහකාර අධිකාරි තුමාගේ කාර්යාලයේ මේ සඳහා තබා ඇති පෙට්ටියේ 1965.8.30 වැනි දින දහවල් 12ට පෙර බහාලිය යුතුය.

6. තෝරා ගත් ටෙන්ඩර් කරු වෙත අවශ්‍ය බඩු සපයන ලෙස දැනුම් දී දින 30ක් ඇතුළත ටෙන්ඩරයෙහි සඳහන් ද්‍රව්‍ය වලින් හරි අඩක් සැපයිය යුතු අතර තුන් මසක් ඇතුළතදී ඉතිරි කොටස සැපයිය යුතුය. එසේ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජ සන්තක කරනවාත් හැර ඔහුගේ නම රජයේ කොන්ත්‍රාත්තු කඩකරන්නන්ගේ නාම ලේඛනයට ද ඇතුලත් වන්නට ද ඉඩ තිබේ.

7. ටෙන්ඩර් කරුවන් ඔහුන් සැපයීමට බලාපොරොත්තුවන ගඩොල්, කළුගල්, හුණු ආදියේ ආදර්ශ (සැම්පල්) ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කරන අවස්ථාවේදීම ඉදිරිපත් කළ යුතුය. සැපයීමට බලාපොරොත්තු වන කළුගල් සම්බන්ධයෙන් ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගැනීමට ඇති නිසා ඒවා ඉස්තරම් වර්ගයේ විය යුතුය. එසේ නොතිබුනොත් එම ද්‍රව්‍ය ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

8. අනුරාධපුර බන්ධනාගාරයේ සහකාර අධිකාරිතුමා විසින් 1965.8.30 දින දහවල් 12.05 ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට අවසර දෙනු ලැබේ.

9. යම්කිසි ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීම හෝ ටෙන්ඩර් පත්‍රයක යම්කිසි කොටසක් පිළිගැනීමේ බලය සහ අයිතියද රජය සතුවේ.

සී. ටී. ජැන්ස්,
බන්ධනාගාර සහකාර අධිකාරි.

අනුරාධපුරය,
1965.7.30.

8–94—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## 1965/66 මුදල් වර්ෂය තුළ මහනුවර බෝගම්බර බන්ධනාගාරයට මාදම්පා වේවැල් සැපයුම

1965 ජූලි මස 23 වෙනි දින අංක 14,458 දරන රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද දැන්වීමට මෙයින් අවධානය යොමු කරවනු ලැබේ.

එම දැන්වීමේ 4 වන ඡෙදයේ, ටෙන්ඩර් පෝර්ම නිකුත් කරන අවසාන දිනය 1965 අගෝස්තු 12 වෙනි දින පස්වරු 4.30 දක්වා බවට සඳහන් විය යුතුය.

එසේම 2 වන ඡේදයේ (2) කොටසින් සඳහන් වී ඇති ගණකාධිකාරිවරයාගේ නම ඊ. ඇල්. ඩබ්ලිව්. දහනායක විය යුතු බවත් සියළුම ටෙන්ඩර්කරුවන් වෙත මෙයින් දන්වනු ලැබේ.

ඇෆ්. ඩී. ඇල්. රත්නායක,
බන්ධනාගාර කොමසාරිස්.

බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 9, 1965.7.31.

8-105—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## රේගු දෙපාර්තමේන්තුවේ පරණ පුවත්පත් විකිණීම

පරණ පුවත්පත් මිලදීගැනීම සඳහා මුද්‍රාතබන ලද මිල ගණන් කැඳවනු ලැබේ. රාත්තලකට ගෙවිය හැකි මිල ගණන් දක්විය යුතුයි. මුද්‍රා තබන ලද මිල ගණන් 1965 අගෝස්තු මස 13 වන දින ප.ව. 3ට හෝ ඊට පෙර කොළඹ, රේගුවේ, ප්‍රධාන ගණකාධිකාරි වෙත ඉදිරිපත් කළ යුතුයි.

එස්. සෝමාධිරාජා,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

1965 ජූලි මස 26 වැනි දින.
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේදීය.

8-109—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—යාපනය කොට්ඨාශය

දැන්වීමයි

1965 ජූලි මස 16 වැනි දින අංක 14,452 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ 885 වෙනි පිටුවේ පළවී ඇති "බඩු බාහිරාදිය ප්‍රවාහණය සඳහා ටෙන්ඩර් කැඳවීම—1964-66—යාපනේ කොට්ඨාශය" යන ශීර්ෂය "බඩුබාහිරාදිය ප්‍රවාහණය සඳහා ටෙන්ඩර් කැඳවීම—1965-67—යාපනේ කොට්ඨාශය" යනුවෙන් වෙනස් විය යුතුය.

ඇස්. රුසරත්නම්,
සෞඛ්‍ය සේවා අධිකාරි, යාපනය.

යාපනය, 1965.7.30
සෞඛ්‍ය සේවා අධිකාරි කායර්‍යාලය.

8-124—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව විකිණීම සඳහා ටෙන්ඩර්

ඌරුගොඩවත්ත දැව ගබඩාවේ තිබෙන ඝන අඩි 1,774.9 කින් සමන්විත ඉරූ දැව තොග 26ක් හා ඊප්ප තොගයක් විකිණීම සඳහා, කොළඹ 2, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, ටෙන්ඩර් කැඳවනු ලැබේ.

2. ටෙන්ඩර්පත් 65.8.12 වැනි දින දවල් 12.00 දක්වා, කොළඹ 2, වන සංරක්ෂකගේ කාර්යාලයෙන් ලබාගත හැකි අතර, ටෙන්ඩර් ඉල්ලුම්පත් නිකුත් කරනුයේ යෝක් වීදියේ, ලංකා බැංකුවේ, වන සංරක්ෂකගේ අංක 34, දරණ ගණක අංකයට රුපියල් 50ක් තැන්පත් කර, බැංකු කුවිතාන්සිය ඉදිරිපත් කළහොත් පමණි.

3. 1965 අගෝස්තු මස 13 වැනි දින පෙරවරු 10.00 දක්වා ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

4. වැඩි විස්තර, කොළඹ, වන සංරක්ෂකගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ජී. ජෝ. වීරරත්න,
වැඩ බලන වන සංරක්ෂක වෙනුවට.

වන සංරක්ෂකගේ කාර්යාලය,
තැ. පෙ. 509,
5, කිව් පාර,
කොළඹ 2, 1965.7.30.

8-185—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රාජාංගන ව්‍යාපාරය

රාජාංගන ව්‍යාපාරයේ අඩි 20×අඩි 10 යේ කවාකාර දොරටු රාජාංගන වාන් බැම්මතෙක් ප්‍රවාහණයකර කොටස් 17 සිට 25 දක්වා නියම ආකාරයෙන් සවිකිරීම (ටෙන්ඩර් අංක ආර්. එල්. 15) සඳහා ටෙන්ඩර් පත් 1965.8.31 වෙනි දින පෙ. ව. 10.00 දක්වා බාර ගණු ලැබේ.

2. වාරිමාගී දෙපාතීමේන්තුවේ රුපියල් 30,000කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළහැක.

3. 1965.8.27 වැනි දින තෙක් (එදින ඇතුලුව) කායර්‍යාලීය වේලාවන් තුළදී රාජාංගන වාරිමාගී ඉංජිනේරු තුමාගෙන් ලබාගත හැකි පෝර්ම වල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුයි.

ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් කළ ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් සේවය කරන වාරිමාගී වැඩ හා ඒවායේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාගී ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝරම නිකුත් කිරීමට ප්‍රථම රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාගී ඉංජිනේරු තැනගේ කායර්‍යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන් සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම් වැඩය පිළිබඳ සැලසුම් විශේෂ විස්තර යනාදිය කායර්‍යාලීය වේලාවන් තුළදී රාජාංගන වාරිමාගී ඉංජිනේරු තුමාගෙන් ලබාගත හැක.

වාරිමාගී ඉංජිනේරු—රාජාංගන ව්‍යාපාරය, ද. ඉ.

වාරිමාගී කායර්‍යාලය,
රාජාංගන ව්‍යාපාරය,
තඹුත්තේගම, 1965.7.26.

8-137/1 —65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—රාජාංගන ව්‍යාපාරය

රාජාංගන ව්‍යාපාරයේ අඩි 20×අඩි 10 යේ කවාකාර දොරටු රාජාංගන වාන් බැම්මතෙක් ප්‍රවාහණයකර කොටස් 10 සිට 17 දක්වා නියම ආකාරයෙන් සවිකිරීම (ටෙන්ඩර් අංක ආර්. එල්. 14) සඳහා ටෙන්ඩර් පත් 1965.8.31 වෙනි දින පෙ. ව. 10.00 දක්වා බාර ගනු ලැබේ.

2. වාරිමාගී දෙපාතීමේන්තුවේ රුපියල් 30,000කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන්ට පමණක් මේ වැඩය සඳහා ටෙන්ඩර් අයදුම් පත් ඉදිරිපත් කළහැක.

3. 1965.8.27 වැනි දින තෙක් (එදින ඇතුලුව) කායර්‍යාලීය වේලාවන් තුළදී රාජාංගන වාරිමාගී ඉංජිනේරු තුමාගෙන් ලබාගත හැකි පෝර්ම වල ටෙන්ඩර් අයදුම්පත් සකස් කළ යුතුයි.

ටෙන්ඩර් පෝරම ඉල්ලුම් කිරීමේ දී ඒ සඳහා ඉදිරිපත් වන ටෙන්ඩර් කරුවන් ඔවුන්ගේ ලියා පදිංචි පොත් සහ දැනට ඔවුන් සේවය කරන වාරිමාගී වැඩ හා ඒවාගේ වටිනාකම දැක්වෙන ප්‍රකාශයක් ඔවුනට ටෙන්ඩර් කිරීමට ඉඩ ලැබිය යුතුද? නැද්ද? යන්න සලකා බැලීම සඳහා වාරිමාගී ඉංජිනේරු තැන වෙත ඉදිරිපත් කළ යුතුය. පෝරම නිකුත් කිරීමට ප්‍රථම රු. 50ක ටෙන්ඩර් තැන්පත් මුදලක් වාරිමාගී ඉංජිනේරු තැනගේ කායර්‍යාලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලබාගත් කුවිතාන් සියක් ඉදිරිපත් කළ යුතුය.

4. මේ ටෙන්ඩරය ගැන සියලුම වැඩි විස්තර, ගිවිසුම් වැඩය පිළිබඳ සැලසුම් විශේෂ විස්තර යනාදිය කායර්‍යාලීය වේලාවන් තුළදී රාජාංගන වාරිමාගී ඉංජිනේරු තුමාගෙන් ලබාගත හැක.

වාරිමාගී ඉංජිනේරු—රාජාංගන ව්‍යාපාරය, ද. ඉ.

වාරිමාගී කායර්‍යාලය,
රාජාංගන ව්‍යාපාරය,
තඹුත්තේගම, 1965.7.26.

8-137/2 —65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

4. ටෙන්ඩර් පත්‍ර, ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුය. ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපැලෙන් නොඑවතොත් ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් හෝ විසින් පේරාදෙනියේ රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘ.අ. හා ගො) කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනට ඒවා අතින්ම භාරදිය යුතුයි. ටෙන්ඩර් පත්‍ර බහාලන ලද කවරයෙහි "ධාන්‍ය දුම් ගස්වන ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩරය" යන්න ලියා ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද සඳහන් කළ යුතුයි. ලියා පදිංචි කළ තැපැලෙන් එවන ලද ටෙන්ඩර් පත්‍ර ලැබුණු බව ඒවා විවෘත කරන දිනයේදීම සියළුම ටෙන්ඩර්කරුවන්ට දන්වනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම නැවැත්වීමට නියමිත දින සිට දින හතරක් ඇතුළත යම් ටෙන්ඩර්කරුවකුට එවැනි දැන්වීමක් නොලැබුණොත් ඔහු පේරාදෙනියේ රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘ.අ. හා ගො) කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනගෙන් වහාම ඒ ගැන කරුණු විමසිය යුතුයි.

5. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී ඉදිරියේ සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් භාරගැනීම නැවැත්වීමට නියමිත ඉහත කී දිනයේ ඉහතකී වේලාවේදී පේරාදෙනියේ රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘ.අ. හා ගො) තැනගේ කාර්යාලයේදී ඒවා විවෘත කරනු ලැබේ.

6. නියමිත පෝර්මයේ ලියා නැති, නැතහොත් එහි නියමිත කොන්දේසි සම්පූර්ණ වශයෙන් ඉටුවී නැති කිසිම ටෙන්ඩර් පත්‍රයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. ටෙන්ඩර් ප්‍රමාණයන් සහ ගණන් පැහැදිළි ලෙස තීන්තෙන් ලකුණු කළ යුතුවාත් හැර ඒවා සම්බන්ධයෙන් යම්කිසි වෙනසක් කළහොත් ඒ තැන්වල ටෙන්ඩර්කරුවාගේ කෙටි අත්සන තැබිය යුතුද වේ.

7. ටෙන්ඩර්කරුවන් තම ලිපිනය පැහැදිළි අකුරින් ටෙන්ඩර් පත්‍රයෙහි ලිවිය යුතුයි.

8. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වූද, පිළිගනු ලැබුවාවූද දේවල මූළු ගණනින් සියයට පහක ඇප මුදලක් කෘෂිකර්ම අධ්‍යක්ෂතුමාගේ නමින් තැන්පත් කිරීමටත්, ගිවිසුම් පත්‍රයක් අත්සන් කිරීමටත් පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට නියම කරනු ලැබේ. මේ මුදල ආපසු දෙනු ලබන්නේ කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කර නිමවූ විට පමණකි. පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා මේ කොන්ත්‍රාත්තුව ඉටු නොකළහොත් ඔහුගේ ඇප මුදල රාජසන්තක වෙනවා පමණක් නොව ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙනවාද ඇත.

9. ගිවිසුම් පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ගෙවිය යුතුයි.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන සියළුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති 3 කටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතුයි.

11. ඉහත සඳහන් තොගය මුළුමනින්ම ඇණවුම් කරන බවට ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන සහතික නොවන අතර, ටෙන්ඩර් පත්‍ර සියල්ලම හෝ සමහර ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමේත්, කිසියම් ටෙන්ඩරයක කොටසක් පිළිගැනීමේත්, අවශ්‍ය ප්‍රමාණයන් ගෙන් ඇණවුම් කිරීමේත් අයිතිය ඔහු සතු වෙනවා ඇත.

12. දෙපාර්තමේන්තුවේ යහපත සඳහා කොන්ත්‍රාත්තුවේ සඳහන් ද්‍රව්‍ය තොගය මුළුමනින්ම මිලට නොගත යුතුයැයි කෘෂිකර්ම අධ්‍යක්ෂක වරයාට පෙනී ගියහොත් එසේ මිලට නොගැනීම හේතු කොටගෙන ආණ්ඩුවෙන් වන්දි මුදලක් ගැනීමට බලයක් කොන්ත්‍රාත්කරුවාට නොලැබේ.

13. පත් කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කාර්ය සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුය. "ලාංකික" යන වචනයේ අර්ථය නම්, පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ලංකාවේ රටවැසියෙක් වූ තැනැත්තෙක් ය යන්න යි.

14. කොන්ත්‍රාත්කරුට භාරදිය යුතු සියළු දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති ලිපිනයට තැපැලෙන් යැව්වොත් හෝ ඔහුගේ අතටම භාරදුන්නා ලෙස සලකනු ලැබේ.

15. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරු වන්දි ආඥාපනත (117 වැනි පරිච්ඡේදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු විසින් හෝ සේවකයෙකු වෙනුවෙන් හෝ වන්දි ඉල්ලා එවන ඉල්ලුම් පත්‍ර ගැන වගකීමෙන් කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

16. වැඩට ගැනීමට නුසුදුසු යයි කල්පනා කරනු ලබන යම්කිසි කම්කරුවෙකු කොන්ත්‍රාත්කරු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ හෝ බලය ආණ්ඩුව වෙත තබාගනු ලබේ.

17. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවට තනි තනිව හෝ ඒ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම සමග හෝ නම ඇතුළත් වූ හෝ තමාට සැහේය යි පෙනී යන හේතු පිට කෘෂිකර්ම අධ්‍යක්ෂතුමා විරුද්ධවන හෝ කිසිවකු සමග කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

18. වැඩි විස්තර පේරාදෙනියේ රාජකීය උද්භිද උද්‍යානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ (කෘ.අ. හා ගො) තැනගෙන් දැනගත හැක.

ඩී. සී. ඇල්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1965 ජූලි මස 30 දා,
පේරාදෙනියේ දීය.

8–142—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

ගොවිජන සේවා දෙපාර්තමේන්තුවට ජීප්රථ දෙකක් සැපයීම සඳහා කොළඹ 7, එඩින්බරෝ චන්ද්‍රවංකයේ අංක 42, ස්ථානයේහි පිහිටි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් කැඳවීමේ මණ්ඩලයේ සභාපති විසින් 1965 සැප්තැම්බර් මස 6 වෙනි සඳුදා පස්වරු 2.30 දක්වා පිළිගත් මෝටර් රථ වෙළඳුන්ගෙන් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් සඳහා තැන්පත් වශයෙන් රු. 200 ක් කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 60, දරණ ස්ථානයෙහි පිහිටි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ ගණන් අංශයට භාරදී ලබාගත් රිසිට් පතක් ඉදිරිපත් කරණ අයදුම්කරුවන්ට, කොළඹ 10, ඩීන්ස් පාරේ අංක 336 දරණ ස්ථානයෙහි පිහිටි ගොවිජන සේවා දෙපාර්තමේන්තුවෙන් 1965 අගෝස්තු මස 20 සිකුරාදා දහවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට පුළුවන. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකක් සහිතව ඉදිරිපත් කල යුතුය.

3. මේ සඳහා වැඩි විස්තර අවශ්‍ය වුව හොත් පහත සඳහන් ලිපිනයෙන් ලබාගත හැක.

ජේ. වී. ෆොන්සේකා,
ගොවිජන සේවා කොමසාරිස්.

ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
අංක 336, ඩීන්ස් පාර,
තැ. පෙ. 579, කොළඹ 10.

8–134—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

**(නියමිත මිළ යෝජනා ක්‍රමය හා වී කෙටීම)**

කොළඹ එඩින්බරෝ චන්ද්‍රවංක අංක 42, ස්ථානයේහි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් මරදානේ පිහිටි ටියුනිසියා ගබඩාවට හොඳ පරන බුසල් 2½ (දෙකහමාර) හිස් ගෝනි 50,000ක් සැපයීම සඳහා කැඳවනු ලබන ටෙන්ඩර් 1965 අගෝස්තු 20 වැනි සිකුරාද අ.භා. 2.30 තෙක් බාරගනු ලැබේ.

2. දිවයිනේ කච්චේරියකට හෝ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60, හොර්ටන් පෙදෙස කාර්යාලයේ ගණාධිකාරිතැනට රු. 200 ක තැන්පත් මුදලක් ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සියක් අංක 42, එඩින්බරෝ චන්ද්‍රවංක කාර්යාලයේ ටෙන්ඩර් අංශයට ඉදිරිපත්කොට 1965 අගෝස්තු 20 වැනි දින දවල් 12.00 වනතෙක් නිකුත් කරනු ලබන ටෙන්ඩර්පත් ලබාගන අනුපිටපතක්ද සහිතව පුරවා එවිය යුතුයි.

3. වැඩි විස්තර පහත සඳහන් කාර්යාලයෙන් හෝ ටියුනිසියා ගබඩාවේ සැපයීම් අංශයේ ගණකාධිකාරි තැනගෙන් විමසා දනගත හැක.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1965 අගෝස්තු 6 වැනි දින,
කොළඹ 7, තැ. පෙ. අංක 537,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදීය.

8–146/1—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### නියමිත මිළ යෝජනා ක්‍රමය හා වී කෙටීම

කොළඹ, එඩින්බරෝ චන්ද්‍රවංක, අංක 42, ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත දක්වන නියමිත මිළ යෝජනා ක්‍රමය ගබඩාවන්හි හා රජයේ හාල් මෝල්වල පාවිච්චියට අයෝග්‍ය පරණ ගෝනි මිලදී ගෙනයාම සඳහා කැඳවනු ලබන ටැන්ඩර් පත් 1965 අගෝස්තු 27 වැනි සිකුරාද අ.භා. 2.30 වන තෙක් බාර ගනු ලැබේ.

| දිස්ත්‍රික්කය | නියමිත මිළ යෝජනා ක්‍රම ගබඩාව | ප්‍රමාණය | |
|---|---|---|---|
| | | 1 වැනි වර්ගය | 2 වැනි වර්ගය |
| 1. අනුරාධපුර ... | තලාව අංක 1 ගබඩාව ... | 3,600... | 1,640 |
| | තලාව අංක 2, 3 හා 4 ගබඩා ... | 13,958 ... | 14,371 |
| | කැකිරාව නියමිත මිළ යෝජනා ක්‍රම ගබඩාව ... | 13,030... | 7,880 |
| | මැදවච්චිය හාල් මෝල් ගබඩාව | — ... | 23,259 |
| | කලාවැව නියමිත මිළ යෝජනා ක්‍රම ගබඩාව | — ... | 23,578 |
| 2. කුරුණෑගල ... | මහව නියමිත මිළ යෝජනා ක්‍රම ගබඩාව ... | 4,647... | 24,276 |
| | නිකවැරටිය නියමිත මිළ යෝජනා ක්‍රම ගබඩාව | 9,855... | 23,758 |
| | එම හාල් මෝල් ගබඩාව ... | 4,150... | — |
| 3. මන්නාරම ... | මුරුන්කන් නියමිත මිළ යෝජනා ක්‍රම ගබඩාව | 9,400... | 12,130 |
| 4. පොළොන්නරුව | පොළොන්නරුව අංක 1 ගබඩාව | 39,726... | 6,185 |

2. එක් එක් ගබඩාවක් හා සම්බන්ධයෙන් රු. 25 ක තැන්පත් මුදලක් කොළඹින් බැහැර දිවයිනේ කච්චේරියකට හෝ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60, හෝටන් පෙදෙස කාර්යාලයෙහි ගණකාධිකාරි තැනට ගෙවනු ලැබුවාට පසු ලබාගන්නා ලද කුවිතාන්සියක් ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 42, එඩින්බරෝ චන්ද්‍රවංක කාර්යාලයේ ටැන්ඩර් අංශයට ඉදිරිපත් කොට 1965.8.27 වැනි සිකුරාද දවල් 12.00 වන තෙක් නිකුත් කරනු ලබන ටැන්ඩර් පත් ලබාගෙන අනු පිටපතක් සහිතව පුරවා එවිය යුතුයි.

3. වැඩි විස්තර එක් එක් ප්‍රදේශ භාර සහකාර කොමසාරිස් වරුන්ගේ කාර්යාලවලින් හෝ පහත සඳහන් මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1965 අගෝස්තු 6 ද,
කොළඹ 7, තැ. පෙ. 537,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදීය.

8—146/2—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### නියමිත මිළ යෝජනා ක්‍රමය හා වී කෙටීම

කොළඹ, එඩින්බරෝ චන්ද්‍රවංක, අංක 42, ස්ථානයෙහි ගොවිජන සේවා දෙපාර්තමේන්තු ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් දෙපාර්තමේන්තුවට අයත් පහත දක්වන රජයේ හාල් මෝල්හි 1965.10.1 සිට 1966.9.30 කාලසීමාව තුල නිපදවනු ලබන නිවුඩු අංක 2 මිලදී ගෙනයාම සඳහා කැඳවනු ලබන ටැන්ඩර් 1965 අගෝස්තු 27 වැනි සිකුරාද අ.භා. 2.30 වන තෙක් භාර ගනු ලැබේ :—

1. රජයේ හාල් මෝල අම්බලන්තොට නිවුඩු අංක 2.
2. රජයේ හාල් මෝල අනුරාධපුර නිවුඩු අංක 2.
3. රජයේ හාල් මෝල මඩකලපුව නිවුඩු අංක 2.
4. රජයේ හාල් මෝල මැදවච්චිය නිවුඩු අංක 2. (සුනුසහල්)
5. රජයේ හාල් මෝල පදවිය නිවුඩු අංක 2 (සුනුසහල්).
6. රජයේ හාල් මෝල දඹුල්ල නිවුඩු අංක 2 (සුනුසහල්).
7. රජයේ හාල් මෝල හිඟුරක්ගොඩ නිවුඩු අංක 2 (සුනු සහල්).
8. රජයේ හාල් මෝල බකමූණ නිවුඩු අංක 2 (සුණුසහල්).
9. රජයේ හාල් මෝල පල්ලෙවත්ත නිවුඩු අංක 2 (සුණුසහල්).
10. රජයේ හාල් මෝල මොණරාගල නිවුඩු අංක 2 (සුණුසහල්).
11. රජයේ හාල් මෝල මුතූර් අංක 2 නිවුඩු (සුණුසහල්).

2. එක් එක් ගබඩාව වෙනුවෙන් වෙන වෙනම රු. 50 ක ටැන්ඩර් මුදලක් දිවයිනේ කච්චේරියකට හෝ ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ අංක 60, හෝටන් පෙදෙස කාර්යාලයෙහි ගණකාධිකාරි තැනට ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සියක් ඉදිරිපත් කොට ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ 42, එඩින්බරෝ චන්ද්‍රවංක කාර්යාලයේ ටැන්ඩර් අංශයෙන් 1965.8.27 වැනි සිකුරාද දවල් 12.00 වන තෙක් නිකුත් කරනු ලබන ටැන්ඩර් පත් ලබාගෙන අනුපිටපතක්ද සහිතව පුරවා එවිය යුතුයි.

3. වැඩිපුර විස්තර පහත අත්සන් කරනු ලබන අයගෙන් හෝ එක් එක් දිසා භාර සහකාර ගොවිජන සේවා කොමසාරිස්වරුන්ගෙන් විමසා දැන ගත හැක.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් වෙනුවට.

1965 අගෝස්තු 6 ද,
කොළඹ 7, තැ. පෙ. 537,
ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේදීය.

8—146/3—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### සුළු වාරි කර්මාන්ත සඳහා ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමයි

මෙම කාර්යාලයේ, පලාතේ කච්චේරියේ, ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් පහත සඳහන් සුළු වාරි කර්මාන්ත සඳහා මෙයින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

1. නබඩගහවත්තේ වේරගලවත්තේ වැවේ හොරොව්ව අළුත්වැඩියා කිරීම.
2. කුඹල්ඔලුවේ අලවත්තපිටිය අමුණ ඉදිකිරීම.
3. මාතලාපිටියේ පල්ලේකැලේ අමුණ දියුණු කිරීම.
4. අකරහඩුවේ අකරහඩුව ඇල දියුණු කිරීම සඳහා මකුලේවෙල හා මැදවෙල (පෝට් 2 ක්) ඉදිකිරීම.
5. වාරියපොල මොරගහ ඇල්ලේ සයිෆනය අළුත්වැඩියා කිරීම.
6. උඩහපුවිද ගමවෙල්යායේ අමුණ හා ඇල අළුත්වැඩියා කිරීම.
7. ඇලගමුවේ වල්පාරේ ඇල අමුණ ඉදිකිරීම.
8. ඇලගමුවේ හාමුනේ ආධාරබැම්ම හෙවත් ප්‍රමාණකය දියුණු කිරීම.
9. ඇලගමුවේ, ඇලගමුව අමුණේ වම් ඇල දියුණු කිරීම.
10. තලාගොඩ ජම්බුගහමුල ආධාර බැම්ම ඉදිකිරීම.
11. හැලඹගහවත්තේ, හැලඹගහවත්ත අමුණ අළුත්වැඩියා කිරීම.
12. පළුවාවේ ගලහිටියාව වාන අළුත්වැඩියා කිරීම.
13. නාවරගොඩ, නැන්නේවෙල අමුණ අළුත්වැඩියා කිරීම.

2. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ඒවා ඉදිරිපත් කළ යුත්තේ මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවලය. නියමිත ආකෘති පත්‍රයේ ඉදිරිපත් නොකරනු ලබන හෝ මේ කොන්දේසි වලට සම්පූර්ණයෙන් එකඟ නොවන කිසිම ටෙන්ඩරයක් හෝ සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර 1965, අගෝස්තු මස 19 දින දවල් 12 දක්වා මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක. කච්චේරියේ, රු. 10 ක් (රුපියල් දහයක්) තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළයුතුය.

3. සෑම ටෙන්ඩර් පත්‍රයක්ම ටෙන්ඩර් කරු විසින්ම අත්සන් කර තිබිය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ඉලක්කම්වලින් මෙන්ම වචන වලින් ද දැක්විය යුතුය. මිළ ගණන් හා ප්‍රමාණයන් ගණිතානුකූලවද නිවැරදි වියයුතු අතර දක්වන ලද ගණන්වල සංශෝධනයන් කර තිබේ නම්, ඒ සෑමෙකක්ම, ටෙන්ඩර කරුගේ කෙටි අත්සන යොදා සහතික කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍ර අත්සන් කොට, දින යොදා, සීල් තබන ලද ලියුම් කවරවල බහා, මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනගේ ලිපිනයට යැවිය යුතුය. ටෙන්ඩරය බහ එවන ලියුම් කවරයේ, උඩ වම් කෙළවරේ "............සුළු වාරි කර්මාන්තය කිරීම සඳහා ටෙන්ඩර් පත්‍රය" යනුවෙන් සඳහන් කළයුතුය. ටෙන්ඩර් පත්‍ර, 1965 අගෝස්තු මස 20 වැනි දින දවල් 12 ට පෙර මාතලේ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තැනට ලැබෙන පරිදි, ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නො එසේ නම්, ඒ සඳහා මේ කාර්යාලයේ තබා ඇති "ටෙන්ඩර් පෙට්ටියට" දැමිය යුතුය.

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ මරදානේ මැකලම් පාරේ පිහිටි ප්‍රවාහන අංශයේ තිබෙන පාවිච්චි කළ මෝටර් රථ කොටස් රාශියක් මිළදී ලබාගැනීම පිණිස ටෙන්ඩර් පත් කොළඹ 1, චැතැම් වීදියේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ අලෙවි කිරීමේ කොමසාරිස් විසින් 1965 අගෝස්තු මස 27 වැනි සිකුරාදා අ. භා. 2.30 දක්වා භාරගනු ලැබේ.

2. කොළඹ කොටුවේ චැතැම්වීදියේ අංක 62 දරණ ස්ථානයේ පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්‍යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට හෝ රු. 100 ක් බැඳ ලබාගන්නා ලද කුවිතාන්සි දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළවිට 1965 අගෝස්තු මස 27 වැනි සිකුරාදා දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම ලබාගත හැක.

3. වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්‍යාලයෙන් දැනගත හැක.

පී. එච්. ඩී. විජේසූරිය,
වැඩ බලන අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1965 ජූලි මස 30 දින,
කොළඹ 1,
62, චැතැම්වීදිය,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව.

8–53—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## ආහාර දෙපාර්තමේන්තුව

**අම්බලන්තොට, හම්බන්තොට, වීරවිල සහ කහන්දාව යන ස්ථානවල සිට සහල්, පිටි සහ අනිකුත් ආහාර ද්‍රව්‍ය මාතර, බූස්ස, රත්නපුරය සහ මොනරාගල යන ස්ථානවලට ප්‍රවාහණය කිරීම**

ඉහත සඳහන් ප්‍රවාහණ සේවාවන් 65.10.1 දින සිට 66.9.30 දින දක්වා කාලය තුළදී කිරීම පිණිස ටෙන්ඩර්, 1965.8.24 දින පස්වරු **2.30 දක්වා, කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ** කෘෂිකර්ම හා ආහාර පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

2. තමන් සන්තකව ලොරි රථ ඇති හෝ අවශ්‍ය විට ලොරි ප්‍රමාණවත් සංඛ්‍යාවක් සැපයීමට හැකි බඩු පටවන්නන්ගෙන් පමණක් ටෙන්ඩර් භාරගනු ලැබේ. තවද, ඔවුන්ට පැවරෙන ප්‍රවාහණ කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට ඔවුන්ට හැකියාව තිබිය යුතුය.

3. කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ, ආහාර කොමසාරිස් කාර්‍යාලයෙන් 1965.8.23 දින දහවල් 12 දක්වා රු. 250 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා, ඉහත දෙවන ඡේදයේ සඳහන් කරුණු පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කොට ලබාගත හැකි ෆෝර්මවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර ආහාර කොමසාරිස් කාර්යාලයෙන් ලබාගත හැක.

පී. ඒ. සිල්වා,
ආහාර කොමසාරිස්.

1965.8.2,
කොළඹ, ආහාර කොමසාරිස් කාර්යාලයේ දීය.

8–197/1—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## ආහාර දෙපාර්තමේන්තුව

**කොළඹ වරායේ වාප්පු භූමි ප්‍රදේශය ඇතුළත පිහිටි ගබඩා අතර සහ කොළඹ වරායේ වාප්පුවල සිට ආහාර දෙපාර්තමේන්තුවේ කොළඹ සහ කොළඹ අවට පිහිටි ගබඩා දක්වා සහල්, පිටි, සීනි සහ අනිකුත් ආහාර ද්‍රව්‍ය ප්‍රවාහණය කිරීම**

ඉහත සඳහන් ප්‍රවාහණ සේවාවන් 65.10.1 දින සිට 66.9.30 දින දක්වා කාලය තුළදී කිරීම පිණිස ටෙන්ඩර්, 1965.8.24 දින පස්වරු 2.30 දක්වා, කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ කෘෂිකර්ම හා ආහාර පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

2. තමන් සන්තකව ලොරි රථ ඇති හෝ අවශ්‍ය විට ලොරි ප්‍රමාණවත් සංඛ්‍යාවක් සැපයීමට හැකි බඩු පටවන්නන්ගෙන් පමණක් මේ සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ. තවද, ඔවුන්ට පැවරෙන ප්‍රවාහණ කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට ඔවුන්ට හැකියාව තිබිය යුතුය.

3. කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ, ආහාර කොමසාරිස් කාර්‍යාලයෙන් 1965.8.23 දින දහවල් 12 දක්වා රු. 250 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා, ඉහත දෙවන ඡේදයේ සඳහන් කරුණු පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කොට ලබාගත හැකි ෆෝර්මවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර ආහාර කොමසාරිස් කාර්යාලයෙන් ලබාගත හැක.

පී. ඒ. සිල්වා,
ආහාර කොමසාරිස්.

1965.8.2,
කොළඹ, ආහාර කොමසාරිස් කාර්යාලයේ දීය.

8–197/2—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## ආහාර දෙපාර්තමේන්තුව

**සහල්, පිටි, සීනි සහ වෙනත් ආහාර ද්‍රව්‍යයන් ගාල්ලේ රේගුවේ සිට බූස්ස දිස්ත්‍රික් ධාන්‍යාගාරයටද ගාල්ලේ රේගුවේ සිට ගාල්ලේ දුම්රිය ස්ථානයටද, ගාල්ලේ දුම්රිය ස්ථානයේ සිට ගාල්ලේ දිස්ත්‍රික්ක ආහාර ගබඩාවට සහ බූස්සේ දිස්ත්‍රික් ධාන්‍යාගාරයේ සිට ගාල්ලේ දුම්රිය ස්ථානයටද ප්‍රවාහණය කිරීම**

ඉහත සඳහන් ප්‍රවාහණ සේවාවන් 65.10.1 දින සිට 66.9.30 දින දක්වා කාලය තුළදී කිරීම පිණිස ටෙන්ඩර්, 1965.8.24 දින පස්වරු 2.30 දක්වා, කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ කෘෂිකර්ම හා ආහාර පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

2. තමන් සන්තකව ලොරි රථ ඇති හෝ අවශ්‍ය විට ලොරි ප්‍රමාණවත් සංඛ්‍යාවක් සැපයීමට හැකි බඩු පටවන්නන්ගෙන් පමණක් ටෙන්ඩර් භාරගනු ලැබේ. තවද, ඔවුන්ට පැවරෙන ප්‍රවාහණ කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට ඔවුන්ට හැකියාව තිබිය යුතුය.

3. කොළඹ 2, යූනියන් පෙදෙසේ අංක 330 දරණ ස්ථානයේ, ආහාර කොමසාරිස් කාර්‍යාලයෙන් 1965.8.23 දින දහවල් 12 දක්වා රු. 250 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා, ඉහත දෙවන ඡේදයේ සඳහන් කරුණු පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කොට ලබාගත හැකි ෆෝර්මවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර ආහාර කොමසාරිස් කාර්යාලයෙන් ලබාගත හැක.

පී. ඒ. සිල්වා,
ආහාර කොමසාරිස්.

1965.8.2,
කොළඹ, ආහාර කොමසාරිස් කාර්යාලයේ දීය.

8–197/3—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

සුදු පාට කපු නූල් රොඩු සැපයීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරී කායඞීලයේ දෙපාර්තමේන්තු ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1965 සැප්තැම්බර් මස 8 වැනි බදාදා පෙරවරු 11 වන තෙක් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පෙර ටෙන්ඩර්කරුවන් විසින් ඉහත සඳහන් සේවාව කර ගැනීමට හා හරියාකාර ඉටු කිරීමට තමාගේ මුදල් තත්වය ප්‍රමාණවත් බව උවමනා වුවහොත් ඔප්පු කිරීමට ඒ සම්බන්ධ ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

මරදානේ දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කායඞීලයෙන් ලබා ගත හැකි පෝරම කොළවල ටෙන්ඩරය ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 100 ක් මරදානේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කායඞීලයෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1965 සැප්තැම්බර් මස 7 වැනි අඟහරුවාදා පස්වරු 3 වන තෙක් ටෙන්ඩර් පෝරම කොළ නිකුත් කරනු ලැබේ.

1965 සැප්තැම්බර් මස 9 වැනි බ්‍රහස්පතින්දා පෙරවරු 10 ට දුම්රිය සාමාන්‍යාධිකාරී කායඞීලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කායඞීලයෙන් ලබා ගත හැකිය.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

1965 ජූලි මස 29 දින,
කොළඹ.

8–26—65.8.6 වැනි දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාතීමේන්තුව

දුම්රිය දෙපාතීමේන්තුවට හියුම් පයිප්ප සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර, ප්‍රවාහණ අමාත්‍යංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (ලිපිනය: 4 වැනි මහල, සෙලින්කෝ මන්දිරය, කොළඹ 1.) 1965 අගෝස්තු මස 20 වැනි සිකුරාදා පෙ. ව. 11.00 වනතෙක් භාර ගනු ලැබේ.

ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කිරීමට පළමු ටෙන්ඩර්කරු විසින් ඉහත සඳහන් සේවාව භාර ගැනීමට සහ හරියාකාර ඉටු කිරීමට තමාගේ මුදල් තත්වය ප්‍රමාණවත් බව අවශ්‍ය වුවහොත්, ඔප්පු කිරීම පිණිස ඒ සම්බන්ධ ලිකියවිලි ඉදිරිපත් කිරීමට සූදානම් විය යුතුයි.

මරදානේ දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකි පෝර්ම කොලවල ටෙන්ඩරය ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 100 ක් මරදානේ දුම්රිය දෙපාතීමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කාර්යාලයෙහි හෝ, කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට 1965.8.19 වැනි බ්‍රහස්පතින්දා ප. ව. 3.00 වනතෙක් ටෙන්ඩර් පෝර්ම කොල නිකුත් කරනු ලැබේ.

1965 අගෝස්තු මස 23 වැනි සඳුදා පෙ. ව. 10.00 ට ප්‍රවාහණ අමාත්‍යංශ කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පෙනී සිටීමට අවසර ඇත.

වැඩි විස්තර දුම්රිය ගබඩා අධිකාරි තැනගේ කාර්යාලයෙන් ලබාගත හැක.

ඇම්. සරීන්,
දුම්රිය සාමාන්‍යාධිකාරි වෙනුවට.

1965.8.2 වැනි දින,

8–223—65.8.6 වැනි දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

---

## ජල සම්පාදන හා ජලාපවහන දෙපාර්තමේන්තුව—රත්මලාන

### අඟල් 2ක් විෂ්කම්භය ඇති තද (රිජිඩ්) පී.වී.සී. පයිප්ප දික් අඩි 1,350ක් සැපයීම හා ගෙනැවිත් බාරදීම

මන්නාරම තිරුකේතීස්වරම් ජලසම්පාදන යෝජනා ක්‍රමය සඳහා අඟල් 2ක් විශ්කම්භය ඇති තද (රිජිඩ්) පී.වී.සී. පයිප්ප දික් අඩි 1350 ක් සපයා එකී ස්ථානයට ගෙනැවිත් බාරදීම සඳහා වූ ටැන්ඩර් ඉල්ලුම් පත්‍ර රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන දෙපාතීමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1965 අගෝස්තු මස 20 වැනි සිකුරාද පෙරවරු 10 දක්වා බාරගනු ලැබේ. මේ ටැන්ඩර් ඉල්ලුම් පත්‍ර විවෘත කරනු ලබන වේලාවට එනම් එදිනම පෙරවරු 10ට ටැන්ඩර්කරුවන්ට දෙපාර්තමේන්තුවේ ටැන්ඩර් මණ්ඩල කාමරයට පැමිණ සිටිය හැකිය.

2. ටැන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තුවන අයවලුන් විසින් ටැන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 25ක් සඳහා ජලසම්පාදන හා ජලාපවහන දෙපාතීමේන්තුව විසින් හෝ ඕනෑම කච්චේරියකින් නිකුත් කරනු ලැබූ රිසිට් පතක්ද ඇතිව මේ දෙපාතීමේන්තුවේ නිර්මාණ හා නඩත්තු පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් ඉල්ලුම් කළවිට ටැන්ඩර් ලියවිලි නිකුත් කරනු ලැබේ. ටැන්ඩර් කොන්දේසිවලට අනුකූලව මේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

3. පහත සඳහන් ආයතන සඳහා ටැන්ඩර් තැන්පත් මුදලක් අවශ්‍ය වන්නේ නැත:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය,

(ආ) වෙනත් රාජ්‍යවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන—නිදසුනක් "චෛයිනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝර්පරේෂන්"

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති, හෝ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ත්‍රාර්තැන විසින් ලියා පදිංචි කර ඇති සමුපකාර සමිති.

4. ටැන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ ඉහත සඳහන් පරිදි ලබාගත් ටැන්ඩර් ආකෘති පත්‍රවලය. 1965 අගෝස්තු මස 13 වැනි සිකුරාදා පස්වරු 3 දක්වා ටැන්ඩර් ලියවිලි නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් ලියවිලි නිකුත් කරන අවසාන දිනය වෙනතෙක් නොසිට හැකි ඉක්මණින් ටැන්ඩර් ලියවිලි ඉල්ලුම් කරන ලෙස ටැන්ඩර්කරුවන් ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

ආර්. වී. පෙරුමසිනාර්,
වැඩබලන ජලසම්පාදන හා ජලාපවහන අධ්‍යක්ෂ.

1965ක් වූ අගෝස්තු මස 2 වැනි දින,
රත්මලානේ ජලසම්පාදන හා ජලාපවහන
දෙපාර්තමේන්තුවේ දීය.

8–190—65.8.6 වැනි දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### 1965/66 වර්ෂයේ නාවින්නේ බණ්ඩාරනායක අනුස්මරණ ආයුර්වේද පර්යේෂණායතනයට වියලි, අමු, සහ සාමාන්‍ය බෙහෙත් ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

1965 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1966 සැප්තැම්බර් 30 වෙනි දින (එම දෙදිනත් ඇතුලුව) දක්වා කාලය තුල මෙහි පහත ඇති උපලේඛනයෙහි සඳහන් පරිදි අමු, වියලි සහ සාමාන්‍ය බෙහෙත් ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර එම ද්‍රව්‍ය විකිණීමට ලියාපදිංචි වී ඇති ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් වලින් කොළඹ, 8, කෝට්ටෙ පාරේ අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි කොමසාරිස් විසින් 1965 අගෝස්තු 27 දින පෙරවරු 10.00 වන තෙක් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍රය දමා ඇති මුද්‍රා තබන ලද කවරයේ උඩ වම් කෙලවරේ එය කුමන සේවයක් සඳහාද යන වග පැහැදිලි ලෙස ලියා කොළඹ 8, කෝට්ටෙ පාර, අ ක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි ආයුර්වේද කොමසාරිස්ගේ ලිපිනයට එවිය යුතුය. ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද, කවරයෙහි සඳහන් කළ යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්යාලයේ කොමසාරිස්ට භාරදිය යුතුය. නැතිනම් ලියා පදිංචි කල තැපැලෙන් එවිය යුතුය. කෙසේ වුවද, ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් කැමතිනම් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර ඒවා භාර ගැනීමට බලය ලත් නිලධාරියා වන පළමුවෙනි ඡෙදයේ සඳහන් කර ඇති ලිපිනයේ සිටින ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාරට පුද්ගලිකව භාර දිය හැක. මුද්‍රා තබන ලද ටෙන්ඩර් භාර දුන් තැනැත්තාට ඔහු විසින් කුවිතාන්සියක් දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලබන අවසාන දිනයේ පෙරවරු 10.00 පසුව ලැබෙන ටෙන්ඩර් පත්‍ර භාර නොගන්නා බව ටෙන්ඩර්කරුවන් විසින් සැළකිය යුතුය.

4. පළවෙනි ඡෙදයේ සඳහන් කර ඇති වේලාවට එම ස්ථානයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට සියලුම ටෙන්ඩර්කරුවන්ට එහි සිටීමට ඉඩ දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියේදී ටෙන්ඩර් කරුවන්ගේ නම් මෙන්ම, ඔවුන් විසින් සඳහන් කර ඇති මිල ගණන්ද කියවනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් පත්‍රයක් පරීක්ෂා කිරීමට උවමනා නම් ඉදිරිපත් කර ඇති ටෙන්ඩරයේ අනු පිටපතක් ආයුර්වේද කොමසාරිස් සමග නියම කරගත් වේලාවට පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

5. පහත සඳහන් උප ලේඛනයෙහි 2 වෙනි කොටසෙහි සඳහන් තැන්පත් මුදල කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) හෝ කොළඹ, යෝර්ක් වීදියේ ලංකා බැංකුවේ හෝ මගේ නමට තැන්පත් කොට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට එම කුවිතාන්සිය ඉදිරිපත් කල යුතුය. කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකුවේ තැන්පත් කරන මුදල් වෙනුවෙන් අවශ්‍ය ආකෘති පත්‍ර කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි කොමසාරිස් ගෙන් ලබා ගත යුතුය. නිසි ආකෘතිපත්‍ර සමග ඉදිරිපත් නොකෙරෙන තැන්පත් මුදල් භාර නොගන්නවා ඇත. අයදුම් කරුවන් විසින් මුදල් තැන්පත් කල බවට කුවිතාන්සිය 1965 අගෝස්තු මස 26 වෙනි දින දවල් 12.00 ට පෙර කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි කාර්යාලයේ ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කොට අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත යුතුය. තැපැලෙන් ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන අයදුම් කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට ප්‍රථම ඒවා ලබා ගැනීමට හැකි වන අන්දමින් කල් වේලා ඇතිව තමන්ගේ කුවිතාන්සි ඉදිරිපත් කල යුතුය.

6. කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 ආයුර්වේද කොමසාරිස්ගෙන් වැඩි විස්තර ලබා ගත හැකිය.

ඇස්. ආර්. ප්‍රනාන්දු,
ආයුර්වේද කොමසාරිස් වෙනුවට.

කෝට්ටෙ පාර,
කොළඹ 8,
1965 අගෝස්තු මස 2 දින.

### උපලේඛනය

| සේවය | ටෙන්ඩර් තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය |
|---|---|---|---|
| 65.10.1 සිට 66.9.30 (එම දෙදිනත් ඇතුලුව) දක්වා කාලසීමාව තුල නාවින්නේ බණ්ඩාරනායක අනුස්මරන ආයුර්වේද පර්යේෂණායතනයට වියලි, අමු, සහ සාමාන්‍ය බෙහෙත් ද්‍රව්‍ය සැපයීම සඳහා ය | රු. 100/- ... | ටෙන්ඩරයේ මුලු වටිනාකමින් සියයට 5 යි | 1965.8.27 |

8-149—65.8.6 දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුව

### 1965-66 වර්ෂයේ අනුරාධපුර ආයුර්වේද ආරෝග්‍යශාලාවට අමු, වියලි සහ සාමාන්‍ය බෙහෙත් ද්‍රව්‍ය සැපයීම

1965 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1966 සැප්තැම්බර් 30 වෙනි දින (එම දෙදිනත් ඇතුලුව) දක්වා කාලය තුල මෙහි පහත ඇති උපලේඛනයෙහි සඳහන් පරිදි අමු, වියලි සහ සාමාන්‍ය බෙහෙත් ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර එම ද්‍රව්‍ය විකිණීමට ලියාපදිංචි වී ඇති ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් වලින් කොළඹ, 8, කෝට්ටෙ පාරේ අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි කොමසාරිස් විසින් 1965 අගෝස්තු 27 දින පෙරවරු 10 වන තෙක් භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍රය දමා ඇති මුද්‍රා තබන ලද කවරයේ උඩ වම් කෙලවරේ එය කුමන සේවයක් සඳහාද යන වග පැහැදිලි ලෙස ලියා කොළඹ 8, කෝට්ටෙ පාර, අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි ආයුර්වේද කොමසාරිස්ගේ ලිපිනයට එවිය යුතුය. ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයද, කවරයෙහි සඳහන් කල යුතුය.

3. ටෙන්ඩර් පත්‍ර කොළඹ 8, කෝට්ටේ පාරේ අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්යාලයේ කොමසාරිස්ට භාරදිය යුතුය. නැතිනම් ලියාපදිංචි කල තැපැලෙන් එවිය යුතුය. කෙසේ වුවද, ටෙන්ඩර් කරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් කැමතිනම් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර ඒවා භාර ගැනීමට බලය ලත් නිලධාරියා වන පළමුවෙනි ඡෙදයේ සඳහන් කර ඇති ලිපිනයේ සිටින ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කාර්යාල සහකාරට පුද්ගලිකව භාර දිය හැක. මුද්‍රා තබන ලද ටෙන්ඩර් භාර දුන් තැනැත්තාට ඔහු විසින් කුවිතාන්සියක් දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලබන අවසාන දිනයේ පෙරවරු 10 පසුව ලැබෙන ටෙන්ඩර් පත්‍ර භාර නොගන්නා බව ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුය.

4. පලවෙනි ඡෙදයේ සඳහන් කර ඇති වේලාවට එම ස්ථානයේදී ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට සියලුම ටෙන්ඩර්කරුවන්ට එහි සිටීමට ඉඩ දෙනු ලැබේ. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන් ඉදිරියේදී ටෙන්ඩර් කරුවන්ගේ නම් මෙන්ම, ඔවුන් විසින් සඳහන් කර ඇති මිල ගණන්ද කියවනු ලැබේ. යම් ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් පත්‍රයක් පරීක්ෂා කිරීමට උවමනා නම් ඉදිරිපත් කර ඇති ටෙන්ඩරයේ අනු පිටපතක් ආයුර්වේද කොමසාරිස් සමග නියම කරගත් වේලාවට පරීක්ෂා කිරීමට අවසර දෙනු ලැබේ.

5. පහත සඳහන් උපලේඛනයෙහි II වෙනි කොටසෙහි සඳහන් තැන්පත් මුදල කච්චේරියක (කොළඹ කච්චේරිය හැර) හෝ කොළඹ, යෝර්ක් වීදියේ ලංකා බැංකුවේ හෝ මගේ නමට තැන්පත් කොට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට කුවිතාන්සිය ඉදිරිපත් කල යුතුය. කොළඹ යෝර්ක් වීදියේ ලංකා බැංකුවේ තැන්පත් කරන මුදල් වෙනුවෙන් අවශ්‍ය ආකෘති පත්‍ර කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි කොමසාරිස් ගෙන් ලබා ගත යුතුය. නිසි ආකෘති පත්‍ර සමග ඉදිරිපත් නොකෙරෙන තැන්පත් මුදල් භාර නොගන්නවා ඇත. අයදුම් කරුවන් විසින් මුදල් තැන්පත් කල බවට කුවිතාන්සිය 1965 අගෝස්තු මස 26 වෙනි දින දවල් 12 ට පෙර කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 හි ආයුර්වේද දෙපාර්තමේන්තුවෙහි කාර්යාල යේ ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කොට අවශ්‍ය ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගත යුතුය. තැපැලෙන් ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන අයදුම් කරුවන් විසින් ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනයට ප්‍රථම ඒවා ලබා ගැනීමට හැකි වන අන්දමින් කල් වේලා ඇතිව තමන්ගේ කුවිතාන්සි ඉදිරිපත් කල යුතුය.

6. කොළඹ 8, කෝට්ටෙ පාරේ අංක 325 ආයුර්වේද කොමසාරිස්ගෙන් වැඩි විස්තර ලබා ගත හැකිය.

ඇස්. ආර්. ප්‍රනාන්දු,
ආයුර්වේද කොමසාරිස් වෙනුවට.

කෝට්ටෙ පාර,
කොළඹ 8,
1965 අගෝස්තු මස 2 දින.

### උපලේඛනය

| සේවය | ටෙන්ඩර් තැන්පත් මුදල | ඇප මුදල | ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනය |
|---|---|---|---|
| 65.10.1 සිට 66.9.30 (එම දෙදිනත් ඇතුලුව) දක්වා කාල සීමාව තුල අනුරාධ පුර ආයුර්වේද ආරෝග්‍යශාලාවට වියලි, අමු සහ සාමාන්‍ය බෙහෙත් ද්‍රව්‍ය සැපයීම සඳහාය. | රු. 100෴ ... | ටෙන්ඩරයේ මුලු වටිනාකමින් සියයට 5 යි | 1965.8.27 |

8-148—65.8.6 වැනි දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

## ආයුර්වේද දෙපාර්තමේන්තුවේ නාවින්නේ පිහිටි ආයුර්වේද පර්යේෂණායතනයේ කිලිටි රෙදි ඇපිල්ලීමේ ටෙන්ඩරය—1965/66 මුදල් වර්ෂය

1965 ඔක්තෝබර් මස 1 දා සිට 1966 සැප්තැම්බර් මස 30 වෙනිදා දක්වා (මුල අග දෙදිනද ඇතුළුව) කාලය තුළ නාවින්නේ පිහිටි ආයුර්වේද පර්යේෂණායතනයට අයත් කිලිටි රෙදි ඇපිල්ලීම සඳහා ආයුර්වේද කොමසාරිස් විසින් 1965 අගෝස්තු මස 24 දින පූ.භා. 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. එම වේලාව ඉක්මවූ වහාම ආයුර්වේද කොමසාරිස් විසින් ටෙන්ඩර් පත්‍ර විවෘත කොට පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැනගැනීම පිණිස නම් හා ගාස්තු ප්‍රමාණ කියවනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 10ක් ආයුර්වේද කොමසාරිස් නමට කච්චේරියක හෝ ආයුර්වේද කොමසාරිස් වෙතම හෝ තැන්පත් කොට, ඒ සඳහා ලබා ගත් කුවිතාන්සිය ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර පෝරම ලබාගත හැක. කොමසාරිස්ගේ කාර්යාලයට පැමිණ පෞද්ගලිකවම ටැන්ඩර් පත්‍රය භාර දුනහොත් ආයුර්වේද කොමසාරිස් විසින් හෝ යථා පරිදි බලය පවරන ලද ඔහුගේ නියෝජිතයා විසින් හෝ එය බාරගත් බවට කුවිතාන්සියක් දෙනු ලැබේ. තමා කැමති නම්, ආයුර්වේද කොමසාරිස් වෙත, ලියා පදිංචි තැපැලෙන් ටෙන්ඩර් පත්‍රය ඉදිරිපත් කිරීමට ටෙන්ඩර්කරුට පුළුවන.

3. ටෙන්ඩර් පත්‍ර බාරගන්නා අවසාන දිනට පෙර දින මධ්‍යාහ්නයේ 12 ට පෙර ටෙන්ඩර් පත්‍ර පෝරම ලබාගත යුතුය. නියමිත පෝරමයේ නොලියූ කිසිම ටෙන්ඩර් පත්‍රයක් සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් පත්‍ර බාරගන්නා අවසාන දිනයට හා වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් පත්‍ර සලකා නොබලනු ඇත.

4. බාර දී තිබෙන ඕනෑම ටෙන්ඩර් පත්‍රයක අනු පිටපත, ආයුර්වේද කොමසාරිස් සමග කටයුතු පිළියෙල කර ගැනීමෙන් පසු පරීක්ෂා කර බැලීමට ටෙන්ඩර් කරුවනට පුළුවන.

5. සාර්ථකවූ ටෙන්ඩර්කරු විසින් ඇප වශයෙන් ටෙන්ඩරයෙහි වටිනාකමින් 5% ක මුදලක් තැන්පත් කළයුතු වන අතරම කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කිරීම සම්බන්ධයෙන් ගිවිසුමකට හා බැඳුම්කරයකට අත්සන් තැබිය යුතුය. සාර්ථක වූ ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු අසාර්ථක වූ ටෙන්ඩර් කරුවන්ගේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

6. මෙම සේවය පිළිබඳ සියලුම විස්තර ආයුර්වේද කොමසාරිස් ගෙන් ලබාගත හැකිය.

ඇස්. ආර්. ප්‍රනාන්දු,
ආයුර්වේද කොමසාරිස් වෙනුවට.

1965 අගෝස්තු 2 දින,
කොළඹ 8,
ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දීය.

8-147—65.8.6 දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

---

## ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අනුරාධපුරයෙහි පිහිටි ආයුර්වේද ආරෝග්‍යශාලාවේ කිලිටි රෙදි ඇපිල්ලීමේ ටෙන්ඩරය—1965/66 මුදල් වර්ෂය

1965 ඔක්තෝබර් මස 1 දා සිට 1966 සැප්තැම්බර් මස 30 වෙනිදා දක්වා (මුල අග දෙදිනද ඇතුළුව) කාලය තුළ අනුරාධපුරයෙහි පිහිටි ආයුර්වේද ආරෝග්‍යශාලවට අයත් කිලිටි රෙදි ඇපිල්ලීම සඳහා ආයුර්වේද කොමසාරිස් විසින් 1965 අගෝස්තු මස 24 දින පූ. භා. 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. එම වේලාව ඉක්මවූ වහාම ආයුර්වේද කොමසාරිස් විසින් ටෙන්ඩර් පත්‍ර විවෘත කොට පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ගේ දැනගැනීම පිණිස නම් හා ගාස්තු ප්‍රමාණ කියවනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුක්තව ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 10 ක් ආයුර්වේද කොමසාරිස් නමට කච්චේරියක හෝ ආයුර්වේද කොමසාරිස් වෙතම හෝ තැන්පත් කොට, ඒ සඳහා ලබා ගත් කුවිතාන්සිය ආයුර්වේද කොමසාරිස් වෙත ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර පෝරම ලබාගත හැක. කොමසාරිස්ගේ කාර්යාලයට පැමිණ පෞද්ගලිකවම ටැන්ඩර් පත්‍රය බාර දුනහොත් ආයුර්වේද කොමසාරිස් විසින් හෝ යථා පරිදි බලය පවරන ලද ඔහුගේ නියෝජිතයා විසින් හෝ එය බාරගත් බවට කුවිතාන්සියක් දෙනු ලැබේ. තමා කැමති නම්, ආයුර්වේද කොමසාරිස් වෙත, ලියා පදිංචි තැපැලෙන් ටෙන්ඩර් පත්‍රය ඉදිරිපත් කිරීමට ටෙන්ඩර්කරුට පුළුවන.

3. ටෙන්ඩර් පත්‍ර බාරගන්නා අවසාන දිනට පෙර දින මධ්‍යාහ්නයේ 12 ට පෙර ටෙන්ඩර් පත්‍ර පෝරම ලබාගත යුතුය. නියමිත පෝරමයේ නොලියූ කිසිම ටෙන්ඩර් පත්‍රයක් සලකා බලනු නොලැබේ. ටෙන්ඩර් පත්‍ර බාරගන්නා අවසාන දිනයට හා වේලාවට පසුව ලැබෙන ටෙන්ඩර් පත්‍ර සලකා නොබලනු ඇත.

4. බාර දී තිබෙන ඕනෑම ටෙන්ඩර් පත්‍රයක අනු පිටපත, ආයුර්වේද කොමසාරිස් සමග කටයුතු පිළියෙල කර ගැනීමෙන් පසු පරීක්ෂා කර බැලීමට ටෙන්ඩර් කරුවනට පුළුවන.

5. සාර්ථකවූ ටෙන්ඩර්කරු විසින් ඇප වශයෙන් ටෙන්ඩරයෙහි වටිනාකමින් 5%ක මුදලක් තැන්පත් කළ යුතු වන අතරම කොන්ත්‍රාත්තුව නිසි පරිදි ඉටු කිරීම සම්බන්ධයෙන් ගිවිසුමකට හා බැඳුම්කරයකට අත්සන් තැබිය යුතුය. සාර්ථක වූ ටෙන්ඩර්කරු කොන්ත්‍රාත්තුවට අත්සන් තැබීමෙන් පසු අසාර්ථක වූ ටෙන්ඩර් කරුවන්ගේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

6. මෙම සේවය පිළිබඳ සියලුම විස්තර ආයුර්වේද කොමසාරිස් ගෙන් ලබාගත හැකිය.

ඇස්. ආර්. ප්‍රනාන්දු,
ආයුර්වේද කොමසාරිස් වෙනුවට.

1965 අගෝස්තු 2 දින,
කොළඹ 8,
ආයුර්වේද දෙපාර්තමේන්තුවේ දී ය.

8–145—65.8.6 දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

---

## හක්වටුනාඔය ඉඩම් සංවර්ධන ව්‍යාපාරයේ ඇති පරණ බඩු විකිණීම සඳහා ටෙන්ඩර්

කුරුණෑගල දිස්ත්‍රික්කයේ හක්වටුනාඔය ඉඩම් සංවර්ධන ව්‍යාපාරයේ ඇති පරණ ඉරුපු ලී හිස් පිත් ආදී තවත් ද්‍රව්‍ය විකිණීම සඳහා ටෙන්ඩර් 1965 අගෝස්තු මස 24 වෙනි දින දවල් 11 වන තෙක් කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ඉඩම් සංවර්ධන නිලධාරි විසින් භාර ගනු ලැබේ.

2. විකිණීම සඳහා ඇති බඩුවල ලැයිස්තුවක් ව්‍යාපාරය භාර නිලධාරි ගෙන් හෝ මගේ කාර්යාලයෙන් ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැකි සි.

3. 1965 අගෝස්තු මස 24 වෙනි දින පෙරවරු 10 වන තෙක් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්ම වල පිටපත් දෙක බැගින් ටෙන්ඩර් එවිය යුතු ය. ටෙන්ඩර් පෝර්ම නිකුත් කිරීමට පෙර එම ව්‍යාපාරය වෙනුවෙන් රු. 25 ක මුදලක් කොළඹ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ කච්චේරියක තැන්පත් කර ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතු යි.

4. සියළුම ටෙන්ඩර් කවරයක බහා සිල් තබා කවරයේ වම්පස උඩ කෙළවරේ "පරණ බඩුවලට ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කර කොළඹ එච්ලන් චතුරශ්‍රයේ, තැ. පෙ. 529, ඉඩම් සංවර්ධන නිලධාරි වෙත එවිය යුතු ය. ටෙන්ඩර් කරුවාගේ නම සහ ලිපිනය කවරයේ වම්පස පහත කෙළවරේ සඳහන් කළ යුතු ය. ටෙන්ඩර් එවිය යුත්තේ ලියා පදිංචි තැපැලෙනි. නැතහොත් කොළඹ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඒ වෙනුවෙන් තබා ඇති පෙට්ටියේ තැන්පත් කළ යුතු ය.

5. 1965 අගෝස්තු මස 24 වෙනි දින දවල් 11 ට කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් එවිට පෙනී සිටිය හැකි යි. යම් ටෙන්ඩරයක් ප්‍රතික්ෂෙප කිරීම හෝ භාර ගැනීම අයිතිය ඉඩම් සංවර්ධන නිලධාරි සතු ය.

6. ටෙන්ඩර් සාර්ථක වූ බව දන්වා දින 3 ක් ඇතුළත දී බඩු වලට සම්පූර්ණ මුදල් තැන්පත් කළ යුතු අතර, සතියක් ඇතුළත දී සියළුම බඩු ගෙන යා යුතු ය. මෙසේ නො කළහොත් ටෙන්ඩර් පෝර්ම වලට තැන්පත් කළ මුදල හෝ බඩු වලට තැන්පත් කළ මුදල හෝ රාජසන්තක කර බඩු වලට සුදුස්සක් ඉඩම් සංවර්ධන නිලධාරි විසින් කරනු ලැබේ.

7. ටෙන්ඩර්වල වෙනස් කළ තැන්වල ටෙන්ඩර්කරු විසින් කෙටි අත්සන තැබිය යුතුයි. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට පෙර විකිණීමට ඇති බඩු ටෙන්ඩර් කරුවන් විසින් පරීක්ෂා කර බලන ලෙස අවවාද කරනු ලැබේ. ව්‍යාපාරය භාර නිලධාරි හමුවී බඩු පරීක්ෂා කිරීමට වැඩ කරන දිනවල කටයුතු සලස්වා ගත යුතු ය. තවදුරටත් විස්තර උවමනා නම් කොළඹ එච්ලන් චතුරශ්‍රයේ ප්‍රධාන කාර්යාලයේ ඉඩම් සංවර්ධන නිලධාරිගෙන් ලබාගත හැකිය.

ඒ. ඩබ්. ගුණසිංහ,
ඉඩම් සංවර්ධන නිලධාරි,
ප්‍රධාන කාර්යාලය.

1965 ජූලි 28 වන දා,
කොළඹ, එච්ලන් චතුරශ්‍රයෙහි, තැ. පෙ. 529,
ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේදීය.

8–35—65.8.6 දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

## තිස්ස-කතරගම සංවර්ධන ව්‍යාපාරයේ පාසැල් ගොඩනැගිල්ලක්, ගුරු නිවාස තුනක්, ළිඳක් හා වැසිකිළි හයක් තැනීම සඳහා—ටෙන්ඩර් කැඳවීම

ඉහත සඳහන් ගොඩනැගිලි සඳහා ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.

(1) කොන්ත්‍රාත්කරුවෝ රු. 50,000 හෝ ඊට වඩා ලියා පදිංචි වූ අය විය යුතුයි.

(2) සියළු ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුක්ත කොට එක කවරයක බහා මුද්‍රා තබා කොළඹ 1, තැ. පෙ. 500 දරන ස්ථානයේ ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන නමට එවිය යුතුය.

(3) ටෙන්ඩර් පත්‍ර අමාත්‍යාංශයේ ඇති පෙට්ටියට දැමිය යුතුයි. නැතහොත් ලියා පදිංචි තැපෑලෙන් එවිය යුතුය.

(4) ලියුම් කවරයේ මුදුනේ "තිස්ස-කතරගම සංවර්ධන ව්‍යාපාරයේ, පාසල, ගුරුනිවාසය, ළිඳ හා වැසිකිළි සඳහා ටෙන්ඩර්" යයි ලියා 1965 සැප්තැම්බර් මස 7 වැනිදා පෙරවරු 10 ට හෝ ඊට පෙර ටෙන්ඩර මණ්ඩලයේ සභාපති වෙත ලැබෙනසේ එවිය යුතුයි.

(5) ටෙන්ඩර් ලිවිය යුත්තේ මොනරාගල දිස්ත්‍රික්කයේ දිසාපතිගෙන් ලබාගත හැකි ආකෘති පත්‍ර වලය.

(6) භාණ්ඩාගාරයෙහි හෝ කච්චේරියක රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත්‍ර හා අනිකුත් විස්තර, 1965 අගෝස්තු මස 30 වැනි දින කායභීල වේලාවන් තුලදී මොනරාගල දිස්ත්‍රික්කයේ දිසාපතිගෙන් ලබාගත හැක.

පියදාස බමුණුසිංහ,
මොනරාගල දිසාපති වෙනුවට.

දිසාපති කායභීලය,
මොනරාගල, 1965.8.6.

8–135—65.8.6 වැනි දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

---

## පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

1965/66 මුදල් වර්ෂය තුළදී (1) අනුරාධපුරය, පොළොන්නරුව, සීගිරිය, යාපහුව, මිහින්තලය, දැදිගම, මැණික්දෙණ, රාජාංගනේ, මැදිරිගිරිය, දිඹුලාගල, හිඳගල, කුන්ඩසාලේ, හැබැස්ස, යාපනය, පෙරියකුළම, තිරියාය, පඬුවස්නුවර, ඇම්බැක්කේ, ගුරුදෙණිය, ගල්ගමුව, මාලිගාවිල (ඔක්කම්පිටිය) අම්බලන්තොට මගුල්මහ විහාරය, (ලහුගල), තිස්ස මහාරාමය, දීඝවාපිය (අම්පාරේ) සහ රජගල (ගල්ඔය) යන ස්ථානවල පිහිටි පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ වැඩපොළවල් වලට පොල් අතු, හුණු, වැලි, සක්කගල්, කඩාපු කළුගල්, බොරළු සහ ගඩොල් සැපයීම හා භාරදීම සහ (2) ඉහත කී ස්ථානවලට ලඟම ඇති දුම්රිය ස්ථානයේ සිට ලොරි/කරත්ත මගින් ද්‍රව්‍ය ප්‍රවාහණය කිරීම සඳහා කොළඹ 7, පුරාවිද්‍යා කොමසාරිස් තැන විසින් 1965 අගෝස්තු මස 26 වෙනි බ්‍රහස්පතින්දා දවල් 12.00 තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. පුරාවිද්‍යා කොමසාරිස්තැනගෙන් ලබාගත හැක ටෙන්ඩර් ආකෘති පත්‍ර පිටපත් දෙකකින් යුක්තව එවිය යුතුයි. එක එක ස්ථානය සඳහා ටෙන්ඩර් ඇප මුදල වශයෙන් රුපියල් 20 බැගින් එවිය යුතු අතර, 1965 අගෝස්තු 25 වෙනි බදාදා පස්වරු 3 තෙක් ඉහත සඳහන් ස්ථාන සඳහා ටෙන්ඩර් ආකෘතිපත්‍ර නිකුත් කරනු ලැබේ. මෙම ඇප මුදල කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් හෝ මෙම කාර්යාලයට පැමිණ හෝ පුරාවිද්‍යා කොමසාරිස්තැන නමට මනි ඕඩරයක්/පෝස්ටල් ඕඩරයක් එවීමෙන් හෝ ගෙවිය හැක.

3. වැඩිපුර විස්තර පුරාවිද්‍යා කොමසාරිස්තැනගෙන් ලබාගත හැක.

චාල්ස් ගොඩකුඹුරේ,
පුරාවිද්‍යා කොමසාරිස්.

මගේ අංකය : ඇස්.ඇස්/62 (ඊ) 65/66.
1965 ජූලි මස 28 වැනි දින,
කොළඹ—7,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේදී.

8–112—65.8.6 දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

---

## කිරි මණ්ඩලය

### කාලසීමාව ඉක්මගිය විටාමිල්ක් ළදරු කිරි පිටි තොගයක් විකිණීම

පහත සඳහන්, කාලසීමාව ඉක්මගිය විටාමිල්ක් ළදරු කිරි පිටි ප්‍රමාණයන් විකිණීම සඳහා කිරි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරි විසින් 1965 සැප්තැම්බර් මස 8 වෙනි බදාදා පස්වරු 2.30 දක්වා ටෙන්ඩර පත්‍ර භාරගනු ලැබේ.

කොටස් I රාත්තල් 1 කේ ටින් 20 ක්

කොටස් II රාත්තල් 2 1/2 රේ ටින් 9,755 ක්

කොටස් III රාත්තල් 5 හේ ටින් 5 ක්

1. මේවා සෙනසුරාදා දිනවල පෙරවරු 8.30 සිට පස්වරු 1 දක්වාද, සතියේ අනික් රාජකාරී දිනවල පෙරවරු 8.30 සිට පස්වරු 4.30 දක්වාද සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ වැලිසර ගබඩාවේදී පරීක්‍ෂා කළ හැකිය.

2. ටෙන්ඩරකරුවන් විසින් ලිපිවලින් ටෙන්ඩර කළයුතුය. ලිපි සීල් තැබූ කවරවල දමා "කාලසීමාව ඉක්මගිය විටාමිල්ක් ළදරු කිරි පිටි මිලට ගැනීම සඳහා ටෙන්ඩර" යනුවෙන් කවරයේ පිට වම්පස ඉහළ කෙළවර සඳහන් කළ යුතුය. ටෙන්ඩර් පත්‍රවල සංශෝධන හෝ වෙනස්කිරීම් හෝ තිබේ නම් ඒවා ටෙන්ඩර කරුවන් විසින් සහතික කළයුතුය.

3. 1965 සැප්තැම්බර් මස 8 වැනි දින පස්වරු 2.30 ට පෙර කිරි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරිට ලැබෙනසේ ලියා පදිංචි කළ තැපෑලෙන් ටෙන්ඩර එවිය යුතුය. අතින් බාරදෙන ටෙන්ඩර සීල් තැබූ කවරවල බහා නාරාහේන්පිට, කිරි මණ්ඩලයේ ප්‍රධාන ගණකාධිකාරී තැනගේ කාමරයේ ඇති ටෙන්ඩර පෙට්ටිය තුලට දැමිය යුතුයි.

4. 1965 සැප්තැම්බර් මස 8 වැනි බදාදා පස්වරු 2.30 ට ටෙන්ඩර පත්‍ර විවෘත කරන හෙයින් ඒ අවස්ථාවේ සිටීමට කැමති ටෙන්ඩර කරුවන් කිරි මණ්ඩලයේ ප්‍රධාන ගණකාධිකාරි තැනගේ කායභීලයට පැමිණිය යුතුයි.

5. රුපියල් 100 ක ටෙන්ඩර තැන්පත් මුදලක් කිරි මණ්ඩලයේ සරප් කාර්යාලයට ගෙවා ඒ වෙනුවෙන් ලබාගන්නා කුවිතාන්සිය ටෙන්ඩර පත්‍රයේ අමුණා එවිය යුතුයි.

6. ටෙන්ඩරකරුවන් විසින් ඒ ඒ කොටස් සඳහා වෙන් වශයෙන් මිළ ගණන් සඳහන් කළ යුතුය.

7. කිසිම ප්‍රශ්න කිරීමක් නොමැතිව යම්කිසි ටෙන්ඩර පත්‍රයක් හෝ සෑම ටෙන්ඩර පත්‍රයක්ම හෝ ප්‍රතික්ෂේප කිරීමට කිරි මණ්ඩලයට බලය පැවරී ඇත. දැන්වීමෙහි සඳහන් සියලුම කොන්දේසිවලට අනුකූල නොවන ටෙන්ඩර පත්‍ර භාර නොගනු ලැබේ.

8. ටෙන්ඩර පත්‍ර පිළිගත් බව සඳහන් දැන්වීම ලැබුණු දින සිට සතියක් තුලදී පිළිගත් ටෙන්ඩරකරු විසින් ටෙන්ඩර කරන ලද මුදල කිරි මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීට සම්පූර්ණයෙන් ගෙවිය යුතුයි. තවද එසේ මුදල් ගෙවූ දින සිට තෙදිනක් තුලදී මෙම විටාමිල්ක් ළදරු කිරි පිටි තොග සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ වැලිසර ගබඩාවෙන් ඉවතට ගෙන යා යුතුයි. මේ කාලසීමාව තුළදී ඉවතට ගෙන නොයන ලද්දේ නම් කිරි මණ්ඩලයේ වගකීම් අවසාන වන්නේ ය.

9. අටවැනි ඡේදයේ සඳහන් කොන්දේසිවලට යටත් නොවන ටෙන්ඩරකරුවන්ගේ තැන්පත් මුදල කිරි මණ්ඩලය සතුවේ.

10. වැඩි විස්තර කිරි මණ්ඩලයේ මාණ්ඩලික සහකාර (සැපයුම්) තැනගෙන් ලබාගත හැක.

ෆිලික්ස් සෙනෙවිරත්න,
සාමාන්‍යාධිකාරී,
කිරි මණ්ඩලය.

කිරි මණ්ඩලීය මූලස්ථානය,
තැ. පෙ. 1155,
නාරාහේන්පිට,
කොළඹ 5, 1965.7.24.

8–144—65.8.6 දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය

### කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ඩීසල් ඉංධනවලින් ක්‍රියා කරණ වතුර පොම්පයක් සැපයීම සඳහා ටෙන්ඩර්

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, යාන්ත්‍රික අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1965 අගෝස්තු මස 27 වැනි දින පස්වරු 2.30 වන තෙක් ඩීසල් ඉංධනවලින් ක්‍රියා කරණ වතුර පොම්පයක් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. පෝර්මකොළ පේරාදෙණියේ යාන්ත්‍රික අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැන වෙත රුපියල් 10 ක ඇප මුදල් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පමණක් ලබාගත හැක. වැඩි විස්තර සඳහා මෙම ගැසට් පත්‍රයේ ඉංග්‍රීසි දැන්වීම බලන්න.

ඩී. සී. එල්. අමරසිංහ,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

පේරාදෙණිය,
1965 ජූලි මස 27 වැනි දින.

8–36—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කාර්යාලීය "ටෙන්ඩර්" මණ්ඩලයේ සභාපතිතැන විසින් අඟල් 1½ කළුගල් කියුබ් 500 ක් එඬේරමුල්ලේදී සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1965 සැප්තැම්බර් මස 3 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා භාර ගනු ලැබේ. එදිනම පස්වරු 2.30ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවනට එහි පැමිණිය හැක.

2. ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමට පෙර ඉහත සඳහන් සේවාවන් බාරගෙන සාර්ථක අන්දමින් කරගෙන යාමට මුදල් අතින් හැකියාවක් තිබෙන බව පෙන්වීමට ටෙන්ඩර්කරුවන් විසින් [illegible]වශ්‍ය ලියවිලි ඉදිරිපත් කළ යුතුයි.

3. ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල [illegible] රුපියල් 50 සහ ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10ක්ද [illegible]ළඹ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරිගේ කාර්යාලයේ තැන්පත් කර ලබාගත් රිසිට් පත්‍ර පහත සඳහන් ඉංජිනේරුතැන වෙත 1965 අගෝස්තු 20 වැනි දින පස්වරු 4ට පෙර ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම ලබාගත හැකිය

මේ සඳහා තවත් විස්තර හා ටෙන්ඩර් පෝර්මද කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු තැනගේ කාර්යාලයෙන් ලබාගත හැකිය.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරුතැන, ල.දු.දෙ.

තැ. පෙ. අංක 370,
කොළඹ, 1965.8.2 වැනි දින.

8–19[illegible]—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1965 ඔක්තෝබර් මස 1 වැනිදා සිට 1966 සැප්තැම්බර් මස 30 වැනිදා දක්වා (දෙදින ඇතුළුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට දුම්රිය ස්ථානවල/සෞඛ්‍ය කාර්යාලවල සිට කිරි මධ්‍යස්ථානවලට පිරිසිදු එළකිරි ගෙන යාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරිතැන විසින් භාරගනු ලැබේ.

2. (අ) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—රු. 100ක තැන්පත් මුදලක් මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

(ආ) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ ගාල්ල, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුර සහ වව්නියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරීන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පතට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් පෝර්ම් සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ සැළකිය යුතු කාලයකට පළමු, තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දැන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—එහා මෙහා ගෙන යා යුතු පිරිසිදු එළකිරි ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උප ලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, අනුරාධපුර'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස ඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම මගේ ලේකම් ගණකාධිකාරි මහතාට දීමෙන් ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙළ කර ගැනීමට හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරනලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු, මා විසින් නියම කරන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්[illegible] යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපො[illegible] වන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දැන ගත යුතුවාත් හැර පිළිපැදිය යුතු ද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තව දුරටත් විස්තර දැන ගැනීම සඳහා මෙහි දෙවන ඡේදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම්පත්‍රයක් මගින් පුලුවන.

ජී. ඊ. ගජනායක,
සෞඛ්‍ය සේවා අධිකාරි තැන,
අනුරාධපුරය.

1965 ජූලි මස 26 වැනි දින,
අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දීය.

### උපලේඛනය

| (1) සේවය | (2) ප්‍රදේශය | (3) ප්‍රමාණය පයින්ට් | (4) අවසාන දිනය |
|---|---|---|---|
| අනුරාධපුර දුම්රිය පොලේ සිට අනුරාධපුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය දක්වාත් එතැන් සිට අනුරාධපුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... ... | අනුරාධපුර ... | 9,000 ... | 1.9.65 |
| ත්‍රිකුණාමලය දුම්රිය පොළේ සිට ත්‍රිකුණාමල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලය දක්වාත්, එතැන් සිට ත්‍රිකුණාමල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ පාලනය යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... ... | ත්‍රිකුණාමලය | 6,000 ... | 1.9.65 |
| කැකිරාව දුම්රිය පොලේ සිට කැකිරාව සෞඛ්‍ය කාර්යාලය දක්වාත්, එතැන් සිට කැකිරාව සෞඛ්‍ය කාර්යාලයාධිපති තැන යටතේ පවත්නා කිරි මධ්‍යස්ථානවලට ... ... ... ... | කැකිරාව ... | 3,450 ... | 1.9.65 |

8–62/1—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිටිකිරි සහ සීනි එහා මෙහා ගෙනයාම

1965 ඔක්තෝබර් 1 වෙනිදා සිට 1966 සැප්තැම්බර් 30 වෙනිදායින් අවසන් වන වර්ෂය තුළ මේ සමඟ ඇති උපලේඛනයේ ටෙන්ඩර් පිළිබඳ විස්තර දක්වා ඇති පිටිකිරි සහ සීනි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්ගේ කාර්යාලවල සහ ගබඩාවල සිට/සෞඛ්‍ය කාර්යාල භාර නිලධාරි තැනගේ පාලනය යටතේ පවත්නා කාර්යාල සහ ගබඩාවල සිට දිස්ත්‍රික් පරිපාලකවරයින්ගේ කාර්යාල සහ ගබඩාවල සිට/දුම්රිය සථානවල සිට/පිටිකිරි සහ සමුපකාර සංගම්වල සිට/සීනි, කිරි මධ්‍යස්ථානවලට උපලේඛනයේ සඳහන් එක් එක් සේවය සඳහා වෙන වෙනම සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර, අනුරාධපුර සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම්වලින් භාරගනු ලැබේ.

2. (I) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයෙහි දෙවන ඡේදයේ සඳහන් පරිදි රු. 100ක තැන්පත් මුදලක්, මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

(II) ටෙන්ඩර් පත්‍ර බාර ගැනීමේ අවසාන දිනට කලින් දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය, වව්නියාව සහ ගාල්ල යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට කලින් ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කමේ විස්කර.**—ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ සැළකිය යුතු කාලයකට කලින් තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරිනට හෝ දැන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක. වත්කමේ විස්කර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දැන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—එහා මෙහා ගෙන යා යුතු පිටිකිරි සහ සීනි දළ වශයෙන් දැන ගැනීමට මේ සමග ඇති උපලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා ''සෞඛ්‍ය සේවා අධිකාරි, අනුරාධපුරය'' කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවන් සඳහාද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහාන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ලේකම්/ගණකාධිකාරී මහතාට දීමෙන් හෝ ඒ ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙනු උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයෙහි, පෙරවරු 10ට ටෙන්ඩර් පත් බාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වූවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කටයුතු පිළියෙළ කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිතයකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම් එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ නොදෙනු ලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මා විසින් නියම කරන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන්, එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් හැර පිළිපැදිය යුතු ද වන්නේය.

11. **වෙනත් විස්තර.**—තව දුරටත් විස්තර දැන ගැනීම සඳහා මෙහි දෙවන ඡේදයෙහි සඳහන් කුමන කාර්යාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුලුවන.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
අනුරාධපුරය,
1965 ජූලි 26 වැනි දින.

ජී. ඊ. ගජනායක,
සෞඛ්‍ය සේවා අධිකාරි.

### උපලේඛනය

| 1 සේවය | 2 ප්‍රදේශය | 3 පිටිකිරි හා සීනි ප්‍රමාණය දළ වශයෙන් පිටිකිරි හො. | සීනි හො. | 4 අවසන් දිනය සහ වේලාව |
|---|---|---|---|---|
| 1. ත්‍රිකුණාමලය දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ ත්‍රිකුණාමලයේ සමුපකාර සංගමයේ සිට සීනි, ත්‍රිකුණාමලයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයට සහ ත්‍රිකුණාමලයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට ගෙන යාමට | ත්‍රිකුණාමලය... | 45 | 16 | ... 1.9.65 පෙරවරු 10 ට |
| 2. අනුරාධපුර දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ අනුරාධපුරයේ සමුපකාර සංගමයේ සිට සීනි, අනුරාධපුරයේ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කාර්යාලයට සහ අනුරාධපුර සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට ගෙන යාමට | අනුරාධපුරය ... | 28 | 10 | ... 1.9.65 පෙරවරු 10ට |
| 3. කැකිරාව දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ කැකිරාව සමුපකාර සංගමයේ සිට සීනි, කැකිරාවේ සෞඛ්‍ය කාර්යාලයාධිපති තැනගේ කාර්යාලයට සහ සෞඛ්‍ය කාර්යාලයාධිපතිතැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට ගෙන යාමට | කැකිරාව... | 30 | 11 | ... 1.9.65 පෙරවරු 10 ට |
| 4. අනුරාධපුර දුම්රිය ස්ථානයේ සිට පිටිකිරි සහ කහටගස්දිගිලිය සමුපකාර සංගමයේ සිට සීනි, කහටගස්දිගිලිය සෞඛ්‍ය කාර්යාලයාධිපති තැනගේ කාර්යාලයට සහ සෞඛ්‍ය කාර්යාලයාධිපති තැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානයට ගෙන යාමට | කහටගස්දිගිලිය | 9 | 3 | ... 1.9.65 පෙරවරු 10 ට |

8–62/2—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### කොළඹ රෝහල් මණ්ඩලය—කිළිටි රෙදි සේදීම

**සේවය සහ ටෙන්ඩර්කරුවන්ගේ සුදුසුකම්.**—1965 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1966 සැප්තැම්බර් 30 වන දයින් (දින දෙකක් ඇතුළුව) අවසන් වන වර්ෂය තුළ, මෙහි පහත සඳහන් උප ලේඛනයේ පළමු වැනි වගන්තියෙහි දක්වා තිබෙන ආයතනයන්හි කිළිටි රෙදි සේදීම සඳහා ලාංකිකයන් සහ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් තැන්පත් මුදල්.**—(I) මෙම උප ලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට, කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම් වලට ද තැන්පත් මුදල් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්ලිය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි කළ අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(II) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් ද ආයතනයන් භාර වෛද්‍ය නිලධාරීන්ගෙන් ද ටෙන්ඩර් පෝර්ම ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක් වත් භාර ගනු නො ලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි.

ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබා ගන්න ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුයි.

3. **වත්කම් විස්තරය.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමට සැළකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු ආයතන භාර වෛද්‍ය නිලධාරියාට හෝ දන්විය යුතුය. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ දෙවන කොටසේ සඳහන් ඕනෑම තැනකින් ලබා ගත හැක.

වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නො හැකි වීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **සෝදන කෑලි ප්‍රමාණය පිළිබඳ විස්තර.**—දළ වශයෙන් මාසයකට සේදිය යුතු කෑලි ප්‍රමාණය මේ සමඟ ඇති උප ලේඛනයෙහි 5 වැනි වගන්තියෙහි දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා "කොළඹ රෝහල් මණ්ඩලයේ අධිකාරි" කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවට ද යන්න පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම, එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම ගණකාධිකාරි/ලේකම් මහතාට (හෝ මාහට) දීමෙන් ඒ ලැබුණු බවට ඔහු/හෝ මවිසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියා පදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උප ලේඛනයේ 6 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ අසල සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින අයැදුම්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමඟ කටයුතු පිළියෙළ කර ගැනීම හෝ මවිසින් බලය පවරනු ලැබූ නියෝජිත යෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායෙන් පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමු වන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවසරයක් නොවේ නම්, එහි සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසා හෝ එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උප ලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැන ගත යුතුවාත් හැර, පිළිපැදිය යුතු ද වන්නේය.

11. **අනික් විස්තර.**—(I) කොන්ත්‍රාත්කරුවන්ට ගබඩා, විදුලි බලය, ජලය ආදී පහසුකම් සැලැස්වුවහොත් ඊට යන වියදම් ආදිය පළාතේ ආදායම් පාලක නිලධාරි තුමා තක්සේරු කළ ගණන්වලට අනුව වවුචරයෙන් කපා ගනු ලැබේ.

(II) **කිළිටි රෙදිවල විෂ බීජ නැති කිරීම සහ එහා මෙහා ගෙන යාමේ වියදම්.**—යම් අවස්ථාවක කිළිටි රෙදි සේදීමට පළමු ඒවායේ විෂ බීජ නැති කිරීම සඳහා වෙන ස්ථානයකට ගෙන යෑමට සිදු වුවහොත් ඒවා එහා මෙහා ගෙන යෑමට කිසිම ගාස්තුවක් ගෙවනු නොලැබේ.

(III) **පළාත් පාලන මණ්ඩලවල පිහිටා ඇති ආයතනයන් සඳහා ටෙන්ඩර්.**—පළාත් පාලන මණ්ඩල තුළ ඇති ආයතනයකට ටෙන්ඩර් ඉදිරිපත් කළ හැක්කේ, ඒ ඒ මණ්ඩලවල නීතිවලට අනුව (නීති ඇතොත්) රෙදි පිරිසිදු කරන ස්ථාන හිමි අයට පමණි.

(IV) ටෙන්ඩර්කරුවන්ට වුවමනා නම් කොටසක් හෝ සෑම කොටසක්ම ඒවා නියමිත තැන්පත් මුදල බැඳීමෙන් පසු සඳහන් කළ හැකිය.

ඩී. ඒ. ජයසිංහ,
කොළඹ ආරෝග්‍යශාලා මණ්ඩලයේ අධිකාරි.

කො. ආ. ම. අධිකාරි කාර්යාලය,
මහ රෝහල, කොළඹ.

## උපලේඛනය

| 1<br>ආයතනය | 2<br>ටෙන්ඩර් තැන්පත් මුදල<br>රු. ශ. | 3<br>ඇප මුදල<br>රු. ශ. | 4<br>මසකට රෙදි සේදිය යුතු වාර ගණන | 5<br>මසකට සේදිය යුතු කෑලි ගණන සාමාන්‍ය | 6<br>ටෙන්ඩර් භාර ගැනීම අවසාන වන දිනය හා වේලාව |
|---|---|---|---|---|---|
| (1) රෝගෝපසම නිවස, තලගොල්ල, රාගම ... | 25 0 ... | 400 0 ... | 3 ... | 4,500 | 65.8.24 පෙ. ව. 10.00 ට |
| (2) උණ රෝහල, අංගොඩ ... ... | 100 0 ... | 400 0 ... | 4 ... | 3,500 | |

8–92—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—බදුල්ල කොට්ඨාශය

### ජාතික කිරි ව්‍යාපාරය — කිරි පිටි සහ සීනි එහාමෙහා ගෙන යාම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1965 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1966 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා දෙදින ඇතුළුව කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට දුම්රියපලවල සිට කිරි පිටිත්, සමූපකාර සංගම්වල සිට සීනිත් එම ආයතනයන්හි සිට කිරි මධ්‍යස්ථානවලට එම කිරි පිටි සහ සීනි ගෙන යාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර බදුල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි කායඨාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—රු. 100ක තැන්පත් මුදලක් මා නමට ඕනෑම කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කායඨාලයෙන් හෝ අනුරාධපුරය, කුරුණෑගල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන සෞඛ්‍ය සේවා අධිකාරී වරුන්ගේ කායඨාලවලින් හෝ ලබාගත හැකි නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා කැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත්‍ර වේලාසනින් එවිය යුතුය.

3. **වත්කම් විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දනට කොන්ත්‍රාත්තුවක් දරණ අය ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා පෝර්ම ඉහත පෙනෙන තුන්වන ඡෙදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නො හැකි වීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—එහා මෙහා ගෙන යා යුතු කිරි පිටි සහ සීනි ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට මේ සමග ඇති උපලේඛණයෙහි 3 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා බදුල්ල සෞඛ්‍ය සේවා අධිකාරී කියා එවිය යුතුය. සීල් තබන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා ද යන්න පැහැදිළිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කායඨාලයයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ තමාම සෞඛ්‍ය සේවා අධිකාරී මහතාට දීමෙන් එය ලැබුණු බවට ඔහු විසින් නිකුත් කරනු ලබන කුවිතාන්සියක් ගැනීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් ලැබීමට සැලැස්විය හැක.

6. **ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛණයේ හතරවන තීරයේ සඳහන් දිනයන්හි පෙ.ව. 10ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන්වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ කියවනු ලැබේ. ඕනෑම ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කටයුතු පිළියෙල කර ගැනීම හෝ මා විසින් බලය පවරනු ලැබූ නියෝජිත යෙකුගේ අනුමැතිය ඇතිව හෝ ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවෙනි ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සනු තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂ අවස්ථාවක් නොවේ නම් එහි සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

9. **තැන්පත් මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු අවශ්‍ය ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

10. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර් කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දන ගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතු ද වේ.

11. **වෙනත් විස්තර.**—තවදුරටත් විස්තර දන ගැනීම සඳහා තුන්වන ඡෙදයේ සඳහන් කුමන කායඨාලයකින් හෝ ඉල්ලුම් පත්‍රයක් මගින් පුළුවන.

එම්. කණගරත්නම්,
බදුල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරී.

1965 ජූලි මස 31 දින, බදුල්ලේ,
සෞඛ්‍ය සේවා අධිකාරී කායඨාලයේ දී ය.

## උපලේඛනය

| සේවය | දෙමසකට වතාවක් සැපයියයුතු දළ ප්‍රමාණය — කිරි පිටි හො. කා. රා. | සීනි හො. කා. රා. | අවසාන දිනය |
|---|---|---|---|
| **බදුල්ල** | | | |
| 1. බදුල්ල දුම්රිය පොළේ සිට කිරි පිටිත්, බදුල්ල මයිලගස්තැන්න සමූපකාර සංගමයේ සිට සීනිත් බදුල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරිතැනගේ කායඨාලයයටත්, එම කිරි පිටි සහ සීනි සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි තැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථාන වලට ... ... ... ... | 55 0 0 ... | 21 0 15 ... | 1965.8.23 පෙ.ව. 10ට |
| **බිබිල** | | | |
| 2. බදුල්ල දුම්රිය පොළේ සිට කිරි පිටිත් පහල ඌව බිබිල සමූපකාර සංගමයේ සිට සීනිත්, බිබිල සෞඛ්‍ය කායඨාලයය භාර නිලධාරිතැනගේ කායඨාලයයටත් එම කිරි පිටි සහ සීනි එම සෞඛ්‍ය කායඨාලයයේ සිට බිබිල සෞඛ්‍ය කායඨාලයය භාර නිලධාරිතැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට ... ... | 80 0 0 ... | 28 2 0 ... | 1965.8.23 පෙ.ව. 10ට |
| **කොස්ලන්ද** | | | |
| 3. හපුතලේ දුම්රිය පොළේ සිට කිරි පිටිත්, මහපලාත සමූපකාර සංගමයේ (බණ්ඩාරවෙල) කොස්ලන්ද සෞඛ්‍ය නිලධාරිතැනගේ කාර්යාලයටත්, එම කිරි පිටි සහ සීනි එම සෞඛ්‍ය කායඨාලයයේ සිට කොස්ලන්ද සෞඛ්‍ය නිලධාරිතැනගේ කොට්ඨාශයේ පිහිටි කිරි මධ්‍යස්ථානවලට ... ... ... | 25 2 0 ... | 12 2 23 ... | 1965.8.23 පෙ.ව. 10ට |

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### බදුල්ල සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1965 ඔක්තෝබර් 1 වැනි ද සිට 1966 සැප්තැම්බර් 30 වැනිද දක්වා (දින දෙකම ඇතුලත්ව) කාලය තුළ මේ සමග ඇති උපලේඛණයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන් යන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර බදුල්ලේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙනඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උප ලේඛණයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල් මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් සහ විවිධ සේවා සංගම්වලට අයිති සමිති වලට ද, තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිළිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් ලබාගත හැක. නියමිත ආකෘති පත්‍රයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේ දී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර් කරුවන්ට ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගෙන ඒවා අවසාන දිනයට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි ආකෘති පත්‍ර සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල් වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් ආකෘති පත්‍ර සඳහා ඉල්ලුම් කිරීමේ දී ටෙන්ඩර් පත් භාරගැනීමේ අවසාන දිනට සෑළකිය යුතු කාලයකට පෙර තම වත්කම මට හෝ තමා ටෙන්ඩර්පත්‍ර ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා ආකෘති පත්‍ර ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විභා පැමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමි වන්ට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දනගැනීමට මේ සමග ඇති උපලේඛණයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරි, බදුල්ල " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කළ යුතුයි. කවරෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරී ලේකම්ට බාර දෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් බාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙණෙන උපලේඛණයේ 4 වැනි තීරයේ සඳහන් දිනයන්හි පෙ.ව. 10.00 ට ටෙන්ඩර් පත්‍ර භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් ෆෝර්මයේ " බී " උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල් අනුවය. එසේ වුවත් ටෙන්ඩර් ෆෝර්මයෙහි " සී " උපලේඛණයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අයකිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොළේ පවතින මිළ ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම් කරනු ලැබේ.

8. **ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම් කිසි ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනයක ම විසින් හෝ බලය පවරනු ලැබූ මාගේ නියෝජිතයකු ගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡෙදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛණයේ 3 වැනි තීරයෙහි සඳහන් වන ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුයි.

11. **බඩු බාහිරාදිය තබාගැනීම.**—තෝරාගත් ටෙන්ඩර් කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම් තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. රෝගීන්ට සහ සේවකයන්ට ආහාර සැපයීමට අවශ්‍ය සහල් ප්‍රමාණය එක් අයෙකුගේ සලාකයක පදනම මත ඒ ඒ ආයතන භාර නිලධාරීන් මගින් නියෝජ්‍ය ආහාර කොමසාරිස් විසින් සතිපතා ලබා ගැණීමට අවසර පත් නිකුත් කරනු ඇත.

13. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේ ය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ද ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුය.

වෛද්‍ය එම්. කණගරත්නම්,
සෞඛ්‍ය සේවා අධිකාරි, බදුල්ල.

1965 ජූලි මස 28 දින, බදුල්ලේ,
සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයයේ දී ය.

### උප ලේඛනය

| 1 ආයතනය | 2 ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල් රු. | ශ. | 3 ඇප මුදල රු. | ශ. | 4 ටෙන්ඩර් බාරගන්නා අවසාන දිනය හා වේලාව | 5 ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට: මාළු | මස් | කරවල | එළවළු | නොගෙවන ලෙඩුන්ට: මාලු | මස් | කරවල | එළවළු | කිරි |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1. අළුත්නුවර රෝහල | 100 | 0... | 800 | 0... | | 600... | 600... | 600... | 2,450... | 1,650... | 1,650... | 1,700... | 6,800... | — |
| 2. බණ්ඩාරවෙල රෝහල | 100 | 0... | 1000 | 0... | ... | 400... | 400... | 450... | 2,000... | 1,900... | 1,400... | 1,900... | 12,700... | — |
| 3. කොස්ලන්ද රෝහල | 100 | 0... | 800 | 0... | (1965.8.20 ... | 400... | 450... | 450... | 2,000... | 1,550... | 1,800... | 1,850... | 8,000... | 400 |
| 4. මඩුල්සිම රෝහල | ...100 | 0... | 800 | 0... | (දින පෙ. ව. ... | 350... | 300... | 350... | 1,400... | 1,700... | 1,700... | 1,900... | 7,500... | — |
| 5. මහඔය රෝහල | ...100 | 0... | 700 | 0... | (10.00 දක්වා)... | 450... | 450... | 450... | 1,800... | 1,000... | 1,000... | 1,000... | 4,200... | — |
| 6. මැදගම රෝහල | ...100 | 0... | 800 | 0... | ... | 250... | 250... | 250... | 1,000... | 1,550... | 1,650... | 1,600... | 6,500... | — |
| 7. සියඹලාණ්ඩුව රෝහල | 100 | 0... | 600 | 0... | ... | 350... | 400... | 400... | 1,700... | 850... | 800... | 950... | 3,600... | — |

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—යාපනය කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1965 ඔක්තෝබර් 1 වෙනිද සිට 1966 සැප්තැම්බර් 30 වෙනිද දක්වා (දින දෙකම ඇතුළුව) කාලය තුළ, මේ සමඟ ඇති උපලේඛනයේ පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් හෝ එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර යාපනයේ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාර ගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුය.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වෙවා එවැනි ඉල්ලුම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වව්නියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්‍යාලවලින් හෝ ලබා ගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම් ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලන කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කම් විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේදී ටෙන්ඩර් පත්‍ර අවසාන දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම් මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. ඒ සඳහා උවමනා පෝර්ම ඉහත සඳහන් දෙවන ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීමට හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් පත්‍ර එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරී, යාපනය " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ලේකම්තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුන බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබා ගත යුතුයි.

6. **ටෙන්ඩර් පත්‍ර භාර ගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උප ලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හිදී පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේදී දී කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුව හොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමඟ කලින් පිළියෙළ කර ගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතුව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකියි.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පොරමයේ " බී " උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිල ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි " සී " උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අයකිරීමට අදහස් කරන මිල ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් නම් ඒවා පාලන මිල ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිල ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිල ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයේහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුල ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර්කරුවන් විසින් සැළකිය යුතුය.

සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලය,
යාපනය, 1965.7.30

ඇස්. රාසරත්නම්,
සෞඛ්‍ය සේවා අධිකාරී, යාපනය.

### උපලේඛනය

| (1) ආයතනය | (2) තැන්පත් මුදල | (3) ඇප මුදල | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය | (5) ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් — සේවකයන්ට — මාළු | හරක් මස් | කරවල | එළවළු | රෝගීන්ට — මාළු | හරක් මස් | කරවල | එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රුපියල් | රුපියල් | | | | | | | | | |
| | | | 1965.8.27 | | | | | | | | |
| මල්ලාවි ග්‍රා. රෝ. | 100 | 600 | උදේ | මෙය ඇඳන් 40 ක නව ආයතනයකි. | | | | | | | |
| කරදූර් මා. නි. | 100 | 300 | 10.00 ට | 600 | — | — | 800 | 100 | — | — | 100 |

8-125/1—1965.8.6 වැනි දින අංක 41,472 දරණ ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—යාපනේ කොට්ඨාශය

### පිසූ ආහාර සැපයීම—යාපනේ හෙදි ඇබෑසි විදුහල

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුස්සන් සහ සේවාව.**—වර්ෂ 1965 ඔක්තෝබර් මස 1 වන දින සිට 1966 සැප්තැම්බර් මස 30 වන දින දක්වා (දින දෙකම ඇතුලත්ව) කාලය තුල යාපනයේ හෙදි ඇබෑසි විදුහලට පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන, සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර යාපනය වෛද්‍ය අධිකාරි කාර්යාලයේ දී වෛද්‍ය අධිකාරි තැන විසින් භාර ගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල ඔහු නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය. අනුමත කරන ලද ග්‍රාමසංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුලත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිති වලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලුම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියා පදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් ආකෘති පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දහවල් 12 වන තුරු යාපනය වෛද්‍ය අධිකාරි කාර්යාලයෙන් ඉල්ලුම් පත් ලබා ගත හැක. ටෙන්ඩර් පත්‍ර තැපැල් මගින් ඉල්ලීමේදී ටෙන්ඩර් පත් භාරගැනීමේ අවසාන දිනට පෙර ඉදිරිපත් කිරීමට හැකි වනසේ, කල් වේලා ඇතුව ඉල්විය යුතුයි. ටෙන්ඩර් ෆෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කල බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි.

3. **වත්කම් විස්තර.**—සියලුම ටෙන්ඩර් කරුවන්, ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලීමට පෙර සහ ටෙන්ඩරය අවසන් දිනට සැළකිය යුතු කාලයකට පෙර තම තමන්ගේ වත්කම් ගැන යාපනය රෝහලේ වෛද්‍ය අධිකාරි වෙත දැන්විය යුතුයි. මීට නියුතු ආකෘති පත්‍ර ඔහුගේ කාර්යාලයෙන් ලබාගත හැක. වත්කම් විස්තර ඉදිරිපත් කිරීමට හෝ මුදල් පිළිබඳ තත්වය ඔප්පු කිරීමට නොහැකි වුවහොත් ටෙන්ඩරය සඳහා තැන්පත් මුදල අහිමිවීමට ඉඩ තිබේ.

4. **සැපයිය යුතු ආහාර ප්‍රමාණයන්.**— දළ වශයෙන් මේ සමඟ ඇති උපලේඛනයේ 5 වන තීරයේ දක්වා ඇත.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පිටපත් දෙකකින් යුක්තව කවරයක බහා "වෛද්‍ය අධිකාරි, මහා රෝහල, යාපනය" කියා එවිය යුතුයි. සීල් තබනලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිලිව සඳහන් කල යුතුවාක් මෙන්ම එහි වම් පස පහත කෙළවරේ ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කල යුතුයි. කවරයෙහි බහාලන ලද ටෙන්ඩර් පත් යාපනයේ වෛද්‍ය අධිකාරි කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියා පදිංචිකල තැපෑලෙන් ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව යාපනය මහ රෝහලේ වෛද්‍ය අධිකාරිට හෝ රෝහල් ලේකම් තැනට භාර දෙනේ නම්, එම පත්‍රිකා ලැබුණු බවට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත සඳහන් උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දින පෙරවරු 10ට ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන්වූ වහාම ඒවා යාපනය රෝහලේ වෛද්‍ය අධිකාරි කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවට ටෙන්ඩර් කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිල ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරනලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරු කර ගැනීමට මා සමඟ කලින් පිළියෙල කරගත් දිනක ඔහු විසින් හෝ බලය පවරනු ලැබූ ඔහුගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ අනු පිටපත් පරීක්ෂා කීල හැක.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර් කරු විසින් ෆෝර්මයේ සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිල ගණන් අනුව ඒ සඳහා වියදම් වල මුලු මුදල අනුවය. එසේ වුවද ටෙන්ඩර් ෆෝර්මයේ 'බී' උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අයකිරීමට අදහස් කරන මිල ගණන් සඳහන් කල යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිල ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිල ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිලක් පවතී නම් එම පාලන මිල ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයන්හි සඳහන් මිළ ගණන් වළංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන්, මෙහි පළමුවන ඡේදයෙහි සඳහන් වන කාල සීමාව ඉකුත් වන තුරු වලංගු වේ. කොන්ත්‍රාත් කරුගේ අත්සන් තබන ලද ගිවිසුම් පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැත්නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුල වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරා ගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු ගිවිසුමට අත්සන් කල යුතුය.

11. **බඩු ගබඩා කිරීමට ඉඩකඩ.**—තෝරා ගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩාකර තැබීම සඳහා ආයතනයෙහි හෝ එහි පිහිටි ඉඩම් තුළ ඉඩ කඩ සලසා දෙනු ලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර් ඉල්ලීමට බලාපොරොත්තු වන අය එම කොන්දේසි කියවා මනාසේ වටහාගෙන ඊට අනුකූලව ක්‍රියා කල යුතුයි. එමෙන්ම, ටෙන්ඩර් පත්‍රයේ අඩංගු ගිවිසුමේ කොන්දේසි ද වටහා ගත යුතුයි.

ඇස්. රාසරත්නම්,
සෞ. සේවා අධිකාරී,
යාපනය.

සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
යාපනය,
1965.7.27.

### අදාල උපලේඛනය

| (1) ආයතනය | | (2) ටෙන්ඩර් තැන්පත් | | (3) ඇප තැන්පත් | | (4) ටෙන්ඩර් අවසාන දිනය හා වේලාව | | (5) ඉතා කිට්ටු ආහාර ගණන | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | අළුත් මාළු | එළු මස් | කරවල | කුකුල් මස් | එළවළු |
| | | රු. ශ. | | රු. ශ. | | | | | | | | |
| යාපනයේ හෙදි ඇබෑසි විදුහල | ... | 25 0 | ... | 800 0 | ... | 65.8.27 පෙ.ව. 10.00 ට | ... | 28,000 | 3,600 | 7,300 | 3,600 | 7,300 |

8-125/2—1965.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### බඩු බාහිරාදිය ප්‍රවාහණය සඳහා ටෙන්ඩර් කැඳවීම—1965–67—කෑගල්ල කොට්ඨාශය

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසු පුද්ගලයන් හා සේවය.**—1965.10.1 දින සිට 1967.9.30 දක්වා කාලය තුළ පහත සඳහන් ආයතනවල සිට දුම්රිය ස්ථානවලටද, දුම්රියස්ථානවල සිට ආයතනවලටද බඩු බාහිරාදිය ප්‍රවාහනය කිරීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික වෙළඳ ආයතනයන්ගෙන් හෝ සමුපකාර සංගම්වලින් හෝ ටෙන්ඩර් කෑගල්ල සෞඛ්‍ය සේවා අධිකාරි විසින් භාරගනු ලැබේ.

**2. ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල.**—(අ) කෑගල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි නමින් ලඟම පිහිටි කච්චේරියේ රු. 100 ක මුදලක් තැන්පත් කර කුවිතාන්සියක් ලබා ගත යුතුය. මෙහි පහත සඳහන් එක් එක් කාණ්ඩය සඳහා වෙන වෙනම ටෙන්ඩර් තැන්පත් මුදල් බැඳිය යුතුය.

(ආ) අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියා පදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා, එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිති වල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුයි.

**3. ටෙන්ඩර් පත්‍ර.**—පහත සඳහන් සෞඛ්‍ය සේවා අධිකාරින්ගේ කවුරුන් විසින් හෝ 1965 අගෝස්තු 31 වැනිද දවල් 12 දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ:—

| | | | | |
|---|---|---|---|---|
| අනුරාධපුරය | කොළඹ | කළුතර | කුරුණෑගල | පුත්තලම |
| මඩකලපුව | ගාල්ල | මහනුවර | මාතලේ | බදුල්ල |
| යාපනය | කෑගල්ල | මාතර | වවුනියාව | රත්නපුරය |

(අ) මුදල් තැන්පත් කළ බවට කුවිතාන්සියක් එවන තුරු හෝ ඉදිරිපත් කරන තුරු, හෝ

(ආ) ටෙන්ඩර් අපේක්ෂිත අයදුම්කරු විසින් වත්කම පිළිබඳව අත්සන් කරන ලද ප්‍රකාශනයක් එවන තුරු හෝ ඉදිරිපත් කරන තුරු හෝ ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු නොලැබේ.

**4. වත්කම් පිළිබඳ තොරතුරු.**—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත් දරන හෝ නැති හෝ හැම ටෙන්ඩර්කරුවකු විසින්ම වත්කම පිළිබඳව තොරතුරු සැපයිය යුතුය. මේ සඳහා අදාල ආකෘති පත්‍ර කලින් ලබාගත යුතුය.

**5. බඩුබාහිරාදියේ තක්සේරු කරන ලද ප්‍රමාණයන්.**—අපේක්ෂිත ටෙන්ඩර්කරුවන්ගේ දැනගැනීම පිණිස එක් අවුරුද්දකට ප්‍රවාහනය කළ බඩු බාහිරාදියෙහි ආසන්නතම මෙම ප්‍රමාණයන් මෙම කාර්යාලයෙහි තබා ඇත. එක් බර ප්‍රමාණයක් යටතේ ගිය අවුරුද්දේ බඩුබාහිරාදිය ප්‍රවාහනය කර නැති අවස්ථාවන් සඳහා පසුගිය අවුරුදුවල දී ප්‍රවාහනය කළ බඩුබාහිරාදියෙහි සංඛ්‍යා ලේඛන ඇතුළත් කර ඇත.

**6. ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතු අයුරු.**—ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙකකින් පිළියෙල කර කෑගල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරීන් වෙතට ලිපිනය ලියන ලද එක කවරයක බහා මුද්‍රා තබා යැවිය යුතුය. කුමන සේවයක් සඳහාද යන්න කවරයේ වම් කෙළවරේ උඩ කොණෙහිත්, ටෙන්ඩර් කරුගේ නම හා ලිපිනය කවරයේ වම් පැත්තේ පහළ කොණෙහිත් සඳහන් කළ යුතු වේ. පහත සඳහන් එක් එක් කාණ්ඩය වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පත්‍ර කෑගල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි බහාලිය හැකි අතර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයෙහි ලේකම්/ගණකාධිකාරි වෙත ලේඛන ගත තැපෑලෙන් යැවීමට හෝ පුද්ගලිකව භාරදීමට හෝ පුළුවන. එවිට ලේකම්/ගණකාධිකාරි ටෙන්ඩර් පත්‍ර ලැබුනු බවට කුවි තාන්සියක් නිකුත් කරනු ලැබේ.

**7. ප්‍රවාහණය සඳහා ගාස්තු ප්‍රමාණය.**—පහත සඳහන් අයුරු තුන් පිළිවෙලට ම ගාස්තු ප්‍රමාණ සඳහන් කළ යුතු වේ:—

(අ) එක් එක් ගමනක් සඳහා සම්මත ගාස්තු ප්‍රමාණය;

(ආ) ප්‍රවාහණය කළ පෙට්ටි ගණන හෝ ප්‍රවාහණය කළ දුර ප්‍රමාණය හෝ ගැන නොසළකා හොණ්ඩරයකට සම්මත ගාස්තු ප්‍රමාණය;

(ඇ) බර ප්‍රමාණය අනුව ඇති එක් එක් අංශ සඳහා ගාස්තු ප්‍රමාණය.

ටෙන්ඩර් තෝරා ගැනීම කරනු ලබන්නේ වඩාත්ම රජයට හිතකර කරුණු පදනම් කරය.

**8. ප්‍රවාහණය කරන අයුරු.**—සේවය සඳහා යොදා ගන්නා වාහනය ටෙන්ඩර් කරු සතු එකක් විය යුතු අතර, එම වාහනයේ ලියා පදිංචි කළ අංකයත්, එහි බර ප්‍රමාණයත්, එයට ගෙන යා හැකි බර ප්‍රමාණයත්, එය කුමන වර්ගයේ වාහනයක්ද යන්නත් අනාවරණය කළ යුතුවේ. මෙම තොරතුරු අනාවරණය කිරීමට නොහැකි වුවහොත් ටෙන්ඩරය අවලංගු වේ.

**9. ටෙන්ඩර් භාරගැනීමේ අවසානය.**—1965 සැප්තැම්බර් 1 වෙනිද පෙරවරු 10 ට ටෙන්ඩර් භාර ගැනීම අවසන් වේ.

**10. ටෙන්ඩර් විවෘත කිරීම.**—ටෙන්ඩර් විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක. පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ට ඇසෙන සේ ටෙන්ඩර්කරුවන්ගේ නම්ද, ගාස්තු ප්‍රමාණයන්ද කියවනු ලැබේ. ටෙන්ඩර් කරුවෙකුට ටෙන්ඩරයක් පරීක්ෂා කර බැලීමට උවමනා වුව හොත් කෑගල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරින් සමග හෝ ඔහුගේ බලය ලත් නියෝජිතයකු සමග හෝ කලින් යොද ගෙන ඉදිරිපත් කර ඇති ඕනෑම ටෙන්ඩරයක අනුපිටපතක් පරීක්ෂා කර බැලීමට ඉඩදෙනු ලැබේ.

**11. ටෙන්ඩර් සඳහා අනිකුත් කොන්දේසි.**—ටෙන්ඩර් පත්‍රයෙහි දෙවැනි පිටුවෙහි මේවා සඳහන් වන බැවින් පරීක්ෂාකාරීව කියවා බලා අදල අවස්ථා වන්හිදී ඒ අනුව ක්‍රියා කළ යුතුය.

**12. ටෙන්ඩර් භාරගැනීම.**—(අ) සම්මත ආකෘති පත්‍රයෙහි පිළියෙල කර නොමැති, හෝ (ආ) සියළුම ටෙන්ඩර් අවශ්‍යතාවයන් සම්පූර්ණ නොකළ හෝ කිසිම ටෙන්ඩරයක් සලකා බලනු නොලැබේ.

කරුණු නොදක්වා ඕනෑම ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර සියල්ලම හෝ ප්‍රතික්ෂෙප කිරීමේත්, ටෙන්ඩරයක් මුළුමනින්ම හෝ එහි කොටසක් හෝ භාර ගැනීමේත්, සඳහන් කළ කාලයට අඩු කාලයක් සඳහා හෝ භාර ගැනීමෙත් අයිතිවාසිකම රජය වෙතම තබාගනු ලැබේ.

### පළමුවන ඡේදයෙහි සඳහන් ආයතනවල දුම්රිය ස්ථානවල හා බාහිර බඩු ගබඩාවල නාමාවලිය

| ලඟම ඇති දුම්රිය ස්ථානය හෝ බාහිර බඩු ගබඩාව | ආයතනයේ නම | දු.ප. හෝ බාබ. ග. සිට දුර | අනුමත කර ඇති දින ගණන |
|---|---|---|---|
| | **I කාණ්ඩය** | | |
| මීරිගම ... | අල්ගම මාතෘ නිවාසය ... | 10 ... | 1½ |
| අඹේපුස්ස ... | වරකාපොල පර්යන්ත ආයතනය | 4 ... | 1 |
| | වරකාපොල සෞඛ්‍ය කාර්යාලය | 4½ ... | 1 |
| | නියදුරුපොල මධ්‍යම බෙහෙත් හල ... ... | 9 ... | 1 |
| අලව්ව ... | මහපල්ලේගම ග්‍රාම රෝහල ... | 10 ... | 1½ |
| | බෙලිගල මධ්‍යම බෙහෙත් හල... | 10 ... | 1½ |
| | නෙලුන්දෙනිය මධ්‍යම බෙහෙත් හල ... ... | 6 ... | 1 |
| පොල්ගහවෙල ... | උඩුගොඩ රෝහල ... | 19 ... | 1½ |
| | කෙහෙල්වත්ත මධ්‍යම බෙහෙත් හල ... ... | 17 ... | 1½ |
| | මකුද්දල මාතෘ නිවාසය ... | 5½ ... | 1 |
| | කඳුපිටපත්තු මාතෘ නිවාසය ... | 12 ... | 1½ |
| | පිංදෙනිය මධ්‍යම බෙහෙත් හල... | 16 ... | 1½ |
| | හෙට්ටිමුල්ල මාතෘ නිවාසය ... | 10 ... | 1 |
| | ගන්කුන මධ්‍යම බෙහෙත් හල... | 23 ... | 2 |
| | මීනුවන්ගමුව මධ්‍යම බෙහෙත් හල ... ... | 11 ... | 1 |
| | කෑගල්ල රෝහල ... | 8 ... | 1 |
| | කෑගල්ල සෞඛ්‍ය වෛද්‍ය නිල ධාරි ... ... | 8 ... | 1 |
| | කෑගල්ල සෞඛ්‍ය සේවා අධිකාරි | 8½ ... | 1 |
| | දන්ත චිකිත්සාගාරය කෑගලු විදු හල ... ... | 9 ... | 1 |
| | දන්ත චිකිත්සාගාරය බණ්ඩාර නායක මහ විදුහල හෙට්ටි මුල්ල ... ... | 10 ... | 1 |
| රඹුක්කන ... | වැලිගමුව මාතෘ නිවාසය ... | 3 ... | 1 |
| | කරඳුපොන මධ්‍යම බෙහෙත් හල | 6 ... | 1 |
| | රඹුක්කන රෝහල ... | ½ ... | 1 |
| | බැද්දේවල මධ්‍යම බෙහෙත් හල | 5 ... | 1 |
| කඩුගන්නාව ... | හෙම්මාතගම රෝහල ... | 16 ... | 1½ |
| | මාවනැල්ල පර්යන්ත ආයතනය | 7 ... | 1½ |
| | අරණායක රෝහල ... | 12 ... | 1½ |
| | දන්ත චිකිත්සාගාරය, මාවනැල්ල මහ විදුහල ... | 6½ ... | 1½ |
| | **II වෙනි කාණ්ඩය** | | |
| අවිස්සාවේල්ල ... | අමිතිරිගල මධ්‍යම බෙහෙත් හල | 5 ... | 1 |
| | දෙහිඕවිට සෞඛ්‍ය වෛද්‍ය නිල ධාරි ... ... | 6 ... | 1 |
| | කරවනැල්ල රෝහල ... | 9 ... | 1 |
| | යටියන්තොට මධ්‍යම බෙහෙත් හල ... ... | 13 ... | 1½ |
| | දෙරණියගල රෝහල ... | 14 ... | 1½ |
| | බුලත්කොහුපිටිය මාතෘ නිවාසය | 19 ... | 1½ |
| | කිතුල්ගල රෝහල ... | 19 ... | 3 |
| | දේදුගල මධ්‍යම බෙහෙත් හල... | 26 ... | 3 |
| | කොටියාකුඹුර මධ්‍යම බෙහෙත් හල ... ... | 18 ... | 2 |
| | බස්නාගල මධ්‍යම බෙහෙත් හල | 25 ... | 1½ |
| පරකඩුව ... | හිගුරලාකන්ද මාතෘ නිවාසය ... | 10 ... | 1 |

ඩී. ඒ. තාමෝදරම්,
කෑගල්ලේ සෞඛ්‍ය සේවා අධිකාරි.

කෑගල්ල, 65.7.29.

8–130—1965.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—බෙහෙත් ද්‍රව්‍ය විකිණීම

පහත සඳහන් බෙහෙත් බඩු විකිණීම සඳහා 1965 අගෝස්තු මස 30 වෙනි දින පෙරවරු 10 තෙක් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂක (සැපයීම්) 355, ඩීන්ස් පාර, කොළඹ 10, විසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. ඉහත ඡෙදයේ සඳහන් දිනයේ හා වේලාවේ දී ටෙන්ඩර් විවෘත කිරීමේ දී, ටෙන්ඩර් කරුවන්ට පැමිණීමට හැකිවනු ඇත.

3. ටෙන්ඩර් කරුවන් තමන් විසින්ම පිළියෙල කර ගත් ටෙන්ඩර් දෙකකින් යුතුව "බෙනසතීන් පෙනිසිලින්" විකිණීම සඳහා 1965.8.30 වෙනි දින පෙරවරු 10 ට නියමිත ටෙන්ඩරය" යනුවෙන් සඳහන් කොට දන්වීමක් කළ වහාම ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා කෙටි දන්වීමකින් බඩු ඉවත් කර ගන්න බවට පොරොන්දු විය යුතුය. බෙහෙත් ද්‍රව්‍ය මරදානේ, ප්‍රින්සිස් පාරේ ඇති රජයේ බෙහෙත් ගබඩාවේදී, කලින් දැනුම් දීමෙන් දිනයක් යොදා ගැනීමෙන් පසු පරීක්ෂා කිරීමට හැකිවෙනු ඇත.

4. මේ විකිණීම පිළිබඳව වැඩි විස්තර දැනගැනීමට අවශ්‍ය වේ නම් කොළඹ රජයේ බෙහෙත් ගබඩාවේ, අධිකාරීගෙන් ලබා ගත හැක.

| විෂය | ප්‍රමාණය | සැදීම සහ තත්වය | ඇසුරුම් |
|---|---|---|---|
| සෑම කුප්පියකම ඒකක ලක්ෂ 1.2 ප්‍රමාණයක් අඩංගු බෙනසතීන් පෙනිසිලින් බී.පී. | රබර් මූඩි සවි කරණ ලද කුප්පි 80,000 ... | බී.පී. "පෙනිලැන්ට් නොවෝ" ඔරිජින් ඩෙන්මාර්ක් | මුහුදින් ගෙන යෑමට යෝග්‍ය පෙට්ටි තුළ අවසන් වරට අසුරන ලද කුප්පි 100 ක් බැගින් අඩංගු පෙට්ටි. |

සැලකිය යුතුයි.—ජෙනරල් සුපිරින්ටෙන්ඩන්ට්ස් සමාගමෙන් නිකුත් කරන ලද වර්ග්‍ය පිළිබඳ සහතිකයද ඉදිරිපත් කළ හැක.

ඩී. ඒ. ඒ. මුණසිංහ,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ (සැපයීම්) වෙනුවට.

1965.7.31.

8-126—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව—මන්නාරම උප කොටස

(i) යෝධවැව ව්‍යාපාරය යටතේ ජුබිලි පාරේ 1 වෙනි සැතැප්මට ගල් සහ තාර දැමීම

(ii) ගංවතුරට කැඩීගිය යෝධවැව වාන අලුත්වැඩියා කිරීම

අංක 14,444 සහ 65.7.9 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළ කරණ ලද (i) යටතේ වැඩේ "යෝධවැව ව්‍යාපාරය යටතේ ජුබිලි පාරේ 1 වෙනි සැතැප්මට ගල් සහ තාර දැමීම" මා විසින් අවලංගු කරන ලදී.

සී. පූපාලසිංගම්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
මන්නාරම උප කොටස.

මුරුන්කන්,
65.7.26.

8-27—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ මුද්‍රණාලය

### තුත්තනාගම් ලයිනිං, තුත්තනාගම් කැබලි හා තුත්තනාගම් කුඩු මිලයට ගැනීම සහ ඉවත් කරගැනීම

බොරැල්ලේ, ආණ්ඩුවේ මුද්‍රණාලයේ තිබෙන, තුත්තනාගම් ලයිනිං රාත්තල් 560ක් තුත්තනාගම් කැබලි රාත්තල් 670ක් හා තුත්තනාගම් කුඩු රාත්තල් 448ක් මිලයට ගැනීම සහ ඉවත් කර ගැනීම සඳහා, කවරයෙහි උඩ වම් කොනෙහි, "තුත්තනාගම් ලයිනිං ආදිය මිලයට ගැනීම සඳහා ටෙන්ඩරය" යන්න ලියා රෙජිස්ටර් තැපෑලෙන් එවනු ලබන සීල් කරන ලද ටෙන්ඩර් 1965 අගෝස්තු 24 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 වනතුරු කොළඹ, බොරැල්ලේ ආණ්ඩුවේ මුද්‍රණාලයේ, ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් භාරගනු ලැබේ. රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන ටෙන්ඩර්, ආණ්ඩුවේ මුද්‍රණාලයේ ප්‍රධාන කාර්යාලයෙහි ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතුය.

2. බොරැල්ලේ ආණ්ඩුවේ මුද්‍රණාලයේදී භාරගැනීම සඳහා, තුත්තනාගම් ලයිනිං, තුත්තනාගම් කැබලි හා තුත්තනාගම් කුඩු සඳහා රාත්තලකට වෙන් වෙන් වශයෙන් මිළ ගණන් ඉදිරිපත් කළ යුතුය.

3. බොරැල්ලේ, ආණ්ඩුවේ මුද්‍රණාලයෙහි රුපියල් පණහක් තැන්පත් කර ලබා ගන්නා ලද කුවිතාන්සියක්, ටෙන්ඩර් ෆෝරම් ලබා ගැනීමේදී ඉදිරිපත් කළ යුතුය.

4. 1965 අගෝස්තු 23 දින දවල් 12 වන තුරු ටෙන්ඩර් ෆෝරම් නිකුත් කරනු ලැබේ.

5. සෙනසුරාදා දිනවල හැර, සතියේ ඕනෑම දිනක පෙ. ව. 9 සිට ප. ව. 4 දක්වා මෙම දෙපාර්තමේන්තුවේදී මේ ද්‍රව්‍ය බැලිය හැක.

6. ටෙන්ඩර්කරුවන්ට ඕනෑම එක ද්‍රව්‍යයක් හෝ කැමති නම් ද්‍රව්‍ය සියල්ලම හෝ ඉල්ලිය හැක. නමුත් එක් එක් ද්‍රව්‍යයට වෙන වෙනම මිළ ගණන් සඳහන් කළ යුතුය.

7. කොළඹ, බොරැල්ලේ ආණ්ඩුවේ මුද්‍රණාලයේ ප්‍රධාන කාර්යාලයේදී 1965 අගෝස්තු 24 වැනි දින පෙරවරු 9.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලබනවිට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට ඉඩ දෙනු ලැබේ.

8. නොපිළිගනු ලබන ටෙන්ඩරයක් වුවොත් ඒ සඳහා වූ තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ.

9. ටෙන්ඩරය පිළිගනු ලැබූ බව දැන්වූ දින සිට දින හතක් ඇතුලත සම්පූර්ණ වටිනාකම ගෙවා ද්‍රව්‍ය ඉවත් කර ගැනීමට ටෙන්ඩරය ලබාගත් අය අපොහොසත් වුවහොත් කිසිම අයිති වාසිකමක් වත් නොමැතිව ටෙන්ඩරය සඳහා වූ තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1965 ජූලි 30 දින,
කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයේ දීය.

8-106—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ මුද්‍රණාලය

### මුද්‍රණ ලෝහ මණ්ඩි Metal Dross මිලයට ගැනීම සහ ඉවත් කර ගැනීම

ආණ්ඩුවේ මුද්‍රණාලයේ දළ වශයෙන් ටොන් 10 ක් පමණ ඇති මුද්‍රණ ලෝහ මණ්ඩි මිලයට ගැනීම සහ ඉවත් කර ගැනීම සඳහා මුද්‍රා තබා රෙජිස්ටර් තැපෑලෙන් එවනු ලබන ටෙන්ඩර් කොළඹ, බොරැල්ලේ ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් 1965 අගෝස්තු 31 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් බහා මුද්‍රා කරන ලද කවරයේ වම් කෙළවරේ උඩ "මුද්‍රණ ලෝහ මණ්ඩි මිලයට ගැනීම සහ ඉවත් කරගැනීම" යන්න ලියා තිබිය යුතුය. රෙජිස්ටර් තැපෑලෙන් නොඑවන ටෙන්ඩර් ආණ්ඩුවේ මුද්‍රණාලයේ ප්‍රධාන කාර්යාලයේ ඒ සඳහා තබා ඇති පෙට්ටියට බහාලිය යුතුය.

2. බොරැල්ලේ, ආණ්ඩුවේ මුද්‍රණාලයෙන් භාරගන්නා ටොන් එකක මිළ වශයෙන් සඳහන් කළ යුතුය.

3. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 50 ක් කොළඹ, බොරැල්ලේ ආණ්ඩුවේ මුද්‍රණාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත.

4. 1965 අගෝස්තු 30 වැනි සඳුදා දවල් 12 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

5. ලෝහවල ආදර්ශයන් සෙනසුරාදා දිනයන් හැර සතියේ කවර දිනක හෝ පෙරවරු 9 සිට පස්වරු 4 දක්වා මේ දෙපාර්තමේන්තුවේදී බැලිය හැක.

6. වැඩිම මිල ගණන සඳහන් වන ටෙන්ඩරය භාරගැනීමේ අයිතිය ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති සතුවනවා ඇත.

7. ටෙන්ඩර් පත්‍ර 1965 අගෝස්තු 31 වැනි දින පෙරවරු 9.30 ට කොළඹ, බොරැල්ලේ, ආණ්ඩුවේ මුද්‍රණාලයේ ප්‍රධාන කාර්යාලයේදී විවෘත කරන විට, ටෙන්ඩර් පත්‍ර කරුවන්ට පෙනී සිටීමට අවසර දෙනු ඇත.

8. නොපිළිගන්නා ටෙන්ඩර් පත්‍රවල තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

9. ටෙන්ඩරය පිළිගත් බව දැන්වූ දින සිට දින හතක් ඇතුලතදී මුළු මුදල ගෙවා ද්‍රව්‍යයන් ඉවත් කර ගැනීමට ජයග්‍රාහක ටෙන්ඩර්කරු අපොහොසත් වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල කිසිම හිමිකමක් නොලැබෙන පරිදි රාජසන්තක කරනු ඇත.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1965 අගෝස්තු 3 වැනි දින,
කොළඹ, ආණ්ඩුවේ මුද්‍රණාලයේ දී ය.

8-224—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## ගල්ඔය සංවර්ධන මණ්ඩලය

ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ සභාපති විසින්, ටෙන්ඩරයේ කොන්දේසි අනුව, චවලකඩේ සහල් මෝලෙහි වී, සහල් අතුරු නිෂ්පාදන හා හිස්ගෝනි, (එනම්, පැටවීම, බෑම, කිරීම, මැනීම හා අට්ට ගැසීම) යනාදී කම්කරු සේවාවන් සඳහා රජයේ ලියා පදිංචි කළ සමූපකාර කම්කරු සමිති හා විවිධ සේවා සමූපකාර සමිතිවලින් 1965. 8. 23 වැනි දින සවස 2.15 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

වැඩි විස්තර හා ටෙන්ඩර් ආකෘති පත්‍ර ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ කල්මුනේ, චවලකඩේ සහල් මෝලේ කළමනාකාර තැනගෙන් 65.8.22 වැනි දින දවල් 12 දක්වා ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැක.

මේ කොන්ත්‍රාත්තුව 1965.10.1 වැනි දින සිට එක් වර්ෂයක කාලයකට පමණි.

1965.8.23 වැනි දින ප. ව. 2.15 ට ටෙන්ඩර් භාරගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර් පෙට්ටිය විවෘත කරනවා ඇත. ටෙන්ඩර් ලේඛන ගත කිරීමට විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවනට හෝ ඔවුන්ගේ බලය ලත් නියෝජිතයෙකුට පැමිණ සිටීමට හැක.

අත්සන් කළේ : එන්. ජේ. අලගියවන්න,<br>
ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ<br>
ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙනුවට.

1965.7.27 වෙනි දින අම්පාරේ,<br>
මණ්ඩලීය කාර්යාලයේ දීය.

8-210—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## සමූපකාර තොග වෙළඳ සංස්ථාව—රථ වාහන දෙපාර්තමේන්තුව

### බඩු බෑම පැටවීම හා ප්‍රවාහනය

පහත සඳහන් නගරවල පිහිටා ඇති සතොස ගබඩාවන් හා දුම්රිය බඩු ගබඩා අතර බඩු බෑම, පැටවීම හා ප්‍රවාහනය සඳහා සමූපකාර සංවිධාන හා පිළිගත් ප්‍රවාහන කොන්ත්‍රාත්කරුවන්ගෙන් සීල් තබන ලද ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

මහනුවර<br>
කුරුණෑගල<br>
බදුල්ල<br>
යාපනය<br>
මාතර

ටෙන්ඩර් පෝර්ම හා අනිකුත් විස්තර 1965 අගෝස්තු 17 වැනි දින අ. භා. 12 ට හෝ ඊට පෙර, කොළඹ 10, මැක්ලම් පාරේ, අංක 85, දරන ස්ථානයේ පිහිටි ස තො ස ප්‍රවාහන හා මෝටර් රථ දෙපාර්තමේන්තුවේ කළමණාකාර තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැකිය.

1965 අගෝස්තු 17 වැනි අඟහරුවාදා අ. භා. 12ට ටෙන්ඩර් භාරගැනීම අවසන් කරනු ලැබේ.

සාමාන්‍යාධිකාරී.<br>
සමූපකාර තොග වෙළඳ සංස්ථාව,

21, වැක්ෂෝල් වීදිය,<br>
කොළඹ 2,<br>
1965. 7 27.

8-91—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## සමූපකාර තොග වෙළඳ ආයතනය

**කොළඹ නගර සහ සීමාව තුළ සහ වැලිසර පිහිටි ස. තො. ස. බඩු ගබඩා වෙත කොළඹ වරායේ සිට බඩු ප්‍රවාහන කිරීම සහ බෑම**

ඉහත සඳහන් කටයුත්ත කිරීම සඳහා ලියා එවන ටෙන්ඩර 1965 අගෝස්තු 11 වෙනි දින අ. භා. 2 වනතෙක් කොළඹ 2, වොක්ස්හෝල් වීදියේ 21 දරණ ස්ථානයේ ස. තො. ස. ප්‍රධාන කළමනාකාර මහතා විසින් බාරගනු ලැබේ.

අවශ්‍ය සේවා කටයුතු (ඒ) ප්‍රවාහන කිරීමට පමණක් (බී) බඩු බාරගන්නා ස්ථානවලට ප්‍රවාහන කර බෑම සහ අඩුක්කු කිරීම ඇතුළත් වේ. ප්‍රවාහන කිරීමට ඇති බඩු :—ආහාර ද්‍රව්‍ය, ග්‍රෝසරි බඩු, නිවසට අවශ්‍ය බඩු, යකඩ බඩු, විදුලි භාණ්ඩ රෙදිපිළි ආදිය වේ.

පිළිගත් ප්‍රවාහන කොන්ත්‍රාත්කරුවන් එවන ටෙන්ඩර් පමණක් බාරගනු ලැබේ. වාප්පු වලින් බඩු ගෙන ගොස් පළපුරුද්දක් සහ දිගටම බාධාවක් නැතිව කාර්යක්ෂම සේවයක් ලබාදීම සඳහා ප්‍රමාණවත් ලොරි ප්‍රමාණයක් තිබෙන අය නම් වඩා හොඳයි.

වැඩි විස්තර සහ ටෙන්ඩර් පෝර්ම ටෙන්ඩර තැන්පත් මුදල් වශයෙන් රු. 250 ක් ගෙවා 1965 අගෝස්තු 11 වෙනි දින දවල් 12ට හෝ එදිනට පෙර කොළඹ 10, මැක්ලම් පාරේ 85 දරන ස්ථානයේ ස. තො. ස. ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ කළමනාකාර තැනගේ කාර්යාලයෙන් ලබා ගත හැක.

ප්‍රධාන කළමනාකරු,<br>
සමූපකාර තොග වෙළඳ ආයතනය.

21, වොක්ස්හෝල් වීදිය,<br>
කොළඹ 2.

8-1148—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**ආහාර පාලන දෙපාර්තමේන්තුවේ බෙදාහැරීමේ ගබඩාවල සිට ප්‍රදේශයේ පාසල් වෙත රාත්තල් 54රේ "ඇදිහැස" පිටි කිරි කාටන්ස් ගෙන ගොස් භාරදීම සඳහා කැඳවන ටෙන්ඩර්—1965/66**

රත්නපුර අධ්‍යාපන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් ඉහත සඳහන් සේවය සඳහා පිටපත් දෙකකින් යුත් ලාකඩ සීල් තබන ලද ටෙන්ඩර් පත්‍ර 1965 සැප්තැම්බර් 4 දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට පෙර අපේක්ෂක ටෙන්ඩර් කරුවන් විසින් යටත් පිරිසෙයින් රු. 15,000ක වටිනා නිශ්චල දේපල පිළිබඳව රත්නපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂකට පිළිගත හැකි සහතිකයක් ද, ටෙන්ඩර්කරුගේ නමට ලියාපදිංචි කර ඇති 1965 වර්ෂයට ලයිසන් කරන ලද ලොරි බලපත්‍රයක් ද ඉදිරිපත් කළ යුතුය. අනුමත කරන ලද සමූපකාර සමිති ග්‍රාම සංවර්ධන සමිති හා කම්කරු සමූපකාර සමිති මෙම වැඩය භාරගෙන කළ හැකි බවට ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම 1965 සැප්තැම්බර් 3 දින දවල් 12 තෙක් නිකුත් කරනු ලැබේ.

3. රත්නපුර අධ්‍යාපන කාර්යාලයෙන් ලබාගත හැකි මේ සඳහා නියමිත ටෙන්ඩර් පෝර්මවල පහත දක්වෙන එක් එක් සැපයීම් මධ්‍යස්ථාන සඳහා වෙන් වෙනම මෙකී සේවය සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට ප්‍රථම ටෙන්ඩර්කරුවන් විසින් රු. 50ක ඇප මුදලක් රත්නපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැන වෙත තැබිය යුතුය.

### සැපයීමේ මධ්‍යස්ථාන

1. රත්නපුර
2. කහවත්ත
3. ඔපනායක
4. ඇහැළියගොඩ

4. ටෙන්ඩර්කරුවන් ඉහත සඳහන් ආහාර පාලන දෙපාර්තමේන්තුවේ බෙදාහැරීමේ ගබඩාවල සිට "ඇදිහැස" පිටිකිරි සැපයෙන එම ප්‍රදේශයේ පාසල් වෙත පිටිකිරි ගෙනගොස් භාරදිය යුතු වේ. සාමාන්‍යයෙන් පාසල් වාරයකට එක් වාරයක් බෙදාහැරීම කළ යුතු යයි බලාපොරොත්තු වනු ලැබේ.

5. ටෙන්ඩර් පිළිබඳ විස්තර සහ වෙනත් අවශ්‍ය තොරතුරු රත්නපුර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ තැන වෙතින් ලබාගත හැකිය.

යූ. ඩී. අයි. සිරිසේන,<br>
රත්නපුර සහාය අධ්‍යාපන අධ්‍යක්ෂ.

1965.7.20,<br>
රත්නපුර අධ්‍යාපන කාර්යාලයේදීය.

8-1316/2—65.8.6 දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

## දැන්වීමයි

මෙම දෙපාර්තමේන්තුවට අයත් පහත සඳහන් භාණ්ඩ අළුත්වැඩියා කරවීම සඳහා ඉල්ලුම් පත්‍ර 1965. 8. 16 වැනි දින ප. ව. 3.30 දක්වා ම විසින් භාර ගනු ලැබේ. මෙම වාද්‍ය භාණ්ඩ අලුත්වැඩියා කිරීම සඳහා අවශ්‍ය උපකරණ ඉල්ලුම්කරුවන් විසින් ම සපයා ගත යුතු අතර, මෙම අලුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් තමන් අය කරන මුදල් ප්‍රමාණයත් ඒ ඒ භාණ්ඩ වෙනුවෙන් වෙන වෙනම දැන්විය යුතුය.

කොළඹ ඇල්බට් චන්ද්‍රවංකයේ පිහිටි උඩරට නැටුම් අංශයේ දී මෙම භාණ්ඩ සතියේ දිනවල පෙ. ව. 9.30 සිට ප. ව. 4 දක්වා ද සෙනසුරාදා දිනවල පෙ. ව. 9 සිට දහවල් 12 දක්වා ද පරීක්ෂා කළ හැකිය.

| | | | |
|---|---|---|---|
| (1) ගැටබෙර | ... | ... | 10 යි |
| (2) පහතරට බෙර | ... | ... | 5 යි |
| (3) උඩැක්කී | ... | ... | 12 යි |
| (4) දවුල් | ... | ... | 3 යි |
| (5) තම්මැට්ටම් | ... | ... | 2 යි |

ඇස්. බී. සේනානායක,
වැඩ බලන අධ්‍යක්ෂ.
ශ්‍රී ලංකා ජාතික කලායතනය.

1965. 8. 2,
කොළඹ 7, හෝර්ටන් පෙදෙස.

8–176—65.8.6. දින අංක 14,472 දරන ගැසට් පත්‍රය

---

## රජයේ වැඩ දෙපාර්තමේන්තුව

පොල්ගොල්ල රජයේ අභ්‍යාස විද්‍යාලයේ දීර්ඝ කිරීම් සහ වැඩි දියුණු කිරීම් (ඉතිරි වැඩ) සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, විරාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි රජයේ වැඩ, තැපැල් හා විදුලි සන්දේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1965 සැප්තැම්බර් මස 8 වෙනි බදාදා පෙරවරු 11,00 වනතෙක් භාරගනු ලැබේ.

2. මහනුවර ර. වැ. දෙපාර්තමේන්තුවේ නිර්මාණ/විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල්ද ඔහුගේ කාර්යාලයේ දී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1965 අගෝස්තු මස 20 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ර. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 3,45,000 ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළවිට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. ටෙන්ඩර් සඳහා තැන්පත් කළයුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ර. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

ඩබ්. එන්. ජී. වොට්සන්,
රජයේ වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ, රජයේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේදීය,
1965 අගෝස්තු 2.

8–184—65.8.6 වැනි දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටැන්ඩර්

## පොලිස් දෙපාර්තමේන්තුව

කොම්පඤ්ඤ වීදියේ පොලිස් නිරෝධායන කඳවුරේ
අයථා ආගමිකයින්ට පිසින ලද ආහාර සැපයීමේ ටෙන්ඩර්වල

ප්‍රතිඵල

(අ) ලත් ටෙන්ඩර්වල මුළු ගණන ... 7

(ආ) පිළිගත් ටෙන්ඩර්කරුගේ නම ... නාගුර් මීරා—ජයිනුල් අබ්ඩීන් මහතා
අංක 42,
කුමාර රත්නම් පාර,
කොම්පඤ්ඤවීදිය,
කොළඹ 2.

| | කෑම වේලක මිල ගණන රු. ශ. |
|---|---|
| (ඇ) පිළිගත් මිළ ගණන් ... ... | |
| (i) (අ) උදේ තේ ... ... | 0 15 |
| (ආ) දවල් කෑම : (i) දින 3 ක් තුළ එළවළු ව්‍යංජන දෙකක් සහ සම්බල් සමග බත් දින 2 ක් තුළ එළවළු ව්‍යංජන දෙකක් හා කරවල සමඟ බත්ද, | 0 30 |
| (ii) දින දෙකක් තුළ එළවළු ව්‍යංජන දෙකක් හා මාළු සමඟ බත් | 0 31 |
| (ඇ) සවස තේ හෝ කොපි ... ... | 0 04 |
| (ඈ) රාත්‍රී කෑම ... ... | 0 25 |
| (ii) රෝගීන්ගේ කෑම ... ... | 0 25 |

පොලිස් මූලස්ථානය,
කොළඹ 1.
1965.7.26 වැනි දින.

පොලිස්පති වෙනුවට,

8–40—65.8.6 වැනි දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

---

## ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

1965.6.11 දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය මගින් වාහන කීපයක් විකිණීම සඳහා කළ ටෙන්ඩර් කැඳවීම අනුව, පහත සඳහන් අයවලුන්ගෙන් ඉහලම ටෙන්ඩර් ලැබින. ඒ අනුව එකී අයවලුන්ට එම වාහන විකුණන ලදී.

ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීම සඳහා මුදල් තැන්පත් කළ අයවලුන් තමන් වෙත නිකුත් කර ඇති කුවිතාන්සි ආපසු මෙම දෙපාර්තමේන්තුවට එවීමෙන් එම තැන්පත් මුදල් ආපසු ලබා ගන්නා මෙන් දන්වමි.

කාණ්ඩ 1

| | වාහන අංකය | | ටෙන්ඩර්කරුගේ නම | පිළිගන්නා මිළ රු. | ශ. |
|---|---|---|---|---|---|
| 1. | 4 ශ්‍රී 6763 | ක්‍රයිස්ලර් වැලියන්ට් | වෛද්‍ය එම්. ජේ. පී. ද සිල්වා මහතා | 30,792 | 0 |
| 2. | 4 ශ්‍රී 7835 | වොක්සොල් ක්‍රෙස්ටා | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | 30,000 | 0 |
| 3. | 4 ශ්‍රී 6808 | චවර්ලට් ඉම්පාලා | සීමාසහිත රෝලන්ඩ් සමාගම | 40,500 | 0 |
| 4. | 4 ශ්‍රී 7908 | නැෂ් රැම්බලර් | සීමාසහිත විලියම්ස් කොන්ෆෙක්ෂනරි | 24,001 | 0 |

කාණ්ඩ 2

| | වාහන අංකය | | ටෙන්ඩර්කරුගේ නම | පිළිගන්නා මිළ රු. | ශ. |
|---|---|---|---|---|---|
| 1. | 4 ශ්‍රී 8131 | ෆෝර්ඩ් ඇන්ග්ලියා | වී. ඊ. ද සිල්වා මහතා | 17,782 | 0 |
| 2. | 4 ශ්‍රී 7199 | ඔස්ටින් ඒ 60 | එස්. ආර්. පී. පුපුරාජ් මහතා | 30,333 | 95 |
| 3. | 4 ශ්‍රී 8186 | මොරිස් මිනිමයිනර් | කේ. රෝගස් පෙරේරා මහතා | 14,511 | 0 |
| 4. | 2 ශ්‍රී 8347 | ස්කෝඩා | දහම් වැලිවත්ත මහතා | 5,110 | 0 |
| 5. | 3 ශ්‍රී 3722 | මොරිස් ඔක්ස්ෆර්ඩ් | පී. ජේ. ගුණවර්ධන මහතා | 23,100 | 0 |
| 6. | 4 ශ්‍රී 8269 | මොරිස් මිනිමයිනර් | එන්. ඒ. ඇලපාත මහතා | 14,500 | 0 |
| 7. | 4 ශ්‍රී 8037 | ඔස්ටින් ඒ 7 | ලංකා සිමෙන්ති සංයුක්ත මණ්ඩලය | 16,550 | 0 |
| 8. | 4 ශ්‍රී 8097 | ට්‍රයම්ප් එස්ටේට් | එච්. එස්. ප්‍රනාන්දු මහතා | 16,300 | 0 |

කාණ්ඩ 3

| | වාහන අංකය | | ටෙන්ඩර්කරුගේ නම | පිළිගන්නා මිළ රු. | ශ. |
|---|---|---|---|---|---|
| 1. | 2 ශ්‍රී 5704 | විලිස් ජීප් | අයි. මරියාදෙරේ මහතා | 7,300 | 0 |
| 2. | 3 ශ්‍රී 7879 | විලිස් ස්ටේෂන් වැගන් | සමුපකාර තොග වෙළඳ ආයතනය | 12,100 | 0 |
| 3. | 3 ශ්‍රී 2667 | හෝල්ඩන් ස්පෙෂල් එස්ටේට් සෙඩාන් | ස.තො.සේ ආයතනය | 16,600 | 0 |

අංක 3 ශ්‍රී 5347 දරණ හම්බර් සුපර්සන්ප් කාරය හා 3 ශ්‍රී 8349 දරණ ෆෝර්ඩ් පැල්කන් කාරය සඳහා නැවත ටෙන්ඩර් කැඳවනු ලැබේ.

ඇස්. ඒ. පී. රූපසිංහ,
ගබඩා අධිකාරී,

8–97—65.8.6 වැනි දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

## ගල්ඔය සංවර්ධන මණ්ඩලය

| වැඩ විස්තර | ලැබුණු ටෙන්ඩර් ගණන | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් ටෙන්ඩර්කරුගේ යෝජනා |
|---|---|---|---|
| ඇසුරුම් පෙට්ටි සඳහා ලෑලි සැපයීම. මසකට සැපයිය යුතු වර්ග අඩි ප්‍රමාණය 15,000කි ... | ... නවයයි | ... ආර්. ඒ. සමරසේකර මහතා, වත්තේගම | ... වර්ග අඩි 1000ක් රු. 150 |
| බුසල් 2 1/2රේ හිස් ගෝනි | ... හයයි | එෆ්. ඇල්. වාස් මහතා | ... එකක් ශත 88 බැගින් මඩකලපුව දක්වා ප්‍රවාහනය කර දීම |
| පාවිච්චියට නොගන්නා ලද බත්තල් සහ ලාන්ච් එක | ... දෙකයි | ... කේ. තම්බිපිල්ලේ මහතා, ත්‍රිකුණාමල වරාය කම්කරු, එක්සත් සමූපකාර සමිති සංගමය | ... ලාන්ච් එක පමණක් රු. 1,352<br>බත්තල් හත පමණක් රු. 12,750 |

නන්ද අලගියවන්න,
ගල්ඔය සංවර්ධන මණ්ඩලයේ
ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති
වෙනුවට.

1965. 6. 22 වෙනි දින,
අම්පාරේ මණ්ඩලීය කාර්යාලයේ දීය.

8—209—65.8.6 දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

---

# බඩු බාහිරාදිය විකිණීම

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීමයි

බුරුත, හල්මිල්ල, පලු, රානේ, හුලන්හික් යන වශයෙන් කඳන් 143 කින් සමන්විත ඝන අඩි 1,485.9 ගොඩවල් 30 කින් යුත් දැව තොගයක් හා ඉරූ දැව ඝන අඩි 116.3 ගොඩවල් 2 කින් යුතු දැව තොගයක් 1965 අගෝස්තු මස 18 වෙනි බදාදා උදේ 10.00 ට කල්මුනේ මධ්‍යම දැව ගබඩාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන්ට දැව වෙන්දේසි කිරීමට පෙර පරීක්ෂාකර බැලිය හැක.

වැඩි විස්තර සඳහා පහත අත්සන් කරන මාගෙන් හෝ කල්මුනේ මධ්‍යම දැව ගබඩාකරුගෙන් විමසන්න.

කේ. අරුල්වෙල්වම්,
නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරී.

1965. 7. 23 දින,
මඩකලපුව,
දිසා වන කාර්යාලයේදීය.

8—180—65.8.6 දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුව

### දැව වෙන්දේසියේ විකිණීමයි

හල්මිල්ල කඳන් 42 කින් සමන්විත ඝන අඩි 382.5, ගොඩවල් 6 කින් යුත් දැව තොගයක් හා ඉරූ ලී කෑලි 43 කින් සමන්විත ගොඩවල් 1 කින් යුතු දැව තොගයක් 1965 අගෝස්තු මස 25 වෙනි බදාදා උදේ 10.00 ට මඩකලපුවේ මධ්‍යම දැව ගබඩාවේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ඉල්ලුම්කරුවන්ට දැව වෙන්දේසි කිරීමට පෙර පරීක්ෂාකර බැලිය හැක.

වැඩි විස්තර සඳහා පහත අත්සන් කරන මාගෙන් හෝ මඩකලපුවේ මධ්‍යම දැව ගබඩාකරුගෙන් හෝ විමසන්න.

කේ. අරුල්වෙල්වම්,
නැගෙනහිර දිසාවේ දිසා වන නිලධාරී,

1965. 7. 28 දින,
මඩකලපුව,
දිසා වන කාර්යාලයේදීය.

8—181—65.8.6 දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

---

## කැලෑ දෙපාර්තමේන්තුවේ වෙන්දේසියේ විකිණීම

පහත උප ලේඛනයේ සඳහන් බුරුත, හල්මිල්ල, හුලං හික්, රාණි හා පලු යන I, II, III, පන්තීන්ට අයත් කඳන් හා ඉරන ලද දැවද රීප්ප දික් අඩි 80,985 ක් ද මෙහි දක්වා ඇති දිනයන්හී ඒ ඒ ස්ථානයන්හිදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. වැඩි විස්තර මගෙන් හෝ ගබඩා පාලක නිලධාරීන්ගෙන් හෝ පැමිණ ලබාගත හැක.

ජ. ආ. ද සිල්වා,
දිසා වන නිලධාරි (උමැදි).

1965 ජූලි 27 දින,
ත්‍රිකුණාමලයේ,
දිසා වන කාර්යාලයේදී,

### උපලේඛනය

| වෙන්දේසි කරන ස්ථානය | තොග ගණන | දිනය හා වේලාව |
|---|---|---|
| (1) පොලොන්නරුව දැව ගබඩාව | ...ඉරූ ලී තොග 4යි ඝන අඩි 127.5<br>කම්බි කණු තොග 1යි | 65.8.16<br>පෙ.ව. 10.00 |
| (2) තලාව II දැව ගබඩාව | ...ඉරූ ලී තොග 3යි ඝන අඩි 339.9<br>කඳන් තොග 2යි ඝන අඩි 106.1<br>රීප්ප තොග 3යි දික් අඩි 77985 යි | 65.8.23<br>පෙ.ව. 10.00 |
| (3) තලාව I දැව ගබඩාව | ...ඉරූ ලී තොග 3යි ඝන අඩි 248.4<br>තේක්ක කණු තොග 1යි<br>රීප්ප තොග 1යි දික් අඩි 300යි | 65.8.23<br>ප.ව. 2.00 |
| (4) මැදවච්චිය දැව මෝල | ...ඉරූ දැව තොග 21යි ඝන අඩි 2547.2<br>කඳන් තොග 1යි ඝන අඩි 50.3 යි | 65.8.24<br>පෙ.ව. 10.00 |

8—182—65.8.6 දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

## කැලෑ දෙපාර්තමේන්තුව

### බුරුත කඳන් වෙන්දේසියෙන් විකිණීම

කැලෑ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ, මැක්ලම් පාර අද්දර පිහිටි කැළණිවැලි දැව ගබඩාවේ තිබෙන අපනයන කිරීමට සුදුසු ඝන අඩි 725.5 කින් සමන්විත බුරුත කඳන් (20) විස්සක්, 65.8.31 වන දින උදේ 10.30 ට එම ගබඩාවේදී, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසියෙන් දැව මිලදී ගැනීමට අදහස් කරන අය, වෙන්දේසියට කලින් එම ස්ථානයට ගොස් දැව පරීක්ෂාකර බලා දැවවල තත්ත්වය ගැන සෑහීමට පත් විය යුතුය.

සෑම තොගයක් සඳහාම වැඩිම ලංසුව තබන්නා එම විකිණීම අවසන් වූ වහාම දැව වල සම්පූර්ණ මුදල ගෙවිය යුතු අතර, දැව වෙන්දේසි කළ දින සිට රජයේ වැඩ කරන දින (3) තුනක් ඇතුළත දී දැව ඉවත්කර ගත යුතුය.

වැඩි විස්තර කොළඹ, වන සංරක්ෂකගේ කාර්යාලයෙන් හෝ කොළඹ කැළණිවැලි ගබඩාවේ, ගබඩාකරුගෙන් හෝ පැමිණ ලබා ගත හැක.

වී. ජෝ. වීරරත්න,
වැඩ බලන වන සංරක්ෂක වෙනුවට.

වන සංරක්ෂණ කාර්යාලයය,
තැ. පෙ. 509, කිව්පාර, කොළඹ 2,
1965 ජූලි 30 දින.

8–183—65.8.6 දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

---

## ලංකා කර්මාන්ත ප්‍රදර්ශනය

### තාවකාලික ගොඩනැගිලි, ගොඩනැගිලි ද්‍රව්‍ය හා දැව ගෘහභාණ්ඩ යනාදිය විකිණීමයි

තාවකාලික ගොඩනැගිලි, ගොඩනැගිලි ද්‍රව්‍ය හා දැව ගෘහභාණ්ඩ යනාදිය 1965 අගෝස්තු මස 17 වන අඟහරුවාදා පූර්වභාග 10 ට ප්‍රදර්ශන භූමියේදී වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසිය හමාර වනවාත් සමගම බඩු මිළයට ගන්නා එක් එක් අය විසින් ලබාගන්නා බඩුවල මුළු මුදලින් 50%ක් රජයේ වලංගු මුදලින් ගෙවිය යුතු වන්නේය.

වෙන්දේසි කිරීමට නියමිත බඩු 1965 අගෝස්තු මස 9 වන දින සිට 1965 අගෝස්තු මස 16 වන දින දක්වා (1965 අගෝස්තු මස 15 වන ඉරිදා හැර) සෑම දිනකම පූර්වභාග 10 සිට 12 දක්වා වේලාවන් තුළ පරීක්ෂා කළ හැක.

සියලු විස්තර පුද්ගලිකව අවුත් හෝ ලිපියකින් පහත අත්සන තැබෙන නිලධාරියාගෙන් ලබාගත හැක.

ආර්. ඩබ්ලිව්. ජේ. ඩබ්ලිව්. සේරසිංහ,
අධ්‍යක්ෂ,
කර්මාන්ත, ප්‍රදර්ශනය.

කර්මාන්ත ප්‍රදර්ශන කාර්යාලය,
තැ. පෙ. 277,
නව ග්‍රෑන්ඩ්ස්ටෑන්ඩ් ගොඩනැගිල්ල—1 වන මාලය,
රීඩ් මාවත, කොළඹ 7,
1965 අගෝස්තු.

8–104—65.8.6 දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

---

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

ලංකා ගමනාගමන මණ්ඩලයේ ගර්හිත බස් රථ 25 ක් කුරුණෑගල ලංගම දිශා කළමනාකාරතැනගේ කාර්යාල භූමිභාගයේදී 1965.8.16 වෙනි දින ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. වෙන්දේසිය පෙ. ව. 9.30 ට ආරම්භ වේ. මින් සමහරක ලියාපදිංචි කිරීම අවලංගු කර ඇති අතර, සමහරක ලියාපදිංචි කිරීම බලපැවැත්වේ. මෙම වාහන වෙන්දේසියේ එක් කොන්දේසියක් නම්, ඒවාට නැවත බොඩි ගැසූ පසු ඒවා මගීන් ගෙන යන බස් රථ හෝ ස්වේෂන් වැගන් රථ හෝ මගීන් ගෙන යන වෑන් රථ වශයෙන් පාවිච්චි කිරීමට නොව, හුදෙක්ම ලොරි වශයෙන් ලියාපදිංචි කළ යුතුය කියායි. එසේකුදු වුවත්, මිළට ගන්නා තැනැත්තාට ඉඳ හිටලා බස් රථ ධාවනය කිරීම සඳහා යෝග්‍යතා සහතික පත්‍රයක් තිබේනම්, ඔහුට සංචාරක මගීන් ගෙන යෑමට අවසර දෙනු ලැබේ.

එක් එක් බස් රථයේ වැඩිම ලන්සුකරුවා තමාගේ ලන්සුව වෙන්දේසිකරු විසින් පිළිගනු ලැබුව හොත් එක් බස් රථයකට රු. 1000ක් ය, වටිනාකමින් භාගයක් ය යන මේ දෙකෙන් අඩුම මුදල ලං. ග. ම. ය වෙත වහාම තැන්පත් කළ යුතුයි. ඉතිරි මුදල වෙන්දේසිය අවසන් වී දවස් තුනක් ඇතුළතදී ගෙවා, එතැන් සිට තවත් දවස් දෙකක් ඇතුළතදී වාහනය රැගෙන යා යුතුය.

කොන්දේසි කඩකරන්නවුන්ගේ තැන්පත් මුදල් අහිමි කරනු ලැබේ. එසේකුදු වුවත්, පිළිගත් ලන්සුකරුවා විසින් ඉහතකී කාල සීමාව ඇතුළතදී ඔහු විසින් මිළයට ගන්නා ලද බස් රථය/හෝ බස් රථ වෙනුවෙන් ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා වාහනය/හෝ වාහන ලංගම භූමි භාගයෙන් ඉවත්කර නොගත හොත්, එක් එක් දිනයකට බස්රථයකට රු. 10 බැගින් වූ ගාස්තුවක් බේරුම් ස්ථිමේ අලාභය වශයෙන් මණ්ඩලයට ගෙවීමට නියම කිරීමෙන් පසුව, ටෙන්ඩරය මණ්ඩලීය සභාපති මහතාගේ අභිමතය පරිදි එවැනි මුදල් ගෙවීමකට හෝ වාහනය ඉවත්කර ගැනීමකට අවසර දෙනු ඇත.

වෙන්දේසි දිනයට කලින් සතියේ ඕනෑම කාර්යාලසීය දිනයක පෙරවරු 8.30 සිට පස්වරු 4.30 දක්වා කාලය තුළදී කුරුණෑගල ලං. ග. ම. දිශා කළමනාකාර මහතා සමඟ නියම කර ගැනීමෙන් පසුව මෙම වාහන පරීක්ෂා කර බැලීමට පුළුවන.

ජේ. ආර්. ඇස්. බැස්තියන්පිල්ලේ,
ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර මණ්ඩලීය සභාපතිතැන.

200, කිරුළ පාර,
කොළඹ 5.

8–198—65.8.6 දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය

---

## තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

### 1965/66 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ රටබීම තැබෑරුම් රේන්ද විකිණීම

1964.6.26 වැනි දින අංක 14,080, දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රටබීම තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත් එවකට බලපවත්වන සෑම සුරාබද්ද බලපත්‍රවලට ම අදාල කොන්දේසිවලටත් යටත්ව 1965.10.1 වැනි දින සිට 1966.9.30 වැනි දින දක්වා කාලය තුළ මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති විසින් අනුමත කරනු ලබන ප්‍රාදේශවල සුදුසු ස්ථාන ගණන් 3 (දේශීය නිෂ්පාදිත ධාන්‍ය මද්‍යසාර ද ඇතුළුව) රටබීම ඒ සඳහන් ලත් බලපත්‍රයක් යටතේ විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. සෑම ටෙන්ඩරයක් ම ඉහත සඳහන් රටබීම තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි යටතේ අනුමත වූ පෝරමයකම විය යුතු ය. මෙම ටෙන්ඩර් පෝරම දිවයිනේ කුමන කච්චේරියකින් වුවද ලබා ගත හැකිය. ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රුපියල් පන්සියයක් ලබාගත් බවට කච්චේරියකින් නිකුත් කරන කුවිතාන්සියක් සෑම ටෙන්ඩරයකටම අමුණා එවිය යුතුයි.

3. සෑම ටෙන්ඩරයක් ම ඉදිරිපත් කළ යුත්තේ ටෙන්ඩර් කරු විසින් හෝ ඔහුගේ නමින් ම පමණකි. නියෝජිතයෙකුගේ මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් හෝ ලාංකිකයෙක් නොවන්නකු විසින් හෝ 1964.6.26 වැනි දින අංක 14,080 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ වී ඇති රටබීම තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ 6 වැනි කොන්දේසිය යටතේ වෙනත් අන්දමකට නුසුදුසුකම් ඇති අය විසින් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

4. එක් තැබෑරුමක් සඳහා එක් අයෙකු විසින් එක් ටෙන්ඩරයක් පමණක් ඉදිරිපත් කළ යුතුයි. සමූහ වශයෙන් ටෙන්ඩර් ඉදිරිපත් කරන විට එක් තැබෑරුමක් සඳහා කොටස් කරුවන් ගණන පස් දෙනෙකුට වැඩි නොවිය යුතුයි.

5. සෑම ටෙන්ඩරයක් ම මුද්‍රා තබන ලද කවරයක බහා, එහි වම් පස ඉහළ කෙළවරේ ටෙන්ඩර් කැඳවීමේ දැන්වීමේ සඳහන් වී ඇති පරිදි තැබෑරුමේ අංකයත් නමත් පැහැදිලිව ලිවිය යුතුය.

6. වරප්‍රසාදය මිලයට ගත් බව ප්‍රකාශ කළ විට, ගැනුම්කරු විසින් එදින ම සවස 4 ට පෙර රේන්ද විකිණීමේ කොන්දේසිවලට අත්සන් තබා මහනුවර දිසාපති විසින් නියම කරනු ලබන මුදලක් ඇප වශයෙන් තැන්පත් කිරීමට සූදනම් විය යුතුයි. එම ගෙවීම, මුදලින් ම හෝ බැංකුවක් විසින් '' ගෙවීම සඳහා '' යැයි ලකුණු කරන ලද චැක් පතකින් හෝ '' ආරක්ෂක චැක් '' නමින් ලංකා බැංකුවෙන් නිකුත් කරන ලද චැක් පතකින් හෝ බැංකුවක් විසින්ම බැංකුවේ ම නමට ලියන ලද චැක් පතකින් කළ යුතුයි.

7. යම් ටෙන්ඩර් කරුවෙක් තමා විසින් වරප්‍රසාදය මිල දී ගත් බව ප්‍රකාශ කළාට පසු රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීමට හෝ නියම කරනු ලබන තැන්පත් මුදල ගෙවීම ප්‍රතික්ෂෙප කරන්නේ නම් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වේ. තවද, සෑම සුරාබදු බලපත්‍ර විධිවිධාන පැහැර හරින්නන්ගේ ලේඛනයට ඔහුගේ නම ද ඇතුළත් කරනු ලැබේ. මෙම කොන්දේසියට යටත්ව ජයග්‍රාහී ටෙන්ඩර්කරු විසින් ඉහත සඳහන් රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කර ඇප මුදල් තැන්පත් කළාට පසු සියළුම ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල් ආපසු ගෙවනු ලැබේ.

8. කිසිම හේතුවක් නොදක්වා එක් ටෙන්ඩරයක් හෝ, ටෙන්ඩර් කීපයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ නිෂ්ප්‍රභ කිරීමේ බලය මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති වෙත පැවරී තිබේ.

9. 1965 සැප්තැම්බර් මස 7 වැනි දින පහත සඳහන් උප ලේඛනයේ එක් එක් තැබෑරුම වෙනුවෙන් දක්වා ඇති වේලාව තෙක් පමණක් ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. එකී වේලාවට ටෙන්ඩර් කරුවන් පුද්ගලිකව මහනුවර කච්චේරියේදී පෙනී සිටිය යුතුයි.

10. තව දුරටත් මේ සඳහා අවශ්‍ය විස්තර මහනුවර කච්චේරියෙන් ලබා ගත හැකිය.

ඩබ්ලියු. ජේ. ප්‍රනාන්දු,
මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති.

1965 ජූලි 29 වැනි දින,
මහනුවර දිසාපති කාර්යාලයේ දීය.

### 1965/66 වර්ෂය සඳහා මහනුවර දිස්ත්‍රික්කයේ අනුමත වූ රටබීම තැබෑරුම් ලැයිස්තුව

| අනුක්‍රමික අංකය | කොට්ඨාශය | තැබෑරුම පිහිට විය යුතු ප්‍රදේශය | තැබෑරුම් විවෘත කළ යුතු වේලාව පෙරවරු | තැබෑරුම් වැසිය යුතු වේලාව පස්වරු | ටෙන්ඩර් භාරගැනීම අවසන් වන වේලාව |
|---|---|---|---|---|---|
| 1 ... | මහනුවර නාගරිකයේ අංක 16 යටිනුවර සහ අංක 17 කොටුගොඩැල්ල ජන්ද කොට්ඨාශ තුළ | මහනුවර නාගරිකයේ අංක 16—යටිනුවර සහ අංක 17—කොටුගොඩැල්ල ජන්ද කොට්ඨාශ තුළ. කොළඹ වීදිය සහ කැසල් හිල් වීදියයේ මංසන්ධියටත්, කොළඹ වීදියේ සහ කොළඹ පාරේ මංසන්ධියටත් අතර, කොළඹ වීදියේ දෙපාර්ශ්වය ම | 8.00 | ... 7.30 | ... පෙරවරු 9.30 |
| 2 ... | මහනුවර නාගරිකයේ අංක 18 වේවැල්පිටිය ජන්ද කොට්ඨාශය තුළ | මහනුවර නාගරිකයේ අංක 18 වේවැල්පිටිය ජන්ද කොට්ඨාශය තුළ, ත්‍රිකුණාමලය වීදියේ ගෝර්ඩන් ආයර් පාරෙත් මංසන්ධියටත්, ත්‍රිකුණාමලය වීදියේත් හරස් වීදියේත් මංසන්ධියටත් අතර ත්‍රිකුණාමලය වීදියේ දෙපාර්ශ්වය ම සහ කන්දෙ වීදියේ සහ කැසල්හිල් වීදියේ මංසන්ධියටත් කන්ද වීදියේ සහ ත්‍රිකුණාමල වීදියේ මංසන්ධියටත් අතර කන්ද වීදියේ දෙපාර්ශ්වය ම. | 8.00 | ... 7.30 | ... පෙරුවර 10.00 |
| 3 ... | පාතහේවාහැට | පට්ටියගම උඩගම ග්‍රාමය තුළ | 8.00 | ... 7.30 | ... පෙරවරු 10.30 |
| 4 ... | පුස්සැල්ලාව සුළු නගර සභාව | පුස්සැල්ලාව නගරය තුළ | 8.00 | ... 7.00 | ... පෙරවරු 11.00 |
| 5 ... | අඹගමුව කෝරළේ | නෝර්වුඩ් නගරය තුළ | 8.00 | ... 5.30 | ... පෙරවරු 11.30 |
| 6 ... | හැටන්-දික්ඔය නගර සභාවේ අංක 6 ජන්ද කොට්ඨාශය තුළ | හැටන්-දික්ඔය නගර සභාවේ අංක 6 දරණ ජන්ද කොට්ඨාශය ඇතුළත | 8.00 | ... 7.30 | ... දවල් 12.00 |
| 7 ... | හැටන් දික්ඔය නගර සභාවේ අංක 7 ජන්ද කොට්ඨාශය තුළ | හැටන්-දික්ඔය නගර සභාවේ අංක 7 දරණ ජන්ද කොට්ඨාශය ඇතුළත | 8.00 | ... 7.30 | ... පස්වරු 12.30 |

**සංලක්ෂ්‍යය.**—1965/66 කාල පරිච්ඡෙදය සඳහා තැබෑරුම් දනට පිහිටා ඇති ස්ථානයන් ම ලබා ගත හැකි වේයැයි පොරොන්දු නොවන අතර, තැබෑරුම් පිහිටුවන ස්ථානයන් සඳහා ආණ්ඩුවේ ඒජන්තතුමාගේ අනුමැතිය කලින් ලැබිය යුතුයි.

8–128—65.8.6 දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය.

---

## 1965–66 වර්ෂය තුළදී නුවරඑළිය දිස්ත්‍රික්කයේ රාතැබෑරුම් නැවත විකිණීම

1965 ඔක්තෝබර් මස 1 වැනි දින සිට 1966 සැප්තැම්බර් මස 30 වැනි දින දක්වා නුවරඑළිය දිස්ත්‍රික්කයෙහි පිහිටි පහත සඳහන් තැබෑරුම්වල සිල්ලරට පැසුනු රා විකිණීමෙ සම්පූර්ණ බලතලය මිලදී ගැනීම සඳහා 1965.6.18 වැනි දින අංක 14,427 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි මා විසින් පළ කරන ලද නුවරඑළියේ රා තැබෑරුම් නැවත විකිණීමෙ දන්වීමෙහි සඳහන් නීති රීතිවලට අනුකූලව ටෙන්ඩර්පත් මෙයින් කැඳවනු ලැබේ.

එක් එක් තැබෑරුම් කෙළින් දක්වා ඇති වේලාවන් හි දී 1965 අගෝස්තු මස 21 වැනි සෙනසුරාද ටෙන්ඩර් පත් භාර ගැනීම අත්හිටවනු ඇත.

අයි. ඕ. කේ. ජී. ප්‍රනාන්දු,
නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිසාපති.

1965 ජූලි මස 31 වැනි දින,
නුවරඑළිය දිසාපති කායර්‍යාලයේ දී ය.

### නුවරඑළිය දිස්ත්‍රික්කයේ අනුමත රා තැබෑරුම් ලැයිස්තුව 1965–66

| තැබෑරුම් අංකය | කොට්ඨාශය | තැබෑරුම පිහිටිය යුතු ප්‍රාදේශීය කොටස | ටෙන්ඩර් පත් පියවන වේලාව |
|---|---|---|---|
| 2 ... | කොත්මලේ ... | ඕතලාව ගම් ප්‍රදේශය තුළ ... | පෙරවරු 10.00 |
| 5 ... | උඩහේවාහැට ... | පදියපැලැල්ල ගම් ප්‍රදේශය තුළ ... | පෙරවරු 11.00 |

8–115—65.8.6 දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය.

## පුත්තලම් පාලන දිස්ත්‍රික්කයේ 1965–66 වර්ෂයේ විදේශීය මත්පැන් රේන්ද වෙන්දේසියේ විකිණීමයි

අංක 14,080 හා 1964.6.26 වෙනි දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද විදේශීය මත්පැන් රේන්ද වෙන්දේසියේ විකිණීමට අදල කොන්දේසි සහ මෙම කාල සීමාව තුළදී සාමාන්‍යයෙන් සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන සාමාන්‍ය කොන්දේසින්ටද යටත්ව 1965 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1966 සැප්තැම්බර් මස 30 වෙනි දින දක්වා වූ කාල සීමාව තුළදී පහත සඳහන් එක් එක් ස්ථානවලදී තැබෑරුම් බලපත්‍රයක් යටතේ (ධාන්‍ය මත්පැන් ඇතුළු වූ) විදේශීය මත්පැන් විකිණීමේ වරප්‍රසාදය මිළ දී ගැනීම සඳහා පුත්තලම් දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් 1965.8.27 වෙනි දින පුත්තලම දිසාපති කාර්යාලයේදී ටෙන්ඩර් පත්‍රිකා භාරගනු ලැබේ.

2. බලපත්‍ර ලත් ස්ථානයන් විවෘත කර තැබීමට ඉඩ දෙනු ලබන්නේ පෙරවරු 8.00 සිට පස්වරු 9.00 දක්වා වූ කාල සීමාව තුළ පමණි.

3. එක තැබෑරුමක් වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන එක ටෙන්ඩර් පත්‍රිකාවක් සමග රු. 500 ක් තැන්පත් කළ බවට නිකුත් කරන ලද කච්චේරි කුවිතාන්සියක් ද ඉදිරිපත් කළ යුතුය.

4. ටෙන්ඩර් පත්‍රිකා එවිය යුත්තේ පුත්තලම් දිස්ත්‍රික්කයේ දිසාපති තැන වෙතටය. ටෙන්ඩර් පත්‍රය බහාලනු ලබන කවරයේ වම් කෙළවර මුදුනේ " 1965–66 අංක......... දරණ විදේශීය මත්පැන් තැබෑරුම සඳහා ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍රය "යයි සඳහන් කළ යුතුයි.

5. එක තැබෑරුමක් වෙනුවෙන් එක ටෙන්ඩර් පත්‍රයකට වඩා ඉදිරිපත් කිරීමට කිසිවෙකුට ඉඩ දෙනු නොලැබේ. රේන්ද වෙන්දේසියේ කොන්දේසි වලට පටහැනිව හෝ විධිමත් ලෙස පිළියෙළ නොකරන ලද හෝ ටෙන්ඩර් පත්‍රිකා ගැන සලකා බලනු නොලැබේ.

6. කිසියම් හේතුවක් නොදක්වා කිසියම් ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම හෝ ප්‍රතික්ෂෙප කිරීමේ අයිතිවාසිකම පුත්තලම දිස්ත්‍රික්කයේ දිසාපති තැන වෙත පවරා ගෙන ඇත.

7. රේන්දය ලබාගත් තැනැත්තා එම වරප්‍රසාදය ලබාගත් විගසම් වෙන්දේසියේ කොන්දේසිවලට අත්සන් තබා දිසාපති තැන විසින් නියම කරන ලද මුදලක් ඇපයක් වශයෙන් තැන්පත් කළ යුතුය. තව ද, ඔහු යටකී වරප්‍රසාදය හිමි කර ගෙන දින 14 ක් තුළ දී රේන්දය මිළ දී ගත් සම්පූර්ණ මුදල වෙනුවෙන් දිසාපති තැන සමග පොරොන්දු පත්‍රයකට අත්සන් කොට එම පොරොන්දු පත්‍රය මගින් ඔහු විසින් බඳින ලද ඇප මුදල දිසාපති තැනට උකස් කළ යුතුය.

8. ටෙන්ඩර් පත්‍රයක් ඉදිරිපත් කරන තැනැත්තාම පෙනී නොසිටිය හොත් එම ටෙන්ඩර් පත්‍රය භාරගනු නොලැබේ.

9. වැඩි විස්තර පුත්තලම් දිසාපති කාර්යාලයෙන් ලබා ගත හැක.

ටී. ඒ. ඇල්. ලුඩොවයික්,
පුත්තලම දිස්ත්‍රික්කයේ දිසාපති තැන

1965 ජූලි 29 වෙනි දින,
පුත්තලම් දිසාපති කාර්යාලයේ දී ය.

අනුමත කරන ලද තැබෑරුම් ලැයිස්තුව

| අනු අංකය | කොට්ඨාශය | තැබෑරුම පිහිටවිය යුතු ස්ථානය | තැබෑරුම විවෘතකරන වේලාව | තැබෑරුම වසන වේලාව | ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව |
|---|---|---|---|---|---|
| 1 ... | හලාවත පලාත් ආණ්ඩු සභාවේ අංක 2 දරණ කොට්ඨාශය පිටිපන | හලාවත පලාත් ආණ්ඩු සභාවේ අංක 2 දරණ කොට්ඨාශය පිටිපන | පෙ.ව. 8.00 ... | ප.ව. 9.00 ... | පෙ.ව. 11.00 |
| 2 ... | හලාවත පලාත් ආණ්ඩු සභාවේ අංක 6 දරණ කොට්ඨාශය කඩ වීදිය | හලාවත පලාත් ආණ්ඩු සභාවේ අංක 6 දරණ කොට්ඨාශය කඩවීදිය | පෙ.ව. 8.00 ... | ප.ව. 9.00 ... | පෙ.ව. 11.30 |

8–123—65.8.6 දින අංක 14,472 දරණ ගැසට් පත්‍රය.

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඬ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙලින්ම යැවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

**දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණු ලබන ගාස්තු**

# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

(සෑම සිකුරාදා දිනයන්හි පළ කරණු ලැබේ)

1. සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරණු ලබන්නේ ප්‍රසිඩ කරන්නාගේ වගකීම පිට ය.

2. පෞද්ගලික පළ කරන්නන්ගේ සියළුම දැන්වීම් සහ ප්‍රකාශන, ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ රජයේ මුද්‍රණාලයාධිපති තැනට තැපැලෙන් එවීමට හෝ ගෙනැවිත් භාර දීමට හෝ පුළුවන.

3. සතියේ දවස්වල පෙරවරු 9 සිට පස්වරු 4.30 දක්වා ද සෙනසුරාදා දවස්වල පෙරවරු 9 සිට පස්වරු 1 දක්වාද කාර්යාලයේ කටයුතු කරණ කාලය බව සැලකිය යුතුය.

4. සතියේ දවස්වල පස්වරු 3.30ට සහ සෙනසුරාදා දවල් 12ට මුදල් ගණුදෙනු කාලය අවසන් වේ.

5. සියළුම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. තැපැලෙන් දැන්වීම් සහ ප්‍රකාශනයන් එවන විට, ඒ සමගම අයවිය යුතු ගාස්තුව සඳහා මනි ඕඩරයක්, පෝස්ටල් ඕඩරයක් හෝ චෙක් පතක් රජයේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුයි.

6. ප්‍රමාදය සහ දෙස් වලක්වා ගැනීම සඳහා, පළ කරන්ට නියමිත "පිටපත" කඩදාසියේ එක් පැත්තක පැහැදිලිව ලියා එවිය යුතුයි. ටයිප් ගසා එවනවා නම් වඩාත් හොඳයි.

7. සෑම අත්සනකටම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතුයි.

8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරණ දැන්වීම් හෝ පළ කරණු නොලැබේ.

9. උසාවියේ අණ පණත් යටතේ නිකුත් කළායයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ පෙරකදෝරු මහතකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිඩ කරණු නො ලැබේ.

10. 1962 ජූලි මස 16 වෙනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අයකරණ ගාස්තු මෙසේයි :—

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... | 10 | 0 |
| වැඩිවන සෑම අඟලට හෝ ඉන් කොටසකට ... ... | 10 | 0 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... | 110 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... | 220 | 0 |

අඟලේ සෑම කොටසකටම සම්පූර්ණ අඟලකට අය කරණු ලබන ගාස්තුව අය කරණු ලැබේ.

11. සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිඩ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනයී වෙනස් වීමට ඉඩ තිබේ.

12. ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින හතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

13. 63.8.1 දින සිට සංශෝධිත දායක ගාස්තු :—

**ආණ්ඩුවේ ගැසට් පත්‍රය—වාර්ෂික**

| | මෙරට රු. ශ. | පිටරට රු. ශ. |
|---|---|---|
| එක් කොටසක් ... ... ... | 27 50 | 40 50 |
| I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 17 50 | 23 0 |
| I වැනි කොටසේ ඡේද දෙකක් ... ... | 25 0 | 33 0 |

වර්ෂය අවසානයේ හෝ අර්ධ වර්ෂයක අවසානයේ නිම වන සේ දායක ගාස්තු භාර ගනුයේ 6 මාසයකට නො අඩු කාලයකට පමණය.

තනි පිටපත් සඳහා ගාස්තු—(පිටපත් විකිණීමට තිබේ නම්)

| | මිළ රු. ශ. | තැපැල් ගාස්තු මෙරට රු. ශ. |
|---|---|---|
| (අ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී එක කොටසක් .. ... ... | 0 30 | 0 20 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, එක කොටසක් ... ... ... | 0 60 | 0 20 |
| (ආ) i. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියක් ඇතුළත දී, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 15 | 0 15 |
| ii. ගැසට් පත්‍රයේ සඳහන් දිනයෙන් සතියකට පසු, I වැනි කොටසේ එක ඡේදයක් ... ... | 0 30 | 0 15 |

**දායක මුදල් භාරගැනීම සහ තනි පිටපතක් විකිණීම භාර, කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත මුදල් ලැබෙන්නට සලස්වන්න.**

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි